

www.gemcitymagazine.com
APRIL / JULY 2025
GEMCITY
MAGAZINE
BUSINESS
HISTORY
HERITAGE
SCIENCE
TRAVELING
CULTURE
ENVIRONMENT
ART
ENTERTAINMENT
Heal Smarter, Not Harder: Unlock the Magic of Physiotherapy
Sri Lanka: The Crown Jewel of Asia
NO. 02
Sri Lanka Gems and Miners Association Honorable Chairman
Mr. W.P. Waliwaththa
WALIWATHTHA GEMS
Exclusive Articles
මැණික් ව්‍යාපාරය පිළිබඳව රජයට ලොකු වගකීමක් තියෙනවා.
ව්‍යාපාරික සාර්ථකත්වය සඳහා මග පෙන්වීම
Z ලකුණ ගැන ඔබ නොදත් දේ

GEMCITY
MAGAZINE


අපගේ වෙබ්අඩවිය ඔස්සේ සඟරාව මිලදී ගෙන ඔබේ නිවසටම
ගෙන්වා ගැනමේ හැකියාව ඇත.

**www.gemcitymagazine.com**

**0740 67 67 84**


SMARTLock.lk
Simplifying locking & unloking
SMARTLOCKS
KEYLESS ENTRY
10% OFF
NEW
10% OFF
HOT DEAL
HOT DEAL
KAADAS
Kaadas K9
KAADAS
Kaadas S110
Smartlock
SML-SFN3i
Smartlock
SML-SF21
Smartlock
SML-K2
10% OFF
NEW
GATE
CABINET LOCK
ALUMINIUM DOOR
Smartlock
SML-FNC26
Smartlock
SML-SFCL
Smartlock
SML-GATE-TU
Smartlock
SML-CBF020H
Smartlock
SML-LFNC18
Super Unique International (Pvt) Ltd.
No: 509. Colombo Road, Kurana,
Negombo. Sri Lanka
+94 31 222 81 50
FREE INSTALLATION
only for a special promotion
+94 71 85 44 133 | +94 777 444 844
www.smartlock.lk

# මැණික් කර්මාන්තයේ අභිවෘද්ධිය ගැන හිතන්න මේ හොඳම කාලයයි..

**ශ්‍රී ලාංකීය මැණික් කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා අදහස් දක්වමින් අප හා සම්බන්ධ වුණු ප්‍රවීන ව්‍යාපාරික ශ්‍රී ලංකා මැණික් ව්‍යාපාරිකයන්ගේ හා පතල් කරුවන්ගේ සංගමයේ ගරු සභාපති ඩබ්.පී. වැලිවත්ත මහතා.**

## "රජයට ලොකු වගකීමක් තියෙනවා"

**ඔබතුමා මැණික් ක්ෂේත්‍රයට අවතීර්ණ වුණේ කොහොමද?**

ඒකට ප්‍රධාන කරුණු තුනක් බලපෑවා.

- රත්නපුර ප්‍රදේශය

අද වගේම එදත් රත්නපුර දිස්ත්‍රික්කයෙන් හමුවුණ නිල් මැණික් විශේෂයට මුළු ලෝකයේම ලොකු පිළිගැනීමක්, ප්‍රසිද්ධියක් හිමිවෙලා තිබුණා. ඒ සඳහා තිබෙන හොඳම උදාහරණය තමයි, එංගලන්තයේ මහරැජිණ පැළඳ සිටි මුදුවේ ඇතුළත් වන නිල් මැණික. එය අපේ ප්‍රදේශයෙන් (ගල්පොත්ත) හමුවුණු ඉතා වටිනා නිල් මැණිකක්.

- ළමා කාලයේ අත්දැකීම්

මගේ පාසල වුණේ ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය. ඒ වගේම තමයි මම පාසලට යන්නෙ එන්නේ පැල්මඩුල්ල නගරය හරහා. ඒ සෑම මොහොතකම වගේ මට මැණික් ක්ෂේත්‍රයේ නියැලෙන ව්‍යාපාරිකයන් දැකගන්න ලැබුණා. ඒ වගේම තමයි මගේ පාසලේ, මගේ පංතියේ මුස්ලිම් සහෝදරයන් තුන්දෙනෙක් හිටියා. ඒ අය පාසල් ඇරිලා ගිහින් හවස් වරුවේ කළේ මැණික් කපන එක. මම නිතර ඒ දේවල් දැක්කා. මේ ක්ෂේත්‍රය පිළිබඳ මගේ හිතේ කැමැත්තක් සහ උනන්දුවක් ඇති වන්නට ඒ දේවල් ලොකු හේතුවක් වුණා.

- පාරම්පරිකවම පවුලේ ජීවනෝපාය වීම.

මගේ තාත්තා ආයුර්වේද වෛද්‍යවරයෙක්. නමුත් ඔහුට පරම්පරා උරුමයෙන් ලැබුණු මැණික් පතල් ඉඩකඩම් තිබුණා. මොකද අපේ පරම්පරාව ඒ අයගේ ජීවනෝපාය එහෙමත් නැත්නම් රැකියාව කරගෙන තිබුණේ මැණික් ව්‍යාපාරය. ඇත්තටම මට මේ ක්ෂේත්‍රයට අවතීර්ණ වෙන්න ඒක ලොකු හේතුවත් වුණා.

ඒ වගේම විශේෂයෙන් ම මතක් කරන්න ඕනි, මම පාසල් අධ්‍යාපනය ලබන කාලේ කැඩෙට්න් වල නියැලිලා හිටියා. ඉතින් මාස ගණන් දියතලාව කෑම්ප් එකේ පුහුණුවීම් සඳහා සහභාගී වුණා. ඒ නිසාම පාසලෙන් සමුගන්නකල්ම අදහස් කරගෙන හිටියේ ත්‍රිවිධ හමුදාවට සම්බන්ධ වෙන්න. නමුත් අද මට හිතෙනවා, මම මේ ක්ෂේත්‍රය තෝරගත්තේ දෛවයට වගේම මගේ වාසනාවට කියලා.



**ශ්‍රී ලංකාවේ මැණික් ක්ෂේත්‍රයේ වර්තමාන තත්ත්වය පිළිබඳ ඔබේ අදහස?**

අද පවතින තත්ත්වය මත මැණික් කර්මාන්තය තුළ යහපත් අනාගතයක් පිළිබඳව බලාපොරොත්තු තබාගන්න එක ඇත්තටම අපහසුයි කියන එක තමයි මගේ අදහස. ඒකට හේතු කිහිපයක් ම බලපානවා.

මෙම ක්ෂේත්‍රය පදනම් කරගෙන ආදායම් ඉහළනන්වා ගැනීමේ අදහසින් මේ වන විටත් රජය විවිධ අත්හදා බැලීම් වල නිරත වී සිටිනවා.

ශ්‍රී ලංකාව හැරුණුකොට මැණික් සම්පත පවතින ලෝකයේ තවත් රටවල් 40ක් පමණ තිබෙන බව කියැවෙනවා. අදත් ඒ රටවල් වලින් ශ්‍රී ලංකාවට මැණික් ආනයනය කරනවා. ඒ අතුරින් අප්‍රිකානු රටවල් ආශ්‍රිත මැඩගස්කරය, ටැන්සානියාව සහ මොසැම්බික් වගේ රටවල් වලට විශේෂ තැනක් හිමිවෙනවා. පසුගිය කාලයන් තුළ මෙරටට ආනයනය වුණ මැණික් සඳහා පනවා තිබූ බදු මුදල ඉතා අවමයි. ඒ නිසාම දැනට වසර පහකට පමණ පෙර ශ්‍රී ලංකාවට විශාල මැණික් තොගයක් ගෙන්වා තිබෙනවා. ඒ හේතුව නිසා ශ්‍රී ලංකාව තුළ මැණික් කපා ඔප දමන ආයතන වැඩි වශයෙන් බිහිවුණා. ඒ වගේම තමයි වර්තමානය වනවිට ඒ බදු මුදල ඉතා ඉහළ මට්ටමක පවතිනවා. එහි ප්‍රතිඵලයක් ලෙස අදටත් විවිධ රටවලින් ශ්‍රී ලංකාවට ලැබෙන්න තියෙන මැණික් වලින් 75% ක පමණ ප්‍රමාණයක් තායිලන්තය වගේ රට වලට ආනයනය වෙමින් තිබෙනවා. එවැනි තත්ත්වයක් මත ඒ බදු මුදල නැවත අඩු කිරීමක් කළත් මැණික් ව්‍යාපාරය තුළ එදා ලංකාවට ලැබුණු පිළිගැනීම නැවත ලබාගැනීමේ අපහසුතාවයක් ඇත්තෙන් ම තියෙනවා. ඒ නිසාම අනිවාර්යයෙන් මතක් කළ යුතුමයි, ඒ වෙනුවෙන් රජයට ලොකු වගකීමක් තියෙනවා. පළමුවෙන්ම පසුගිය කාල වලදී මෙරටට ආනයනය වුණු මැණික් සඳහා පනවා තිබූ බදු මුදල් පිළිබඳව රජය විසින් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම ඉතාමත්ම වැදගත්. ඒ වගේම පසුගිය කාල වලදී පනවා තිබූ බදු මුදලට අනුව නැවතත් මැණික් ආනයනය කිරීමට උත්සාහයක් කරන්න කියලා රජයෙන් ඉල්ලීමක් කරනවා. එසේ නොවුණහොත් මේ ක්ෂේත්‍රයට සහ මෙහි පැවැත්මට විශාල හානියක් සිදුවන බවත් මතක් කරන්න ඕනි.

මේ වනවිට මෙරට බොහෝ තරුණ පිරිස් රසායනාගාර (Laboratory) සඳහා යොමු වෙමින් තිබෙනවා. ඒ සඳහා ඔවුනට අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව ලබා දීමට රජය විසින් කටයුතු කෙරුණද මෙරටට ආනයනය වන මැණික් ප්‍රමාණය අඩුවීම ඒ සියල්ලෙහිම අසාර්ථකත්වයට හේතු වෙන බවයි මගේ අදහස. ඒ නිසා ඒ තත්ත්වය අනිවාර්යයෙන් ම මගහරවා ගතයුතුමයි.

**ශ්‍රී ලාංකීය මැණික් ව්‍යාපාරයේ පවතින තරඟකාරීත්වය පිළිබඳ ඔබේ අදහස?**

ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම මැණික් ව්‍යාපාරය තුළ පවතින තරඟකාරීත්වය වැඩිවෙමින් තිබෙනවා. මේ වනවිට ලෝකයේ ඉල්ලුමට අනුව මැණික් සැපයීමේ අපහසුතාවයක් ලංකාවට මතුවෙලා තියෙනවා. නීත්‍යානුකූලව මැණික් කර්මාන්තය ඉදිරියට පවත්වාගෙන යාමට ඇති බාධක ඊට ප්‍රධාන හේතුවක් වන අතර ඒ සඳහා අවශ්‍ය බලපත්‍ර ලබාගැනීමේ දී පවා මේ වනවිට දැඩි නීතිමාලාවක් පනවා තිබෙනවා. එම බලපත්‍රය ලබාගැනීම සඳහා ගොවිජනසේවා අනුමැතිය ද අත්‍යවශ්‍ය වී ඇති නමුත් ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොදීමට රාජ්‍ය නිලධාරීන් වැඩි නැඹුරුතාවයක් දැක්වීම කණගාටුදායක කරුණක්. ඒවගේම මැණික් ව්‍යාපාරයේ පවතින තරඟකාරීත්වයට තවත් හේතු කිහිපයක්ම බලපානවා.

- වැඩි වශයෙන් මැණික් ලැබුණු ඉඩම්වල (දැනට වසර සියගණනක සිට) ඉල්ලම් ප්‍රමාණය අඩු වී තිබෙනවා.
- මෙම ක්ෂේත්‍රයට පතල් හවුල්කරුවන්ගේ (කම්කරුවන්) දායකත්වය අඩු වෙමින් තිබෙනවා.

වර්තමාන තරුණ පරපුර පස්කැපීම වැනි වෙහෙස මහන්සි වී කළයුතු කාර්යයන්හි නියැලීමට ඇති අකමැත්ත සහ ශ්‍රම ශක්තිය පිරිහීම මේ වනවිට විශාල ගැටලුවක් වී තිබෙනවා. ඒකට ප්‍රධාන වශයෙන් බලාපාන හේතුවක් තමයි ඔවුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටීම. ඒ නිසාවෙන් මැණික් කර්මාන්තයට සිදුවෙමින් පවතින අවාසිදායක තත්ත්වය මගහරවා ගන්නට නම් නවීන තාක්ෂණය සහ යන්ත්‍රෝපකරණ භාවිත කිරීමට අවශ්‍ය රජයේ අනුග්‍රහය කඩිනමින් ලබා දියයුතු බව සිහිපත් කරන්නට කැමතියි.

**මෙම ක්ෂේත්‍රයේ දියුණුවට බලපාන පාරිසරික වෙනස්වීම් සඳහා රජය සහ පෞද්ගලික අංශයන්හි දායකත්වය කෙතෙක් දුරට අත්‍යාවශ්‍ය ද?**

යන්ත්‍රසූත්‍ර භාවිතය තුළින් ඇත්තෙන්ම පාරිසරික හානියක් සිදුවෙනවා සහ ඒ පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුව තිබෙනවා. ඒක කවුරුත් පිළිගත යුතු දෙයක්. මේ වන විට සංගමයක් වශයෙන් අපි ඒ සඳහා මැණික් අධිකාරියත් සමඟ සාකච්ඡා කරලා පියවරවල් කිහිපයක් අරගෙන තියෙනවා සහ ඒවා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මැණික් ඉල්ලම් ලබාගෙන අවසන් වූ ඉඩම්වල පැළ සිටුවීමේ ව්‍යාපෘතියක් අපේ සංගමය විසින් ආරම්භ කරලා තියෙනවා. ඒ අනුව දැනට කිරිඇල්ල, පැල්මඩුල්ල සහ රත්නපුර ඉඩම් කිහිපයකම පරිසරයට හිතකර ශාක වගාකර තියෙනවා. ඉදිරියේ දී ඒ කටයුතු අනිවාර්යයෙන්ම වැඩිවිය යුතුයි කියන එක තමයි සංගමයක් විදියට අපේ අදහස. අපි ඒ පිළිබඳව වගකිවයුත්තන් දැනුවත් කරන්න නිරන්තරයෙන් උත්සාහ කරනවා. ඒ කෙරෙහි රජයෙහි වැඩි අවධානයක් යොමු වන්නේ නම් අපගේ උත්සාහය තව දුරටත් සාර්ථක වෙනවා කියන එක අපට විශ්වාසයි.

**මැණික් වෙළඳාම තුළ කෙරෙන ගණුදෙනුවල දී පවතින අඩුපාඩු සහ අභියෝග මොනවා ද?**

මේ වනවිටත් අපට ඒ සම්බන්ධව ගොඩක් අභියෝග තියෙනවා. ශ්‍රී ලංකාවේ මැණික් ව්‍යාපාරිකයන් බොහෝවිට පුරුදුවෙලා ඉන්නේ මෙරට ව්‍යාපාරිකයන් සමඟම ගණුදෙනු කරන්න. ඒ අය අතර 90% ක් ම පුරුදු වී සිටින්නේ මැණික් කපා ඔපදමා හෝ ස්වාභාවික (Rough) ලෙස මැණික් අලෙවි කිරීමටයි. නමුත් මේ තත්ත්වය වෙනස්විය යුතුමයි. ශ්‍රී ලාංකීය මැණික් ලෝකයට ගෙනයා යුතුයි. දැනට රජයෙන් හෝ මැණික් අධිකාරියෙන් ව්‍යවසායකයන් ඒ පිළිබඳව දැනුවත් කිරීම් යම්කිසි මට්ටමකින් කෙරෙන අතර එම කටයුතු තව දුරටත් පුළුල් කරන්නේ නම් වඩාත් ඵලදායීතාවයක් ලබාගත හැක. මේ වනවිට මෙරට මැණික් ව්‍යාපාරිකයන් අතර ඉහළින්ම සිටින කිහිපදෙනෙක් පමණක් ලෝකයට මැණික් රැගෙන යනවා. පසුගිය දිනවල ඇමරිකාවේ විශාල මැණික් ප්‍රදර්ශනයක් පැවැත්වුණා. නමුත් ඒ සඳහා මෙරටින් සහභාගී වූයේ ව්‍යාපාරිකයන් කිහිපදෙනෙක් පමණයි. දැනුවත් කිරීම අවමවීම ඊට බලපාන ප්‍රධාන හේතුවක් වෙනවා. ඉදිරියේ දී හෝ යම් දැනුවත් කිරීමක් හරහා ගණුදෙනු කිරීමේ දී රුපියලට වඩා ඩොලරයට විකිණීම වාසිසහගත යැයි ඔවුනට ඒත්තුගැන්විය යුතුයි.

**තාක්ෂණික ක්‍රම සහ උපාංග භාවිතයෙන් මැණික් නිශ්පාදනයේ ගුණාත්මක බව සහ අගය කෙතරම් දුරට වැඩි කළ හැකි ද?**

තාක්ෂණය අතින් අපි මේ වනවිට ඉන්නේ ඉතාම පහළ මට්ටමක. විවිධ සංචාර වලදී ලබන අත්දැකීම් මඟින් හොඳින්ම පෙනීයන කාරණාවක් තමයි, තායිලන්තය වැනි රටවල ඒ සඳහා භාවිත කරන තාක්ෂණය සහ දැනුම අපේ රටට තවම ලැබිලා නැහැ කියන එක. මෙම ක්ෂේත්‍රය හරහා රටට ලබාදිය හැකි උපරිම දායකත්වය සහ ඵලදායී බව ලබාදෙන්නට නම් නව තාක්ෂණික ක්‍රම සහ යන්ත්‍රෝපකරණ මෙරටට හඳුන්වාදිය යුතුමයි. ඒ පිළිබඳව සැලකිලිමත් වෙමින් පසුගිය දිනක තාප පිරියම් (Burning) කරන සහ මැණික් කපා ඔපදමන තාක්ෂණික ආයතනයක් හිදැල්ලන ප්‍රදේශයේ ආරම්භ කෙරු අතර එහි සභාපතිතුමන්ගේ විශේෂ අවධානය ඇතුව මේ වනවිටත් නව තාක්ෂණික උපකරණ කිහිපයක් මෙරටට ගෙන්වා තිබෙනවා. එවැනි සහයෝගයක් මේ ක්ෂේත්‍රයට ලැබීම ඇත්තෙන් ම බොහොම වටිනවා. එවන් උපකරණ භාවිතයෙන් තොරව මැණික් ගලකට නියම වටිනාකම ලබාදීම අපහසුයි. ඒ නිසාම ඒ පිළිබඳ වගකිවයුත්තන්ගේ අවධානය යොමු විය යුතුමයි.

**මෙම ක්ෂේත්‍රයේ පැවැත්මට පතල් හවුල්කරුවාගේ (කම්කරුවා) දායකත්වය කෙතෙක් දුරට වැදගත්ද?**

ඇත්තටම ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය ඉතාමත් විශේෂයි. මේ වනවිටත් මහපොළොවෙහි ඇති මැණික් සම්පතෙන් ගොඩගත් මැණික් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස සැලකුවහොත් 25% ක් පමණයි. තව 75% ක් ඉතිරිව තියෙනවා. ඒ මැණික් ලබා ගන්න නම් පතල් හවුල්කරුවන්ගේ ශ්‍රම දායකත්වය අත්‍යවශ්‍යයි. ඒ සඳහා මගේ යෝජනාව තමයි, සංගමයක් වශයෙන් සහ මැණික් ව්‍යාපාරිකයන් ලෙස අපි සියලුදෙනා එක්ව සාකච්ඡාකොට ඒ අයට ලබාදෙන ප්‍රතිලාභ වැඩි කිරීමට පියවර ගත යුතුයි කියන එක. සමහර විටෙක, සමහර පිරිස් මා සමඟ එකඟ නොවේවි. නමුත් පතල් හවුල්කරුවන් වෙනුවෙන් කිසියම් හෝ කලක වෘත්තීය සමිති වැනි කිසිවක් ආරම්භ කර නැහැ. ඒ නිසාම දැනට අපි සංගමයක් වශයෙන් ඒ අයගේ සහ විශේෂයෙන් ම ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතායන් පිළිබඳව සොයා බලනවා. ඒ අනුව දැනට වසර අටක පමණ කාලයක සිට එක් දරුවෙක්ට මසකට රු.5000/- බැගින් ලබා දෙන්නට අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ වගේම තමයි පසුගිය පෙබරවාරි මස විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ දරුවන් 200කට පමණ මසකට රු.5000/- බැගින් ලබා දෙන්නට කටයුතු කළා. ඔවුන්ගේ පහසුව වෙනුවෙන් අපි ඒ සඳහා ඔවුනට බැංකු කාඩ්පතක් ලබා දෙනවා. මේ කටයුත්ත ඉදිරියටත් නොනවත්වා පවත්වාගෙන යෑම සහ ඔවුන් වෙනුවෙන් තව තවත් සුභසාධන කටයුතු දියත් කරන්න අපි අදහස් කරගෙන ඉන්නවා. ඔවුන් ආපදාවන්ට ලක්වෙන අවස්ථාවන්හි සංගමයක් වශයෙන් අපි ඒ අයට විශේෂ මුදලක් ලබාදෙන්නට කටයුතු කරනවා. උදාහරණයක් ලෙස පතලක දී ජීවිත අහිමිවීමක් සිදු වුවහොත් එම පුද්ගලයාගේ පවුලේ සාමාජිකයන්ට විශේෂ මුදලක් ලබා දීමට දැනට වසර කිහිපයක සිට කටයුතු කරනවා. නමුත් මගේ අදහස, ඒ මුදල පවා ඉදිරියේ දී වැඩිකළ යුතුයි කියන එක.




ශ්‍රී ලංකා මැණික් ව්‍යාපාරිකයන්ගේ හා පතල් කරුවන්ගේ සංගමය
ගරු සභාපති

**ඩබ්.පී. වැලිවත්ත**

**ලෝක වෙළඳපලේ ඉල්ලුමට අනුව මෙරටින් මැණික් සැපයෙනවා ද?**

ඇත්තටම එය ඉතාමත් අවම ප්‍රමාණයක් කියන එක තමයි මගේ අදහස.

ලෝකයේ මැණික් සඳහා තිබෙන ඉල්ලුම පිළිබඳව දැනුවත් කිරීම් වගකිවයුතු බලධාරීන් විසින් තවදුරටත් වැඩි කළයුතුව තිබෙනවා. ලෝකයේ ඉල්ලුමට අනුව මැණික් සපයන්නන් අවම වීමේ හේතූන් නිසා ද මෙම කර්මාන්තය අතහැරී යන්නට තියෙන ඉඩකඩ ඉතා වැඩියි.

**අවසාන වශයෙන් ඔබේ අදහස?**


මම විශේෂ යෝජනාවක් කරන්න කැමතියි. මැණික් ගොඩගන්නවා වගේම සියලු දෙනා එක්ව පරිසරයද රැකගත යුතුයි කියන එක. එය සංගමයක් වශයෙන් අපිට පමණක් කළ හැකි දෙයක් නෙමෙයි. ඒ සඳහා විශේෂයෙන් ම රජයේ සහ මැණික් අධිකාරිය වැනි ආයතනයන්ගෙන් අවශ්‍ය අනුග්‍රහය, දැනුම සහ ප්‍රතිපාදන ලබා දීම තව දුරටත් වැඩිකළ යුතුයි. විශේෂයෙන් මැණික් අධිකාරිය විසින් ඒ සඳහා විශේෂ සොයා බැලීමක් කළ යුතුව තිබෙනවා. නැතිනම් එය හරහා විවිධ ලෙඩ රෝග පවා පැතිරයාමේ ඉඩකඩ තියෙනවා. එසේ වුවහොත් "රත්නදීපය" යැයි හඳුන්වන අපේ රත්නපුරයට වෙනත් නමක් පටබැඳෙන්නට ඉඩ තියෙනවා.





ගයත්‍රි කරුණාදාස






# බඳුන්ගත පළතුරු පැළයක් නිවැරදිව සිටවමු.

ඕනෑම නිවසක යම් කාලයක් තුළ පළතුරු පැළයක් සිටුවීම සාමාන්‍ය ක්‍රියාවලියකි. නමුත් එලෙස සිටුවන සියලුම පැළ එල දරන තත්ත්වයට පත්වෙනවාද යන්න යම් සැකයක් පවතී. පොලිතින් බඳුනක සිටුවා ඇති පැළයක් භූමියේ නිවැරදිව සිටවාගත නොහැකි වීම නිසාත් එලෙස එම පැළයට ඇතිවෙන ආතතිය හමුවේ සිටුවීමෙන් පසු අනවදානයට ලක්වන බොහෝමයක් පැළ මිය යන බවත් අපට දක්නට ලැබේ. එලෙස නොවී නිවැරදිව බඳුන්ගත පළතුරු පැළයක් සිටුවීම පිළිබඳව මෙයින් ඔබට දැනගැනීමට හැකිවනු ඇත.



බෝගය සිටුවන ස්ථානය තෝරාගෙන අඩි 2 x 2 x 2 ප්‍රමාණයේ වලක් කපා ගැනීම පැළය සිටුවීමට මසකට පමණ පෙර කළ යුතුයි. එහිදී මතුපිට පස් අඟල් 4 ක් පමණ ගැඹුරට වෙන්කර ගැනීම කළ යුතුයි. වල පිරවීමේ දී එම මතුපිට පස් සමඟ වෙනත් ස්ථානයකින් ලබා ගත් පතුපිට පස්ද ගෙන කොම්පෝස්ට් සමඟ 1 : 1 අනුපාතයට මිශ්‍රකර වල පුරවා ගන්න. මෙහි දී වල පිරවීම කන්දක් ලෙස ඉහළට පිරවිය යුතුය. (පොළොව මට්ටමට සමතලා නොකළ යුතුයි) මාසයක් ගතවීමේ දී එය පොළොව මට්ටමට පැමිණේ. සකස් කරගත් වල මැද පැළය සිටුවන පුද්ගලයාගේ දෑතට බඳුන අපහසුතාවයකින් තොරව වල තුළට දමා හැසිරවිය හැකි ලෙස බඳුන සම්පූර්ණයෙන්ම ගිල්විය හැකි ප්‍රමාණයට වලක් සකසා ගන්න. මේ වනවිට පළතුරු බඳුනේ පස් වියළිව තිබිය යුතුයි. හොඳින් කැපෙන පිහියක් ගෙන බඳුනේ අඩියෙන් පෙත්තක කොටසක් අඟල් ½ ක් පමණ කපා දැමිය යුතුයි.  බඳුනේ යට කොටසේ එතී පවතින මුල් වලින් කොටසක් ද මෙයින් කැපී ඉවත් වේ. එලෙස එතී පවතින මුල් පැවතීම ශාකයෙහි වර්ධනයට බාධා ඇති කරන බැවින් ඒවා ඉවත් වීම හිතකර වේ. බඳුන දෑතින්ම වලෙහි තැන්පත් කර පතුලේ සිට මතුපිට මත බ්ලේඩ් තලයකින් දික් අතට කැපුමක් යොදා පහසුවෙන් පොලිතීන් ආවරණය ඉවත් කළ හැකිය. පැළයට කෙළින් ඉහළින් සිටගනිමින් පොලිතීන් කවරය කැපුම ඔස්සේ ලෙහා කෙළින්ම ඉහළට ඇද ඉවත් කිරීම වඩාත් යෝග්‍ය වේ. වලට අඩුපස් දමා පුරවා බඳුනේ පැරණි පස් තද නොකර අතින් පිරවූ පස් ඇඟිලිතුඩු වලින් තද කළ යුතුයි. මෙලෙස පස් පිරවීමේ දී පොළොව මට්ටමට සමානව සැකසිය යුතු අතර ඊට ඉහළට නොදැමිය යුතුයි. එසේ දැමීමක් වුවහොත් බද්ධ සන්ධි පවා යටවීම මඟින් පැළයට හානි විය හැක. පොළොව මට්ටමින් පහළට සිටිනසේ පස් පිරවීමෙන් ද පැළයට හානි විය හැක. මෙලෙස නිවැරදිව බඳුන්ගත පළතුරු පැළයක් ක්ෂේත්‍රයේ සිටුවා ගැනීම මඟින් සාර්ථක ගසක් ලබා ගත හැකි අතර හොඳ ගුණාත්මක හා ප්‍රමාණාත්මක අස්වැන්නක් ලබා ගැනීමට හැකි වේ.

ඩබ්. අර්සලා නිලක්ශි
Agriculture Instructor
Department of Agriculture.


PINWATTA GEMS
DEALERS IN GEMS
PATHAKADA, PELMADULLA
045 22 74 133
MAIN STREET, PELMADULLA
045 22 74 980

# රත්නපුර ඔරලෝසු කණුවේ සැඟවුණු ඉතිහාසය



### * ඔරලෝසු කණුවේ නිමැවුම සහ වටිනාකම

රත්නපුරයේ ඔරලෝසු කණුව, රත්නපුර ජනතාවට මෙන්ම ඒ හරහා යන එන හාටත් අනිවාර්යයෙන් ම දැකගන්නට ලැබෙන දසුනක්. නමුත් ඒ කවුරුත් නොදන්නා වටිනාකමක් සහ ඉතිහාසයක් මේ ඔරලෝසු කණුවට ඈත අතීතයේ සිටම හිමිව ඇත. එහි නිමැවුම ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පයට අයත්වන අතර එය මුහුණත් සතරකින් යුක්ත වේ.

එමෙන් ම මෙම ඔරලෝසු කණුවේ පහළ කොටස නිර්මාණයේ දී කිරි ගරුඬ පුවරුවක් ද ඊට එක්කොට ඇති අතර එහි ඔරලෝසුව බෙන්සන් ලන්ඩන් නිශ්පාදනයක් බවද සඳහන් වේ. එපමණක් ද නොව මෙම ඔරලෝසුවේ, ඔරලෝසු කටු නිශ්පාදනය සඳහා රත්තරන් භාවිත කර තිබීම තුළින් මෙහි වටිනාකම තව තවත් ඉහළ යනු ඇත.

### * ඔරලෝසු කණුව විවෘත කිරීම සහ එම නිර්මාණයට පාදක වූ හේතුව

හිටපු ආණ්ඩුකාරවරයෙක් වන එස්.ඔඩින්ටන් මහතාගේ දිනපොතේ සඳහන් වන පරිදි 1922 මාර්තු මස 17 වන දින මෙම ඔරලෝසු කණුව විවෘත කළ බව සඳහන්ව ඇත. 1914 - 1918 දක්වා පැවති පළමු ලෝක යුද සමයේදී සබරගමු පළාත නියෝජනය කරමින් යුද්ධයට සහභාගී වුණු බ්‍රිතාන්‍ය ජාතික නිළධාරීන් 22ක් අතරින් යුද්ධයෙන් මියගිය රජයට අනුබද්ධව සේවයේ නියුතු හමුදා නිළධාරීන් 11 දෙනෙත් සිහිපත් කිරීම උදෙසා ඉදිකළ ස්මාරකයක් ලෙස මෙය නිර්මාණය වූ බව ඉතිහාසයේ සඳහන් වේ.







# රත්නපුරයට මූල්‍ය වසන්තය ගෙන ආ ලංකා බැංකුව

රත්නපුරේට නිරතුරුව වැස්සය. වැස්ස නිසා ගං වතුරය. සමන් දෙවිඳුන්ගේ ඇසළ පෙරහැර කාලයටත් වැස්සය. වැස්ස වලාහක දෙවියන්, සමන් දෙවියන්ගේ නිවුන් සහෝදරයෙක් වගේය. හරි යාළුය. "මුහුණු දෙකේ" මහ බඹා පෙරහැරේ යන්නෙත් මහ වැස්සට තෙමීගනය. එහෙත් වැස්ස ගැන රත්නපුරේ ඇත්තන්ගේ "නෝක්කාඩුවක්" නැත්තේය. සිරිපා බිමේ ඉපිද, කළු ගඟ දිගේ ගලන, මේ ජලධාරාවන් රුවන්පුර මැණික් පතල් වල ඉල්ලම් හෝදා, රතු කැට, නිල්කැට, වෛරෝඩි, පුෂ්පරාග, පද්ම රාග, මතුකර දෙන නිසාය.

මීදුමෙන් තොර සුන්දර රාත්‍රීන්හි, සිරිපා මළුවේ ආලෝකය, රත්නපුර හැම නිවසකටම පාහේ දිස්වෙයි. ඒ නිසා නිවසේ සිටම දිනපතා සිරිපා වඳින්නට තරම් රත්නපුරයේ ඇත්තන් වාසනාවන්තය. ඒ පින් අනුමෝදන් වන්නට සමන් දෙවියෝ, සැදී පැහැදී සිටිති. රත්නපුරයෙහි හැම මැණික් පතලකම සමන් දෙවියන් වෙනුවෙන් පහන් පැලක, පහනක් දැල් වෙන්නේ ඒ නිසාය.


රත්නපුරයට ලංකා බැංකුවේ ප්‍රවේශයද අතිසුන්දර පුරා වෘත්තයක්. කළු ගඟට යාබදව පහත් බිමක පිහිටි රත්නපුර නගරය මැද, එකිනෙකට පේන නොපෙනෙන දුරින් පිහිටි පුංචි කඳුගැට දෙකකි. එය උඩුකය නිරුවත්ව උඩු කුරුව සැතපෙන යොවුන් තරුණියක සිහි ගන්වන සොබා දහමේ අපූරු නිර්මාණයකි.

එක් කඳු වැටියක, ඇති පෞරාණික ඕලන්ද යුද බලකොටුව තුළ රත්නපුර ඇත්තන් නිරතුරුව යන එන රාජ්‍ය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පිහිටා ඇත. ඉස්සර එය හැඳින්වූයේ රාජ්‍ය මැණික් සංස්ථාව නමිනි.

අනිත් කඳුවැටිය මත, ෆර්ගියුසන් උසස් (බාලිකා) විද්‍යාලයේත් ධර්මපාල විද්‍යාලයේත් කොලු කෙල්ලන්ගේ "කරච්චලය" දරාගනිමින් ලංකා බැංකුව, අධිශ්‍රේණි ශාඛාව පිහිටා තිබේ. අද ධර්මපාල මාවත, සුද්දන්ගේ කාලයේ හැඳින්වූයේ "හෙලින්ස් රෝඩ්" නමිනි. පහත් බිමක පිහිටි රත්නපුර නගරයට හිමි, නිවුන් සොහොයුරියන් මෙන් වූ මේ උස්බිම් දෙකෙ හි ලංකා බැංකුවත්, මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියත් "අරක්ගෙන" සිටීම අපූරු සුසන්යෝගයකි. ඒ මේ ආයතන දෙක, නගරයේත්, ජනතාවගේත්, මැණික් කර්මාන්තයේත් සංවර්ධනය වෙනුවෙන් අගනා මෙහෙයක් ඉටු කළ නිසාය.

## රත්නපුර සංකෝචනය වූ මූල්‍ය වෙළඳපොළ....

එකළ රත්නපුර තුළ පැවතියේ මුළුමනින්ම අවිධිමත් මූල්‍ය වෙළඳපළකි. දිස්ත්‍රික්කයේ ඉඩම් වැඩි කොටසක් යටවී තිබුණේ, "මුඩුබිම් පනත" යටතේ ජනතාවගේ සරුසාර ඉඩම් සහ රජයේ ඉඩම්, පවරාගෙන බ්‍රිතාන්‍ය රන්පවුම් සමාගම් වලට සින්නවූ තේ සහ රබර් වතු අධිරාජ්‍යයටය. රටේ සැබෑ පුරවැසියන්ට වත්තකට ඇතුල්වීමට පවා "තහංචි" පනවා තිබුණි. තමිල්නාඩු, තිරුගල්වේලි, හිරුඩි, මදුරෙයි, නන්පෝර් යන දකුණු ඉන්දියානු ප්‍රදේශ වලින් කැඳවාගෙන ආ "මලයහ තමිලර්" නම් වූ අතිවිශාල ප්‍රමාණයක ද්‍රවිඩ කම්කරුවන්ගේ ශ්‍රමයෙන් බ්‍රිතාන්‍ය වතු සමාගම් වල හුදු මහත් කටයුත්තක්ම සිදු කරන ලදී. ඒ සියලු නිශ්පාදනයක්ම බ්‍රිතාන්‍යයට අපනයනය කරන ලද අතර ඉන් ලද අති දැවැන්ත මුදල් කන්දරාව බ්‍රිතාන්‍ය බැංකු වලටම ප්‍රේෂණය කරනු ලැබුණි. අතිශයින් දුෂ්කර ජීවිත ගතකළ වතු කම්කරු ප්‍රජාවට අවශ්‍ය මූල්‍ය සැපයුම, "චෙට්ටියාර්" නම් වූ බ්‍රහ්මණ වංශික ද්‍රවිඩ සම්භවයකින් යුත් ව්‍යාපාරික පිරිසක් විසින් සිදු කරන ලදී. වතු සමාගම් වලට දෛනිකව අවශ්‍ය මුදල් සහ කම්කරු වැටුප් ගෙවනු ලැබුවේ, සමාගම් වෙනුවෙන් චෙට්ටියාර්වරුන් සැපයූ මුදල් වලිනි. මීට අමතරව රන් භාණ්ඩ උගසට ගැනීම, පොලියට ණය මුදල් ලබා දීම වැනි අසංවිධි මුදල් වෙළඳපළක් ඔවුන් නගරයේ නිර්මාණය කර තිබූ අතර ඒ මඟින් වතු කම්කරුවන් මෙන් ම ග්‍රාමීය ජනතාව ද දැඩිලෙස සූරාකනු ලැබුණි.



එකල සිටි "චෙට්ටියාර්වරුන්"



බ්‍රිතාන්‍යයන් විසින් පතල් පාලනය කිරීම


අතීත මුස්ලිම් වෙළෙන්දන්

මේ යුගයේ මැණික් පතල් කර්මාන්තය ද පැවතියේ ප්‍රාථමික මට්ටමකය. ඉඩම් හිමියන්ට ප්‍රමාණවත් ප්‍රාග්ධනය හිඟකමක්, භාවිත කළ මෙවලම් ප්‍රාථමික මට්ටමේ වීමත්, මැණික් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොතිබීම නිසා, පතල් කර්මාන්තය නොදියුණු මට්ටමක විය. එම නිසා එවකට මැණික් මිලට ගැනීම සහ වෙළඳාම මුස්ලිම් ව්‍යාපාරිකයන්ගේ මූලිකත්වයෙන් සිදු වූ අතර, පතල් හිමියන්ට සහ පතල් කම්කරුවන්ට ලැබුණේ සුළු ආදායමකි. ලැබුණ වටිනා මැණික් බේරුවල මුස්ලිම් තොග වෙළෙන්දන් අතට පත්වූ අතර මැණික් අපනයනය ක්‍රියාවලියට නිසි ක්‍රමවේදයක් නොතිබුණි. මුදල් හුවමාරුව "උන්ඩියල්" ක්‍රමයට සිදු විය.



බ්‍රිතාන්‍යයන් විසින් පතල් පාලනය කිරීම

දිස්ත්‍රික්කයේ ඉඩම් බහුතරය බ්‍රිතාන්‍ය වතු සමාගම් වලට යටවී තිබූ අතර ඉතිරි ඉඩම්ද පාරම්පරික ඉඩම් හිමි ප්‍රභූ පැලැන්තියට හා පන්සල්, විහාර, දේවාල වලට හිමිව තිබුණේ පෙර සිංහල රජවරුන් ප්‍රභූන්වෙත ප්‍රධානය කළ නින්දගම්, ප්‍රධානයන් සහ සිද්ධස්ථානයන්ට කළ පූජා කිරීම් නිසාය. මෙම කරුණු ද මැණික් කර්මාන්තයේ ප්‍රවර්ධනයට සහ නගරයේ මූල්‍ය වෙළඳපළට දැඩි හානියක් සිදු කරමින් තිබුණි.

## පාරම්පරික ඉඩම්හිමි ප්‍රභූ පැලැන්තිය

එක්නැලිගොඩ වලව්ව, එල්ලාවල වලව්ව, මුත්තෙට්ටුවෙගම වලව්ව, ගිලීමලේ වලව්ව, බටුගෙදර වලව්ව, අංගම්මන වලව්ව, මොලමුරේ වලව්ව, ආටිගල වලව්ව, දම්බුළුවන වලව්ව, මාරඹේ වලව්ව, කිරිඇල්ල වලව්ව, මහවලතැන්න වලව්ව, යායින්න වලව්ව, ගුණසේකර වලව්ව, ගන්කන්ද වලව්ව, තෙන්නකෝන් වලව්ව, වීරසේකර වලව්ව, වේරගම වලව්ව... ඉන් කිහිපයකි.


එක්නැලිගොඩ වලව්ව


ගිලීමලේ වලව්ව


මහවලතැන්න වලව්ව



කොට්ටිඹුල්වල රජමහ විහාරය



පැල්මඩුල්ල රජමහ විහාරය



බලංගොඩ අලුත් නුවර කතරගම දේවාලය



බොල්තුඹේ සමන් දේවාලය



සුමන සමන් දේවාලය



පොත්ගුල් රජමහා විහාරය

## පන්සල්, විහාර, දේවාල

රත්නපුර සමන් දේවාලය, බොල්තුඹේ සමන් දේවාලය, බලංගොඩ අලුත් නුවර කතරගම දේවාලය, කොට්ටිඹුල්වල රජමහ විහාරය, රත්නපුර පොත්ගුල් රජමහා විහාරය, නැදුන් විහාරය, පැල්මඩුල්ල මහ පන්සල, ඇඹිලිපිටිය දුටුගැමුණු මහා විහාරය... ඉන් කිහිපයකි.



නැදුන් රජමහා විහාරය


විදේශීය වතු සමාගම් වල, තේ සහ රබර් කම්හල් හැර, නිශ්පාදන ආර්ථිකයට ප්‍රශස්ත දායකත්වයක් දෙන දේශීය ව්‍යවසායකයන්, රත්නපුරයෙන් ඒ යුගය තෙක් බිහි වී තිබුණේ නැත.

## පළමු දේශීය බැංකුවේ ආරම්භය

ලංකා බැංකුව 1939 අගෝස්තු මස 01 දින කොළඹ, කොටුව බ්‍රිස්ටල් වීදියේ දී ආරම්භ කරන ලදී. එය පළමු ශ්‍රී ලාංකික වෙළඳ බැංකුව විය. පළමු මහා කළමනාකරුවන ඩබ්.බී. මැකේ, දෙවනුව ජේ.එච්.මෝටිලොක්, තෙවනුව ඒ.ටී.හන්ටර් වන අතර සියලු දෙනාම ඉංග්‍රීසි ජාතික ප්‍රවීන බැංකුකරුවන් වූහ. ලංකා බැංකුවේ ප්‍රථම ශ්‍රී ලාංකික මහ කළමනාකරු ලෙස සී.ලෝගනාදන් මහතා පත්විය. ඒ 1953 වසරේදී ය. ඒ බැංකුව ආරම්භ කර වසර 14කට පසුවය.


දැනට පවතින ලංකා බැංකු ප්‍රධාන ශාඛාව ඉදි කළ අයුරු




සී.ලෝගනාදන් මහතා

බ්‍රිස්ටල් වීදියේ පළමු ශ්‍රී ලාංකික වෙළඳ බැංකුව

## රත්නපුරයට පමාවී පැමිණි මූල්‍ය වසන්තය...

කොළඹ නගරයට "අල්ලපු වැටේ" රත්නපුර දිස්ත්‍රික්කය තිබුණත්, රත්නපුරයට ලංකා බැංකුව පැමිණීමට වසර 20ක් ගතවීම විස්මයට කරුණකි. රත්නපුර නගරය, සබරගමුවේ අග නගරය වුවත් එහි දෙවන නගරය වන කෑගල්ලේත් බැංකු ශාඛාව පිහිටු වීමෙන් පසුව, දැඩි ප්‍රමාදයකින් යුක්තව රත්නපුරයට පැමිණියේය. පිළිවෙළින් මහනුවර, ගාල්ල, යාපනය, ත්‍රිකුණාමලය, පානදුර, කුරුණෑගල, බදුල්ල, මඩකලපුව, කළුතර, මීගමුව, හලාවත, අනුරාධපුරය, වැල්ලවත්ත, මාතර, කෑගල්ල නගර වලට ව්‍යාප්ත වූ ලංකා බැංකුව අවසානයේ 1959 වසරේ රත්නපුරයට සම්ප්‍රාප්ත විය.

පුදුමය නම් අපේ සහෝදර දේශීය රාජ්‍ය බැංකුවද ඒ මඟම ගැනීමය. මහජන බැංකුව 1961 ආරම්භ කළද, එහි රත්නපුර ප්‍රධාන ශාඛාව විවෘත කළේ ද වසර 9 ක "ප්‍රමාදයකින්" පසුව 1970 වසරේදී ය.

සියලු ම වාණිජ බැංකු, තම ශාඛාවන් පිහිටුවන්නේ, වෙළඳපළ මට්ටම ව්‍යාපාරික ප්‍රජාව, බැංකු ශාඛාවන් පිහිටු වීමට නගරයේ ඇති ආර්ථික ශඛ්‍යතාවය, වැනි බොහෝ නිර්නායකයන්, නිසිසේ අධ්‍යයනය කිරීමෙන් අනතුරුවය. අප කළින් විස්තර කළ පරිදි රත්නපුර නගරයේ සෙමෙන් සිදු වූ මූල්‍ය ප්‍රසාරණය ඊට හේතු වූ බව පැහැදිලිය.



## බසයකින් රත්නපුරයට පැමිණි ලංකා බැංකුව

50 දශකයේ එක් දවසක හෙලින්ස් මාවතේ ඉඩකඩ ඇති තැනක "තද කොළ පාට" පුද්ගලික බසයක් පැමිණ නවත්වන ලදී. "කොළ පාට" වයි පලදින ෆර්ගසන් කෙල්ලන්ටත්, ධර්මපාලයේ දඟකාර කොල්ලන්ටත් මේ "තද කොළ පාට" බසය අරුමයක් විය. ඒ රත්නපුරයට එන පළමු බැංකුවේ, ලංකා බැංකුවේ ආගමනයයි. බස් රථයක "පුංචි ඉඩක්" තුළ ලංකාවේ "ලොකුම බැංකුවේ" ශාඛාවක් ඇරඹෙන්නේ එසේය. කොළඹ ප්‍රධාන කාර්යාලය "Bank on Wheels" නමින් ප්‍රචාරක කටයුතු සඳහා භාවිත කළ මෙම රථය රත්නපුර ප්‍රථම බැංකුවේ "තිඹිරි" ගෙය විය. රත්නපුරයේ පැරණි ඇත්තන් ලංකා බැංකුව හඳුන්වනු ලැබුවේ "බස් එකේ බැංකුව" ලෙසය. කෙසේ වෙතත් 1959 වසර තුළදී ම හෙලින්ස් මාවතේ නව දෙමහල් ගොඩනැගිල්ල තුළ රත්නපුර ලංකා බැංකු ශාඛාව ස්ථාපනය විය. තම මෙහෙය නිමාකළ "කොළ පාට බස් එක" කොළඹ ගියේ ය.





## රත්නපුරයට "ඩොලර් වැසි" වැස්ස වූ ගෙවුඩ වසන්තය

80 දශකය තෙක්ම "ගෙවුඩ" යනු මැණික් නොවේ. ඒවා පතල් වලින් හමුවන කිසිදු වටිනාකමක් නැති ඉවතට විසි කරනු ලබන පාෂාණ වර්ගයකි. "කොරොන්ඩම්" කුලයට අයත්වන පාෂාණ පොළව යටදී ඉහළ තාපාංකයකට ලක්ව "මැණික්" බිහිවන බව සැලකේ. "ගෙවුඩ" යනු නියමිත උෂ්ණත්වය නොලැබ බාගෙට නිර්මාණය වූ එහෙත් "කොරොන්ඩම්" කුලයට ම අයත් වන පෙනුමක්, දිස්නයක් නොමැති පාෂාණයකි. එම පාෂාණයම, බාහිරින් නියමිත උෂ්ණත්වය ලබාදුනහොත් වටිනා මැණිකක් නිර්මාණය කර ගැනීමට හැකියාව තිබේ. මේ තාක්ෂණය මුලින් ම සොයාගෙන තිබුණේ තායිලන්ත මැණික් ව්‍යාපාරිකයන්ය. ඔවුන් ලංකාවට පැමිණ මෙම "නොවටිනා" ගෙවුඩ වලට ඉහළම මිලක් ගෙවමින්, තරඟකාරී මිලට ඒවා ලබාගැනීම ආරම්භ කළහ.

මින් වෙළඳපළට ලැබෙන පිරිවැටුම ඉතා ඉහළ අගයක් ගත් අතර, කලින් නොවටිනා ලෙස සළකා ඉවත් කර දැමූ මෙම ගෙවුඩ විකිණීම මඟින් පොඩි ව්‍යාපාරිකයින් මිලියනපතියන් බවට පත්වූහ. රත්නපුර, බටුගෙදර ප්‍රදේශ තායි මැණික් ව්‍යාපාරිකයන්ගෙන් පිරුණු ප්‍රධාන ගෙවුඩ - මැණික් වෙළඳපළක් බවට පත්විය.

තායි - මැණික් වෙළඳුන්ට අවශ්‍ය සහාය ලබා දීමට මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙනම "ගෙවුඩ මැණික් ඒකකයක්" රත්නපුර පිහිට වූ අතර එහිදී ඩොලර් ගණුදෙනු සඳහා නිල බැංකුකරු වූයේ ලංකා බැංකුවයි. එය රත්නපුරයට "ඩොලර් වැස්සක්" වූ අතර, ලංකා බැංකුවට "ඩොලර්" උනන උල්පතක් විය.

## රත්නපුර මූල්‍ය වෙළඳපොළ "වැඩිවියට පත්වීම"

1940, 1950, 1960 දශකයන් හි මැණික් ව්‍යාපාරය කේන්ද්‍රගතව තිබුණේ රත්නපුර, ඇහැළියගොඩ, කහවත්ත නගර ත්‍රිත්වය තුළය. ඒ දිනවල මැණික් ව්‍යාපාරය පතල් හිමියා සහ මැණික් වෙළෙන්දා අතර සිදුවන අතිශයින් "රහස්‍ය" ගණුදෙනුවකි. කෝටිගණන් වටිනා මැණික් ගල් මේ වනතෙක් වෙළඳාමෙහි හුවමාරු වුවද එහි දී රිසිට් පතක්, ලදුපතක් හෝ වෙනත් නීත්‍යානුකූල ලේඛනයක් භාවිත නොවී, ගණුදෙනු වැඩිපුරම අත්පිට මුදලට සිදු වුවද චෙක්පත් භාවිතයත් ඇත්තේම නැති විය. මේ නගර ත්‍රිත්වයේ දී කෝටි ගණන් ගණුදෙනු දිනපතා බහුලව සිදු වුවද ඒ කිසිවක් නීත්‍යානුකූලව සිදු වූයේ නැත. ආදායම්බදු අංශයට හෙළිවන්නේ ද නැත. මුදල් බැංකුගත වන්නේ ද නැත. තනිකරම "කළු සල්ලි" ජාවාරමකි.

1959 වසරේ ලංකා බැංකුව රත්නපුරයට පැමිණීමත් 1970 මහජන බැංකුව රත්නපුරට පැමිණීමත් 1970 දශකයේ රාජ්‍ය මැණික් සංස්ථාව (පසුව ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය) රත්නපුරයේ ස්ථාපනය වීමත් නිසා මැණික් වෙළඳාම නීත්‍යානුකූල ව්‍යාපාරයක් බවට පත්විය.



**සිසිර බණ්ඩාර තානායම්වත්ත**
ප්‍රධාන කළමනාකරු, ලංකා බැංකුව
අධ්‍යක්ෂ - බැංකු හා මූල්‍ය කටයුතු
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය
(විශ්‍රාමික)




හඳා මාරපන වැනි මැණික් පිළිබඳ විශේෂඥයින්ගේ පුහුණු පාඨමාලාවන් ද රාජ්‍ය මැණික් සංස්ථාවේ (පසුව අධිකාරිය) වැඩසටහන් තුළින් ද දිස්ත්‍රික්කය පුරා මැණික් අංශයේ තරුණ ව්‍යවසායකයින් රාශියක් බිහිවිය. රාජ්‍ය බැංකු හරහා පතල් කැනීම, මැණික් ගල් ඔප දැමීම, අගය වැඩි කිරීම, අපනයනය ආදිය සඳහා මූල්‍ය සහාය ලබා ගැනීම ඇරඹුණි. අපනයනයේ දී කොළඹ ලංකා බැංකුවේ ජාත්‍යන්තර අංශයේ සහයද රත්නපුර ශාඛාව හරහා පහසුවෙන් ලබාගත හැකි විය. මැණික් බහුලව හමුවන පතල් ව්‍යාපාරිකයින්ට "මැණික් වෙන්දේසිය" මඟින් උපරිම මිල ගණන් ලබා ගැනීමට හැකි වූ අතර එම කටයුතු මැණික් අධිකාරියේ නියාමනය යටතේ සිදු වේ.

කලින් තිබූ මැණික් වෙළඳාමේ ඒකාධිකාරය ක්‍රමිකව බිඳියමින් පවතියි. තරුණ සිංහල, මුස්ලිම් සහ දමිළ ව්‍යවසායකයින් තරඟකාරීව, එමෙන්ම සුහදශීලීව තම වෘත්තියේ නියැලී සිටිති. ඒ මඟින් නිරෝගී වෙළඳ තරඟයක් (Healthy trade competition) ඇති වී තිබෙන අතර මැණික් සඳහා ප්‍රශස්ත මිලක් ලබා ගැනීමට පතල් හිමියන්ට අවකාශය ලැබී ඇත. දිනපතා පැවැත්වෙන සුප්‍රකට අඹගහයට, ඔරලෝසු කණුව, දෙමුවාවත "මැණික් පොළ" මැණික් විකුණන්නන්ගෙන් සහ මිල දී ගන්නන්ගෙන් පිරී පවතී. එහි ව්‍යාපාරික තරුණයින් තුළින් "එක් දවසක්" තුළ කෝටිපති මැණික් ව්‍යාපාරිකයන් කිහිපදෙනෙක්ම බිහිවීමේ ප්‍රවණතාවයක් ඇති වී තිබෙන නිසා "මේ මැණික්පොළ" බෙහෙවින් සරුසාරය.

ඒ අතර "නගර ත්‍රිත්වයේ" ඒකරාශී වී තිබූ මැණික් වෙළඳාම බලංගොඩ, රක්වාන, නිවිතිගල,කලවාන, ගොඩකවෙල වැනි ප්‍රදේශ වලට ද ව්‍යාප්ත වී තිබේ.

එක් ජන කොටසක ඒකාධිකාරයක් බවට පත්ව තිබූ මැණික් මිලට ගැනීම, තක්සේරුව, ඔපමට්ටම් කිරීම (Value added) සහ විශේෂයෙන් අපනයනය තරුණ ප්‍රජාව (සිංහල,මුස්ලිම් සහ දමිළ) අතට පත්වීම බෙහෙවින්ම සාධනීය ලක්ෂණයකි. ඔවුහු තායිලන්තය, හොංකොං, චීන, ඉන්දියානු පමණක් නොව යුරෝපීය වෙළඳපළ ද දිනාගනිමින් සිටිති.

අනාගතය ගොඩනගන්නේ ඔවුන්ය. රත්නපුරය අනාගතයේ දී ජාත්‍යන්තර මැණික් නගරයක් බවට පත් කරනු ලබන්නේ මේ තරුණ ප්‍රජාව විසිනි. අපි ඔවුන් දෙස සුභවාදීව බලා සිටින්නෙමු.

පතල් කැනීමේ කටයුතු යාන්ත්‍රීකරණය (බැකෝ පතල්) නිසා වැඩි ඵලදාවක් ඉක්මණින් නෙළාගැනීමේ භාග්‍යය ද පතල් කනින්නන්ට හිමිව තිබේ.

මේ සියලු කරුණු නිසා "මැණික් මත" බිහි වූ සාර්ථක වෙළඳ නගරයක් බවට රත්නපුරය පත්වී තිබේ.

රාජ්කුමාර් ජෙම්ස්

Raj Kumar Gems

RAJKUMAR GEMS (PVT) LTD.
NO 4, MAIN STREET, RATNAPURA
045 22 33 461



# W.M.ABDUL MAGEED APPA

**Beruwala, a charming seaside town in Sri Lanka, occupies a unique and captivating role in the gem industry. Renowned for hosting the world's first open-air gem market, it has served as a vibrant center for the international gem trade, seamlessly merging its rich heritage, colorful culture, and age-old artistry. Abdul Mageed Appa are the legends of Beruwala Gem Industry with a smart history at Gem business. A few of his past memories are given below.**





Welcome to Prime Minister Col:Rt. Hon. Sir John Kotalawala
25th February 1956

GEM SALE
at Ratnapura, Ceylon



Mr. W.M. Abdul Mageed
Mr. A.R.M. Abdul Mageed
Mr. A.A. Abdul Rahuman
Mr. Albert Ramsay

HIS EXCELLENCY THE GOVERNOR OF CEYLON
IN HIS OFFICIAL VISIT TO RATNAPURA.
(THE CITY OF GEMS) 23.03.1939



HIS EXCELLENCY THE GOVERNOR
SIR ANDREW CALDECOTT

K.D. ALLIS APPUHAMY
(Father of Mr. J.Kuruppu, M.S.C. Ratnapura.)

W.M. ABDUL MAGEED
(Leading Gem Merchant of Ratnapura.)




W.M. Abdul Mageed's Gem Shop







# සෙලිජ් ටයිල් (Zellige Tile) නිෂ්පාදනයේ ඉතිහාසය සහ ක්‍රියාවලිය

මොරොක්කෝ ටයිල් සෑදීමේ සම්ප්‍රදායක් වන සෙලිජ් ටයිල් නිෂ්පාදනය 12 වන සියවසේ සිට පැවත එන්නකි. එය ලෝකයේ පැරණිතම සහ අඛණ්ඩව භාවිත වන ටයිල් සෑදීමේ සම්ප්‍රදාය වියහැකි බව කියවෙයි. සෙලිජ් ටයිල් නිෂ්පාදනය සම්පූර්ණයෙන් ම දෑතේ නිෂ්පාදනයකි. එසේ යන්ත්‍රෝපකරණ භාවිතයෙන් තොරව දෑතේ නිෂ්පාදනයක් ලෙස එහි නිර්මාණ කටයුතු සිදුවන නිසාවෙන් ඒවා එකිනෙකට තරමක් වෙනස් වේ. සෙලිජ් ටයිල් සඳහා අද්විතීය අලංකාරබවක් එක්වන්නේද ඒ නිසාමය. ශිල්පියාගේ දෑතේ ක්‍රියාකාරීත්වය සමඟ එහි වර්ණ සහ නිර්මාණාත්මක බව තීරණය වන නිසාම එය කල්පවතින කලා නිර්මාණයක් ලෙස සංස්කෘතියට ද සාක්ෂි එක්කරයි.



## සෙලිජ් ටයිල් සෑදීමේ සම්ප්‍රදාය

මෙම නිර්මාණය 100% ක් දෑතේ ශ්‍රමය සහ කාලය වැය කරමින් මනා පුහුණුවකින් යුතුව සාර්ථකව ඉටුකර ගැනීම සඳහා නිර්මාණ ශිල්පීන් එහි සෑම පියවරක්ම ඉතා ප්‍රවේශමෙන් අනුගමනය කරයි.

සෙලිජ් ටයිල් සෑදීමේ ක්‍රියාවලිය ආරම්භ වී ඇත්තේ දේශීය ප්‍රභවයක් ඇති මැටි වලින් ය. ඒ සඳහා දින කිහිපයක් වියළි මැටි ජලය සමඟ මිශ්‍ර කර පසුව නිසි ඝනත්වයට පත්වනතෙක් අතින් මිශ්‍ර කරණු ලැබේ. එසේ සාදාගත් මැටි නිසි පදමට එනතෙක් දින කිහිපයක් වියළනු ලැබේ.

## සෙලිජ් හැඩතල සෑදීම

වියළන ලද ටයිල්හි ඇති හිස්තැන්වලට දේශීය ලීයක ආධාරයෙන් අතින් මට්ටම් කර සකසන අතර මැටි තලා සම්පීඩනය කර වායු බුබුලු ඉවත් කරයි. මෙම ක්‍රියාවලියේ දී මැටි මතුපිට ස්පාටුලයක් භාවිතයෙන් අතින් සුමට කිරීම තුළින් සෙලිජ් ටයිල්වලට ආවේනික ලක්ෂණීය රැළි ඇතිවේ. ඉන්පසුව ලෝහ අච්චුවක් භාවිතයෙන් නියමිත හතරැස් හැඩයන්ට කපා ටයිල් සියල්ලම එකම ප්‍රමාණයකට සකස් කරගනු ලැබේ. ඉවත්ව යන මැටි අවශේෂ ඉදිරියේ දී භාවිතය සඳහා අමු මැටිවලට නැවත ප්‍රතිචක්‍රීකරණය කරණු ලැබේ.

## සෙලිජ් රටා කැපීම

සෙලිජ් ටයිල් කැපීම සඳහා එම ශිල්පීන් සාම්ප්‍රදායිකව ලෝහ භාවිතයෙන් සකසා ගත් අච්චු භාවිත කරයි. සෙලිජ් ටයිල් කැපීමට පෙර එහි හැඩය සහ ප්‍රමාණය තීරණය කරන අතර ඉන්පසුව අච්චුවක් ආධාරයෙන් ටයිල් කැපීම සිදුකරයි. සංකීර්ණ කුඩා හැඩතල කැපීම සඳහා මනා පලපුරුද්දක් සහ දක්ෂතාවයක් තිබීම අත්‍යවශ්‍ය වන අතර ඒ පිළිබඳව පරිපූර්ණත්වයට පත්වීමට වසර ගණනාවක් ගතවේ. ටයිල් කැපීමේ දී කණිෂ්ඨ ශිල්පියෙකු විසින් ටයිල්හි රළු හැඩ කපාදමනු ලබයි. ඉන්පසුව එහි ඉතිරි කොටස සුදුසු පුද්ගලයෙකු විසින් සිදු කරන අතරම එහි ප්‍රවීණයෙකු වීමට නම් වසර ගණනාවක් ආධුනිකයෙක් ලෙස පුරුදු පුහුණු වීම අත්‍යවශ්‍ය වේ.

## සෙලිජ් ටයිල්හි ආවේණිකත්වය

වසර සිය දහස් ගණනක් තිස්සේ සාම්ප්‍රදායිකව පැවත එන සෙලිජ් ටයිල් සැකසීමේ ක්‍රියාවලිය තුළ සුළු වශයෙන් සිදුවන යම් යම් වෙනස්වීම් සහ අඩුපාඩු දක්නට ලැබීම ඉතා සාමාන්‍ය තත්ත්වයකි. මන්ද එය දෑතේ නිෂ්පාදනයක් නිසාවෙනි. සෙලිජ් ටයිල් නැව්ගත කිරීමක දී එහි ඝනත්වය, වර්ණය සහ මතුපිට වෙනස්වීම් අපේක්ෂා කිරීමට සිදුවේ. සෙලිජ් ටයිල්හි වර්ණ අතින් ඔපදැමීමේ ප්‍රතිඵලයක් ලෙස එහි පැහැය වෙනස්වෙන අවස්ථා ඇත. විවිධත්වයකින් යුතු ඝනකමකින් සහ ග්ලේස් (මතුපිට දීප්තය සඳහා භාවිත වේ) ප්‍රමාණයකින් යුක්ත වන බැවින් එය අවසානයේ ලැබෙන වර්ණයට බලපානු ඇත. මෙම වර්ණ වෙනස් වීම සෙලිජ් ටයිල් සඳහාම ආවේණික සුවිශේෂීතාවයක් වන අතර ඒ තුළින් එහි ඉල්ලුමද ඉහළ යනු ඇත.



ගයත්‍රී කරුණාදාස

# සබරගමුව විශ්වවිද්‍යාලයේ රත්නවිද්‍යා පාඨමාලාව



දශකයක පමණ කාලයක සිට පැවති සිහිනයක් සැබෑ කරමින් මැණික් පුරයේ දැනුම උත්පාදනයේ කේන්ද්‍රස්ථානය වන ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් 2022 වසරේ දී රත්න විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ තුන්වන මට්ටමට අයත් මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ

1. මැණික් ගල් ඇතිවීම පිළිබඳ ශිෂ්‍යයන්ගේ අවබෝධය පුළුල් කිරීම.
2. මැණික් සහ ඒවායේ ගුණාංග පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම පුළුල් කිරීම.
3. පුළුල් පරාසයක මැණික් ගල්වල ලාක්ෂණික සහ හඳුනාගැනීමේ ලක්ෂණ පිළිබඳ ශිෂ්‍යයන්ගේ ආකල්ප හා කුසලතා පුළුල් කිරීම.
4. මැණික් විද්‍යාවේ විවිධ ක්ෂේත්‍ර සහ මැණික් අධ්‍යයනය සහ පරීක්ෂා කිරීමේදී ඒවායේ වැදගත්කම පිළිබඳ ආකල්ප වැඩිදියුණු කිරීම සහ අවබෝධයක් ලබා ගැනීම.
5. මැණික් ක්ෂේත්‍රය තුළ විද්‍යානුකූලව අදහස් ඉදිරිපත් කිරීම දිරිමත් කිරීම.
6. නිරවද්‍යතාවය, විෂය මූලිකත්වය, අඛණ්ඩතාව, විමර්ශනය, මුලපිරීම සහ තීක්ෂණ බුද්ධිය වැනි මැණික් ක්ෂේත්‍රයට අදාල ආකල්ප ශිෂ්‍යයන් තුළ වැඩි දියුණු කිරීම.
7. මැණික් කාර්මාන්තයේ නීති සම්පාදනය, සංවිධානය සහ පාරිසරික කළමනාකරණයේ අගය පිළිබඳ ආකල්ප වැඩි දියුණු කිරීම.



ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මැණික් හා රත්නවිද්‍යාව, ඛණිජ , පාෂාණ හා මැණික්, මැණික් සෑදීමේ ක්‍රියාවලියන්, මැණික් වල රසායනික සංයුතීන්, මැණික් ද්‍රව්‍ය හා ව්‍යූහයන්, මැණික් වල භෞතික ගුණාංග, ලංකාවේ මැණික් නිධි වල භූ විද්‍යාව, සබරගමුව පළාතේ මැණික් ක්ෂේත්‍රය, ක්ෂේත්‍ර චාරිකා, මැණික් කැපීම සහ ඔප දැමීම, මැණික් ගල් තාප පිරියම් කිරීම, ලැපිඩරි සහ ආභරණ කර්මාන්තය, මැණික් වෙළඳාම, මැණික් හඳුනාගැනීමේ ක්‍රියාකාරකම්, දියමන්ති හා දියමන්ති කර්මාන්තය, ස්වභාවික මැණික් හා කෘතිම මැණික් ගවේෂණය සහ පාරිසරික කළමනාකරණය වැනි පුළුල් පරාසයක විහිදුන විෂය මාලාවක් හඳුන්වා දී ඇත. තවද ව්‍යාපාර සන්නිවේදනයට ඉංග්‍රීසි භාෂාව වැඩි දියුණු කරගැනීම සඳහා ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය නැමැති විෂයද හඳුන්වා දී ඇත. සියලුම ශිෂ්‍යයන් මැණික් ක්ෂේත්‍රයට අදාල ශිෂ්‍ය ව්‍යාපෘතියක වාර්තාවක් වසර අවසානයේ පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා ලබා දිය යුතු වේ.







2021 වසරේ සිට එල්.එම්.සී.එස්.ඒ. අබේමාන්න, ආනන්ද දෑල හා පුන්සිරි තෙන්නකෝන් යන මහතුන්ගේ මැදිහත් වීමෙන් 2022 වසරේ දී ලංකා මැණික් ව්‍යාපාරිකයින්ගේ හා පතල්කරුවන්ගේ මහා සංගමය විසින් මිලියන දහයක පමණ වූ රත්න විද්‍යා පාඨමාලාවට අවශ්‍ය කරන උපකරණ පොරොන්දු වූ පරිදිම විශ්වවිද්‍යාලය වෙත ලබා දීම නිසා ජ්‍යේෂ්ඨ මහාචාර්ය චන්දන උඩවත්ත හා ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරුන් වන එල්.වී. රනවීර, ඩී.එන්.එස්. වන්නිආච්චි, හසින්ත විජේසේකර විසින් කරන ලද යෝග්‍යතා සංගණනයකින් පසු 2022 වසරේ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අවසරය ලබා ගන්නා ලදී. මෙම කාර්යයයේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ කාර්යංශය, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ලැබුණ නොමද සහයෝගය අමතක කළ නොහැක.







මේ වන විට 2022 පළමු කාණ්ඩායම ඩිප්ලෝමා සහතිකපත් ලබා ඇති අතර, 2023 දෙවැනි කණ්ඩායමේ සියලු අධ්‍යයන කටයුතු අවසන්ව ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටී. 2024 තුන්වැනි කණ්ඩායම 2024 නොවැම්බර් මස ආරම්භ වී සාර්ථකව අධ්‍යාපන කටයුතු වල නියලෙමින් සිටී. 2025 හතරවැනි කණ්ඩායමට සහභාගී වීමට කැමැති සුදුසුකම් සපුරා ඇති අය වයස භේදයකින් තොරව සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රය අමතා අවශ්‍ය තොරතුරු ලබාගත හැක. (0452280179)











ලෝක ප්‍රකට ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයේ උන්නතිය සඳහා බුද්ධිය, කුසලතා හා ආකල්පමය වශයෙන් සබරගමුව විශ්වවිද්‍යාලය ක්‍රියාකාරීව මැණික් ක්ෂේත්‍රයේ සියලු පාර්ශව සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් සිටී. මේ සඳහා සියලු දෙනාට සබරගමුව විශ්වවිද්‍යාලය සමඟ එකතු වන මෙන් ඉල්ලා සිටමු.

පාඨමාලා සමායෝජක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආචාර්යය ඩී. එන්. එස්. වන්නිආරච්චි හා
ආචාර්ය්‍ය හසින්ත විජේසේකර










# ක්‍රොඒෂියාවේ ප්ලිට්විස් විල් ජාතික වනෝද්‍යානය

ප්ලිට්විස් විල් ජාතික වනෝද්‍යානය ක්‍රොඒෂියාවේ ඇති විශාලතම ජාතික වනෝද්‍යානයයි. එය හෙක්ටයාර 30,000කට ආසන්න භූමි ප්‍රමාණයක් ආවරණය කරයි. එය ක්‍රොඒෂියාවේ මධ්‍යම ප්‍රදේශයේ ඩිනරයිට් කඳුකරයේ පහළ උන්නාංශ වල පිහිටා ඇත. වනාන්තර සහ තණබිම් අතරින් ප්ලිට්විස් විල් පද්ධතිය කැපී පෙනෙන සුන්දර දර්ශනයක් මතු කරන අතරම එය විද්‍යාඥයින්ගේ සහ සංචාරකයින්ගේ සිත් ඇද ගනියි. එමෙන් ම හුණුගල් සහ හුණුමතින් ගලායාම එහි සුන්දරත්වය තවත් වැඩි කරයි. මෙම වනෝද්‍යාන ප්‍රදේශය ප්‍රධාන වශයෙන් (පොළොවට ඉහළින් සහ පහළින්) භූ රසායනික ක්‍රියාවලීන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය සංරක්ෂිත වනාන්තර වලින් වැසී ඇති අතර ඊට හෙක්ටයාර 84ක පැරණි වර්ධන වනාන්තරයක් ඇතුළත් වේ. මෙම උද්‍යානය කැපී පෙනෙන ජෛව විවිධත්වයකින්ද යුක්ත වේ. මෙහි දුඹුරු වලසුන්, අළු වෘකයා සහ බොහෝ දුර්ලභ පක්ෂීන් සැරිසරන අතර එහි පවතින ශාක අතර තණබිම් වලට විශේෂ තැනක් හිමි වේ.

ප්ලිට්විස් විල් පද්ධතිය හැඩගස්වා ඇති ප්‍රධානතම අසාමාන්‍ය ක්‍රියාවලිය වන්නේ ජල මාර්ගය හරහා බාධක සාදන ටූෆා නිර්මාණයයි. ටූෆා බාධක යනු ජලය, වාතය, අවසාදිත (භූ විද්‍යාත්මක පදනම) සහ ජීවීන් අතර දිගු කාලීන හා අඛණ්ඩව පවතින අන්තර් ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයකි. එමෙන් ම ටූෆා බාධක වල වර්ධනයේ ගතිකත්වය සහ ඛාදනය හේතුවෙන් විල් පද්ධතිය නිරන්තර වෙන්වීම් වලට ද භාජනය වේ. එම බාධක ආසන්නයේ කරන නිරීක්ෂණ තුළ පෙනී යන්නේ ඉතා විශේෂිත වාසස්ථානයන්හි වාසය කරන පාසි සහ තවත් භූමිෂ්ඨ හා ජලජ ජීවීන්ගේ සර්ව සම්පූර්ණ අවශේෂයි.

දිගු කාලීන සංරක්ෂණ ඉතිහාසයකට අනුකූලව ප්ලිට්විස් විල් ජාතික වනෝද්‍යානය හොඳින් කළමනාකරණය කර ඇත. එමෙන්ම ආර්ථික වශයෙන් හා අධ්‍යාපනික වශයෙන් ප්ලිට්විස් විශාල වරප්‍රසාදයක් හිමිකර ගත් සුවිශේෂී ස්ථානයක් වන අතර මෙය ලෝක උරුමයක් ද වේ.





ගයත්‍රි කරුණාදාස

# මැණික් සහ ස්වර්ණාභරණ අපනයනය එදා සහ අද



එදා රාජ්‍ය මැණික් සංස්ථාව පිහිටුවීම පිළිබඳව ලංකා රාජ්‍ය සභාවට කලින් කල යෝජනා ඉදිරිපත් කළ නමුත් එය ක්‍රියාත්මක වූයේ ලංකා පාර්ලිමේන්තුවේ 1970 - 71 සැසිවාරයේ 1971 අංක 13 දරණ රාජ්‍ය මැණික් සංස්ථා ආඥා පනත අනුමත වීමෙන් පසුව එම වර්ෂයේ නොවැම්බර් මස 01 වන දින සිටය.

සංස්ථාව පිහිටුවීමට පෙර මැණික් අපනයනය කිරීමේ යෙදී සිටි වෙළඳ මහතුන්, එක් පාර්සලයක් අපනයනය කිරීමට සතියක, දෙකක ඇතැම් විට මාසයක් වැනි දීර්ඝ වටිනා කාලයක් මේ සඳහා විඩංගු කොට ඇත. තම මැණික් පාර්සලය පළමුව තක්සේරු කර ගැනීමට රේගු මැණික් තක්සේරුකරු වෙත කිහිපවරක් ගෙන යාමට සිදු වූ අවස්ථාද මීට අමතරව, අවසරපත් ලබා ගැනීමට ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුව, විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත යාම තමන් විසින් ම කළ යුතු බැවින්, තම පාර්සලය යැවීම දින කිහිපයකින් තවත් ප්‍රමාද වී ඇත.

1971 නොවැම්බර් මස 01 දිනෙන් පසුව, මැණික් සංස්ථා නිලධාරීන්ගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වූ බැවින් අපනයනකරුවන්ට තවත් කාලය ගතවුණි. මේ අනුව ඇතිවන කරදර හිරිහැර ගැන මැණික් සංස්ථාව වෙත කරුණු ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වූයේ සංස්ථාවේ අපනයන අංශයක් බිහිවීමයි. ඒ අනුව පුද්ගලික වෙළඳුන්ගේ මැණික් අපනයනය 1972 අගෝස්තු මස 01 වන දින සිට සංස්ථාව මඟින් ආරම්භ කර ඇත.

1993 අංක 50 දරණ පනතට අනුව පිහිටවනු ලැබූ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් අපනයන ක්‍රියාවලියට අදාල සීමා ආදිය ලිහිල් කර පැයකට වඩා අඩු කාලයක් තුළ අපනයන සේවා කටයුතු සිදු කිරීමට මහත් පරිශ්‍රමයක් මේ වනවිට ගෙන ඇති අතර, 2024 වනවිට දේශීය ආර්ථිකයේ 07 වන ස්ථානයේ රැඳී සිටි මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ දායකත්වය ප්‍රධාන කාණ්ඩ තුන යටතට ගැනීමට ද අධිකාරිය කටයුතු කරගෙන යන ආකාරය ඉතා ප්‍රශංසනීය වේ.








## මැණික් කුවේණ

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය



# අපනයන ක්‍රියාවලිය

කර්මාන්තයට අදාලව කපා ඔපදමන ලද මැණික්, ආනයනික රළු හෝ කපා ඔප දැමූ මැණික් අගය වැඩි දියුණු කළ පසු ප්‍රතිඅපනයනය කිරීම, දියමන්ති, ස්වර්ණාභරණ හා මැණික්/ දියමන්ති ඔබ්බවන ලද ස්වර්ණාභරණ, රළු ගෙවුඩ/ ගෙවුඩ කට්ටා යන ප්‍රභේද ඔස්සේ අපනයන පහසුකම් සලසා ඇත. අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, කටුනායක කාගෝ විලේජ් හි දියමන්ති නිශ්කාෂණ අංශය රත්නපුර දෙමුවාවත ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය - මැණික් කුළුණ තුළ පිහිටුවා ඇති අපනයන සේවා අංශ තුළින් අදාල සේවාවන් ලබාගත හැකිය.



දේශීය මැණික් හා ස්වර්ණාභරණ වෙළඳුන් තමා සතු මැණික් තොග වටිනාකමට සමානව මැණික් වෙළඳ බලපත්‍රයක් ලබාගත යුතු අතර ස්වර්ණාභරණ මෙන්ම මැණික්/ දියමන්ති ඔබ්බවන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය කර අපනයනය කිරීමට අදහස් කරන්නන් ස්වර්ණාභරණ වෙළඳාම / නිෂ්පාදන ලියාපදිංචි සහතිකය ද, ලබා තිබිය යුතුය. මැණික් කැපීමේ ව්‍යාපාරයන් සහ දියමන්ති නිෂ්පාදන කර්මාන්තයේ නියුතු වූවන් ඊට අදාල කැපුම් බලපත්‍ර ලබා සිටිය යුතු වේ. ඉන්පසු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) සහ එකතු කිරීමේ අගයමත බදු (VAT) සඳහා ලියාපදිංචි වීම සිදුකළ යුතුය. අනතුරුව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ භාණ්ඩ නිශ්කාෂණ ක්‍රියාවලියට සම්බන්ධ විද්‍යුත් ලියාපදිංචිය සිදු කළ යුතුය.



අපනයනය කිරීමට අදහස් කරන අයිතමවලට අදාලව වෙන වෙනම සකසා ගත් ඉන්වොයිසිපත් පිටපත් 08 ක් බැගින් අධිකාරියේ අපනයන සේවා අංශය වෙත ඉදිරිපත් කර මැණික් වෙළඳ බලපත්‍රය තහවුරු කර අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි විය යුතුය. අපනයනයන්හි භාරදීමේ කොන්දේසි මත අදාල ඉන්වොයිසිය සකස් කර (පුද්ගලිකව රැගෙන යන අපනයන/ ලියාපදිංචි ගුවන් තැපෑලෙන් හෝ සීඝ්‍රගාමී තැපැල්/ගුවන්බඩු ලෙස) අපනයනය කිරීමට අදහස් කරන මැණික් හා ස්වර්ණාභරණ වෙන වෙනම අයිතම වශයෙන් ඉන්වොයිසියට අදාලව ඉදිරිපත් කළ යුතුය.

අපනයන සේවා අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක (අපනයන සේවා අංශයේ සහ අපනයන අලෙවි) වෙතින් එම අයිතම වල බර, නිවැරදි අයිතම ගණන තහවුරු කරන අතර අදාල අවසර ලබාදීමෙන් අනතුරුව පාර්සලය තාවකාලිකව මුද්‍රාතබා අපනයන මේසය වෙත ඉදිරිපත් කරනු ලබයි. එම අයිතම තක්සේරු මේසය මතදී අධිකාරියේ තක්සේරු/ රත්න විද්‍යාඥ නිලධාරියකු සහ ශ්‍රී ලංකා රේගු මැණික් අංශයේ මැණික් තක්සේරුකරුවෙකු විසින් අපනයනකරු හෝ ඔහුගේ නියෝජිතයා ඉදිරිපිට දී පරික්ෂා කිරීමට ලක්කරයි. ඉන්වොයිසියේ සඳහන් අයිතමවල මිල තක්සේරුව අඩු වැඩි දැයි පරික්ෂා කර බැලීම හා අයිතම අව්‍යාජ ඒවා බවත් අපනයන සඳහා සුදුසු බවත් ඉහත නිලධාරීන් විසින් සහතික කරනු ලැබූ පසු අපනයන පාර්සලය අපනයනකරු ඉදිරිපිටදී ම මුද්‍රාතබා අපනයනය සඳහා සූදානම් කෙරේ. මෙහි දී ඉන්වොයිසියේ නිසිලෙස සඳහන් නොකර වංචාකාරී ලෙස කෘතිම මැණික් අපනයනය කිරීමට උත්සාහ දැරුවහොත් එම මැණික් සියල්ල ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් රාජසන්තක කරනු ලැබේ.

මුද්‍රා තබන ලද පාර්සලය අපනයන සේවා අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක (අපනයන සේවා සහ අපනයන අලෙවි) විසින් නිදහස් කරනතුරු පාර්සලය තමා භාරයේ පවතින බවට අත්සන සහ රබර් මුද්‍රාව තබමින් ඉන්වොයිසියේ පිටපත් 04 අපනයනකරුට නැවත භාරදීමෙන් අනතුරුව, අපනයනකරු විසින් තම අපනයන භාණ්ඩ සඳහා රක්ෂණාවරණයක් ලබා ගැනීම / ගුවන් භාණ්ඩ සඳහා වූ ලියවිලි සකස් කිරීම/ ප්‍රභවස්ථාන සහතික ලබා ගැනීම / කානේ සහතික ලබා ගැනීම සඳහා භාවිත කළ හැකිය. අනතුරුව අපනයන සේවා ගාස්තුව ගෙවීම සිදු කළ යුතුය.

පාර්සලය සම්බන්ධව සියලුම ලියකියවිලි පරීක්ෂාකර බලා ප.ව. 4.00 න් පසුව ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂක(අපනයන සේවා සහ අපනයන අලෙවි) විසින් පාර්සලය ශ්‍රී ලංකා රේගුව වෙත නිදහස් කරුනු ලබන අතර, ගුවන්බඩු ලෙස අපනයනය සිදු කරන්නේ නම් එදින ප.ව. 4.00 න් පසුව අපනයන පාර්සල් නිදහස් කිරීමෙන් අනතුරුව තමාට අයත් ගුවන් සමාගම වෙත ගුවන්බඩු ප්‍රවාහනය කළ හැකිය. තැපැල් මඟින් අපනයනය කරනු ලබන පාර්සල් සතියේ වැඩ කරන දින පහ පුරා දවල් 12.00 වන තෙක් නිදහස් කරනු ලැබේ. පුද්ගලිකව අතේ රැගෙන යන අපනයන එදින ප.ව.4.00 වන විට කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ රේගු අංශය වෙත ප්‍රවාහනය කිරීමට අදාල කටයුතු ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබයි.

අපනයන සඳහා වූ සේවා ගාස්තු අධිකාරිය වෙත අපනයනකරු විසින් ගෙවීම් සිදුකළ යුතුය. මෙහි දී කපා ඔපදැමූ මැණික්/ ස්වර්ණාභරණ සඳහා 0.25% ක සේවා ගාස්තුවක් අයකරනු ලබයි. දියමන්ති සහ දියමන්ති ඔබ්බවන ලද ආභරණ සඳහා දියමන්ති අගයන් කාණ්ඩ අනුව වර්ග කොට ගාස්තු අයකරනු ලබයි. ගෙවුඩ සහ ගෙවුඩ කට්ටා අපනයන සේවා ගාස්තුව 25%ක් අයකරනු ලබන අතර දේශීය කර්මාන්තය තුළ අගය එකතු කර නිම කරන ලද භාණ්ඩ වශයෙන් අපනයනය සඳහා කර්මාන්තකරුවන් දිරිමත් කිරීමත් රළු තත්ත්වයේ මැණික් අපනයනය අධෛර්යමත් කිරීමත් සඳහා මෙම ගාස්තුව අය කිරීමට කටයුතු කර ඇත.



# සේවා ගාස්තු සහන පහසුකම්

මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන් දිරිමත් කිරීම අරමුණු කොට පහසුකම් රාශියක් ලබා දීමට අධිකාරිය පියවරගෙන ඇත. නිරතුරුව විදේශීය රටවල පවත්වනු ලබන මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන වලට සහභාගීවීම/ පුද්ගලික ගැනුම්කරුවන් සඳහා මැණික් හා ස්වර්ණාභරණ ඉදිරිපත් කිරීම/ විදේශීය රසායනාගාර වෙතින් මැණික් පරීක්ෂා කොට සහතිකපත් ලබා ගැනීම සඳහා සේවා ගාස්තු සහන පදනම යටතේ අදාල අපනයන සිදු කර ගැනීමට පහසුකම් සලසා ඇත.



## විදේශීය මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් විදේශීය රටවල පැවැත්වෙන මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන තුළ සංවිධානය කරන " ශ්‍රී ලංකා මණ්ඩපයට" සහභාගීවීමට, අපනයන සංවර්ධන මණ්ඩලය/ විදේශ කටයුතු අමාත්‍යංශය/ සංචාරක මණ්ඩලය/ වාණිජ දෙපාර්තමේන්තුව ආදී ආයතන හරහා මෙන්ම පුද්ගලිකව විදේශීය රටවල මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා සහභාගීවන අපනයනකරුවන් හට මෙම සේවා ගාස්තු සහනය සඳහා ඉල්ලුම් කළ හැකිය. ඉල්ලුම්කරු අධිකාරිය විසින් අපේක්ෂිත කොන්දේසි සපුරා ඇතොත් එකී ඉල්ලීම පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව ඊට අදාලව සේවා ගාස්තු සහනය යටතේ අපනයනය සිදු කිරීමට අවස්ථාව සැලසේ.

එහිදී අපනයන අයිතමයන් නිවැරදිව පරීක්ෂාවට ලක්කරනු ලබන අතර කැරට් 10ට වඩා වැඩි අධික වටිනාකමකින් යුතු මැණික් ගල් වෙන වෙනම ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. අපනයන සඳහා සම්පූර්ණ වටිනාකමින් ප්‍රතිශතයක් අයකිරීම වෙනුවට පරිපාලන ගාස්තුව ලෙස රු. 15,000/- ගාස්තුවක් අධිකාරියට ගෙවිය යුතුය.

අපනයන කරන ලද සියලු භාණ්ඩ සහ/හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවාවලට අදාළව අපනයන ඉපයීම්, අදාල පරිදි භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට, දින එකසිය අසූවක් (180) ඇතුළත අනිවාර්යයෙන් ම ලංකාව වෙත ගෙන්විය යුතුය. එම කාලය ඉක්මවා යාමට ප්‍රථම කාලය දීර්ඝ කරගැනීමට අවශ්‍ය වුවහොත් තම අවශ්‍යතාවය ලිඛිතව ඉදිරිපත් කර තවත් දින 30ක කාලයක් දීර්ඝ කර ගැනීමට හැකියාව ඇත. කෙසේ වුවද අදාල සහන කාලය ඉක්මවීමට ප්‍රථම නැවත පැමිණීමේ දී විකුණූ අයිතම සඳහා 0.25%ක සේවා ගාස්තුවක් අයකරනු ලබන අතර එහිදී අපනයන සිදුකල අවස්ථාවේදී ගෙවන ලද පරිපාලන ගාස්තුව අඩු කිරීමේන් අනතුරුව අදාල සේවා ගාස්තුව අධිකාරිය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය. අදාල අපනයන පාර්සලය සම්පූර්ණ වශයෙන් නැවත පැමිණීමේ දී අධිකාරිය විසින් ඒ සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.

## පුද්ගලික ප්‍රදර්ශක ලෙස ඉදිරිපත් කිරීම

අපනයනකරුවන් හට විදේශීය ගැනුම්කරුවන් වෙතින් පුද්ගලිකව ලැබෙන ඇණවුම් සැපයුම් කිරීමේ දී මෙම ක්‍රමවේදය හරහා සේවා ගාස්තු සහන පහසුකම සලසා ඇත. ඒ සඳහා අපනයනකරු විසින් තමාගේ පුද්ගලික ගැනුම්කරු විසින් කරන ලද ඉල්ලීම (විද්‍යුත් තැපෑල/ වට්ස්ඇප් හරහා) සමඟ තමාගේ ඉල්ලීම ලිඛිතව අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය. අපනයනකරුගේ පෙර අපනයනයන් සහ විදේශ ප්‍රේෂණ සම්බන්ධව අධ්‍යයනය කොට අධිකාරිය විසින් අපේක්ෂිත කොන්දේසි සපුරා ඇතොත් ඉල්ලුම් පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව අදාල සේවා ගාස්තු සහනය සඳහා අනුමැතිය ලබා දේ.

ඉන්පසු අපනයනකරු විසින් අපනයනය කිරීමට අදහස් කරනු ලබන මැණික් හෝ ස්වර්ණාභරණ තොගයේ වටිනාකමින් 0.5% ක් ආවරණය වන පරිදි බැංකු ඇපකරයක් හෝ මුදල් තැම්පතුවක් ආපසු ලබාදීමේ පදනම මත අධිකාරිය වෙත තැම්පත් කොට අදාල අපනයන සේවා කටයුතු සිදු කර ගැනීමට අවස්ථාව සලසා ඇත.

අපනයන සිදු කරන දිනදී අපනයන අයිතමයන් නිවැරදිව පරීක්ෂාවට ලක්කරනු ලබන අතර කැරට් 10ට වඩා වැඩි වටිනාකමින් යුත් මැණික්ගල් වෙන වෙනම ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. මැණික් හා ස්වර්ණාභරණ අපනයන පාර්සල් සීමා රහිත අපනයන වටිනාකම් යටතේ වුවද අධිකාරියේ අපනයන සේවා අංශය වෙත ඉදිරිපත් කොට ඊට අදාල පරිපාලන ගාස්තුව ලෙස රු.15,000/- ක මුදල ගෙවීමෙන් අනතුරුව අපනයන කටයුතු සිදු කිරීමට අවස්ථාවක් සලසා ඇත.

අපනයනය කරන ලද සියලු භාණ්ඩ සහ/හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවාවලට අදාලව අපනයනය ඉපයීම්, අදාල පරිදි භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට දින එකසිය අසූවක් (180) ඇතුළත අනිවාර්යයෙන් ම ලංකාව වෙත ගෙන්විය යුතුය. එම කාලය ඉක්මවා යාමට ප්‍රථම කාලය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය වුවහොත් තම අවශ්‍යතාවය ලිඛිතව ඉදිරිපත් කර තවත් දින 30ක කාලයක් දීර්ඝ කර ගැනීමට හැකියාව ඇත. කෙසේ වුවද අදාල සහන කාලය ඉක්මවීමට ප්‍රථම නැවත පැමිණීමේ දී විකුණුම් අයිතම සඳහා 0.5% ක සේවා ගාස්තුවක් අයකරනු ලබයි. අදාල අපනයන පාර්සලය සම්පූර්ණ වශයෙන් නැවත පැමිණීමේ දී අධිකාරිය විසින් ඒ සඳහා රු.3,000/- ගාස්තුවක් අය කරනු ලබයි.





## විදේශීය රසායනාගාර වෙතින් පරීක්ෂා කොට සහතිකපත් ලබා ගැනීම.

අපනයනකරු විසින් විදේශීය රසායනාගාරයක් වෙතින් මැණික් පරීක්ෂා කොට සහතික පත්‍ර ලබා ගැනීමට අවශ්‍ය අවස්ථාවක දී ඉහත සහනය ලබාගත හැකිය. මෙහි දී අදාල අධික වටිනාකමකින් යුත් මැණික් (කපා ඔපදැමූ/රළු තත්ත්වයෙන්) අපනයනය කිරීමේ පහසුකම සලසා ඇති අතර ඉතා ඉහළ වටිනාකමක් සහිත මැණික්වල තත්ත්වය ඉහළ දැමීමට විදේශීය මැණික් රසායනාගාර සහතික පත්‍රය අගය එකතු කිරීමක් සිදු කරනු ලබන හෙයින් ඉහත අවස්ථාව මඟින් දේශීය අපනයනකරුවාට ජාත්‍යන්තරව පිළිගත් විදේශීය රසායනාගාර ඔස්සේ තම සේවාව ලබාගැනීමට මග පෑදී ඇත.



තම අවශ්‍යතාවය අධිකාරියවෙත ලිඛිතව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඊට අදාල කොන්දේසි සපුරා ඇතිද යන්න සලකා බලා උක්ත පහසුකම සඳහා අනුමැතිය ලබා ගත හැකිය. මෙහිදී එක් එක් මැණික් ගල් වෙන වෙන ම ඉන්වොයිසිපතෙහි සඳහන් කිරීමට අපනයනකරු විසින් කටයුතු කිරීමත් සිදුකළ යුතුය.



අපනයන සිදු කිරීමේ දී එක් මැණික් ගලක් වෙනුවෙන් රු.1,000/- ක් බැගින් පරිපාලන ගාස්තුවක් අධිකාරිය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය. අපනයන සිදු කළ දින සිට දින 180ක කාලයක් ඇතුළත අපනයනය නැවත පැමිණිය යුතු අතර උක්ත මැණික් ගල් නැවත පැමිණීමේ දී මැණික් පරීක්ෂා කිරීමේ සහතික පත්‍රයෙහි මුල්පිටපත සමඟ අධිකාරිය වෙත ඉදිරිපත් කොට තහවුරු කර තමාගේ නැවත පැමිණි පාර්සලය නිදහස් කර ගැනීමට කටයුතු කළ යුතුය.

විදේශීය රසායනාගාර ඔස්සේ මැණික් පරීක්ෂා කිරීම සහ සහතික පත්‍ර ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කළ අපනයනයට අදාල මැණික් කිසියම් අවස්ථාවක දී විකිණීමට භාජනය වුවහොත් එම විකුණූ අයිතම සඳහා වටිනාකමින් 1% ක සේවා ගාස්තුවක් අධිකාරිය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

ගෝලීය විවෘත ආර්ථිකයේ ප්‍රධානතම සැපයුම්කරුවා ලෙස මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය එක් කිරීමටත්, ලෝකයේ නිල් මැණික් අතර ප්‍රමුඛස්ථානයේ සිටින ශ්‍රී ලංකාව ඉදිරියේ දී ප්‍රධානම සැපයුම්කරුවා ලෙස නිල් මැණික් මුල් කරගත් වෙළඳපළක් ඇති "ප්‍රධානම වෙළඳ මධ්‍යස්ථානය" කිරීමටත් අපනයන වෙළඳපොළ සමඟ තරඟකාරී අයුරින් කටයුතු කිරීමටත් අවශ්‍ය පියවරයන්, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී නවීන් සූරියාරච්චි මහතාගේ මෙහෙයවීමෙන් මේ වන විට සකස් කරමින් සිටින බව සඳහන් කළ යුතුය.

අපනයන සේවා පහසුකම් ලබා ගැනීම සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ කොළඹ ප්‍රධාන කාර්යාලයේ අපනයන සේවා අංශය (011 233 7693/071 383 3980), කටුනායක කාගෝ විලේජ්හි දියමන්ති නිශ්කාෂණ අංශය (011 225 2203/071 238 5591), දෙමුවාවත ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය/ මැණික් කුළුණ අපනයන සේවා අංශය (045 205 0832/ 071 384 1253) විමසීමෙන් වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.







අනෝමා වෙරලුපේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අපනයන සේවා සහ අපනයන අලෙවි)
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,
දෙමුවාවත ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය,
අංක 16, මැණික් කුළුණ,
නගර සභා පෙදෙස,
රත්නපුර.


දුරකථන (සෘජු) - 0452050832/(ජංගම) - 071 3841253
විද්‍යුත් තැපැල් -
gemexpo@ngja.gov.lk/weralupea@gmail.com
වෙබ් අඩවිය - www.ngja.gov.lk


මහගෙදර
හදන ගෙදරට හැමදේම තියෙන තැන
මහගෙදර
Dulux
S-Lon
ACL
CITY ELECTRICAL & HARDWARE (PVT) LTD.
No.68, Sri Pada Mawatha, Ratnapura. Tel: 045 2222483, 045 2222000 Fax: 045 2222000


WG
WARUNA GEMS
BATUHENA, KURUWITA
077 991 5008
071 718 0537


SABARAGAMUWA
enterprises
holdings (Pvt)Ltd
Sabaragamuwa Enterprises Holdings (PVT)Ltd.
184/9/3, Nawala Road, Nugegoda
045 22 26 254
071 34 46 644
Metal
Crushers
Gem
Dealers &
Exporters
Heavy
Vehicles
&
Heavy
Equipments

# ජීවිත ගිල දමන මුඛ පිළිකාව



ශ්‍රී ලංකාවේ පුරුෂයින් අතර සුලබතම පිළිකා තත්ත්වය ලෙස මුඛ පිළිකා හැඳින්විය හැක. මෙයට ප්‍රධානතම හේතු ලෙස බුලත්විට හැපීම හා මත්පැන්/දුම්වැටි පානය වැනි අයහපත් සෞඛ්‍ය පුරුදු බලපාන බව පර්යේෂණ මඟින් තහවුරු වී ඇත.

ආසියානු ප්‍රජාව අතර දුම්කොළ සහිත බුලත්විට හා පුවක් සපනු ලබන පුද්ගලයින් බහුලව දක්නට ලැබේ. ගෝලීය වාර්තා අනුව මිලියන 600ක් පමණ පුද්ගලයින් දුම්කොළ, මධ්‍යසාර, කැෆේන් අඩංගු පාන වර්ග පරිභෝජනය හා පුවක් සැපීම පොදු පුරුද්දක් ලෙස සිදු කරනා බව තහවුරු වී ඇත. එසේ ම දුම්පානය හා දුම්කොළ භාවිතය කාන්තාවන්ට සාපේක්ෂව පිරිමින් අතර සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී.

දුම්කොළ භාවිතය පිළිකා සඳහා වඩාත්ම වැදගත් අවදානම් සාදකයක් වන අතර ගෝලීය වශයෙන් සෑම වසරකම පිළිකා මරණ වලින් 20% කට වඩා වැඩි ප්‍රමාණයකට හේතුවනුයේ දුම්කොළ ආශ්‍රිත නිශ්පාදන පරිභෝජනයයි.

එසේම මධ්‍යසාර අධික ලෙස භාවිත කිරීම නිසා මුඛය, උගුර, ස්වරාලය, අක්මාව හා පියයුරු ආශ්‍රිත පිළිකා තත්ත්වයන් වර්ධනය විය හැකි බව පර්යේෂණ මඟින් සනාත වී ඇත.

අප සමාජයේ බොහෝ පුද්ගලයින් අතර බුලත්විට සැපීම පිළිබඳ මිත්‍යා විශ්වාසයන් රැසක් පවතී. ඒ අතරින් " බුලත්විට සැපීම මඟින් නිදිමත පාලනය කළහැකි බව, තනිකම නැතිවන බව, මුඛයේ දුගඳ පාලනය වන බව හා මානසික ආතතිය අඩුවෙන බව" යන විශ්වාසයන් නිසා බොහෝ පුද්ගලයින් බුලත්විට සැපීම සිය විනෝදාංශය බවට පත්කරගෙන ඇත. නමුත් දිගුකාලීනව සිදු කරන මෙම අයහපත් පුරුදු මඟින් මුඛ සෞඛ්‍ය පිරිහීමට ලක්වන අතරම එමඟින් පිළිකා තත්ත්වයක් ඇති වුවහොත් ඔබගේ දෛනික ජීවිතයේ කටයුතු අවුල්සහගත වීම මෙන් ම මානසික අවපීඩනයට ද ලක්විය හැක.

**මුඛ පිළිකාවේ රෝග ලක්ෂණ,**

1. සති දෙකකට වැඩි කාලයක් මුඛයේ පවතින සුව නොවන තුවාලයක්.
2. මුඛයේ ඇතිවෙන වර්ධක තත්ත්වය (GROWTH / LUMP ) හෝ සුදු පැහැති ලප.
3. ගිලීමේ අපහසුතා, සැපීමේ අපහසුතා හා දිව සෙලවීමේ අපහසුතා.
4. දත්වල ඇතිවෙන අසාමාන්‍ය සෙලවීම්.
5. උගුරේ හෝ මුඛයේ යමක් සිරවී හෝ පැටලෙන සුළු සන්වේදී තාවය.
6. දිවෙහි හෝ මුඛයේ ඇතිවෙන හිරිවැටීම්.



## සිතන්නට යමක්

**බුලත් විටක මිල = රු. 50/-**
**දිනකට විට තුනක් මිල දී ගැනීමට = රු. 150/-**
**සතියකට 150x7 = රු. 1050/-**
**මාසයකට වියදම 1050x4 = රු. 4200/-**
**අවුරුද්දකට වියදම = රු. 50400/-**

**මෙම ප්‍රධාන ලක්ෂණ වලට අමතරව,**

1. ගෙලෙහි වසාගැටිති දිගු කාලීනව ඉදිමීම.
2. මුඛය ඇරීමට අපහසු වීම.
3. දත් ගැලවීමෙන් පසු තුවාල සුව වීමට මාසයකට වඩා ගත වීම.
4. කටහඬෙහි එකවර වෙනස්වීම් ද සිදු විය හැක.




**මුඛ පිළිකා වලක්වා ගැනීමට නම්,**

1. බුලත්විට සැපීම හා දුම්පානය වැනි අහිතකර සෞඛ්‍ය පුරුදු වලින් මිදීම.
2. ස්වයං මුඛ පරීක්ෂාව මාසයකට වරක්වත් සිදු කිරීම.
3. මුඛයේ අසාමාන්‍යතාවයක් දැනෙන්නේ නම් වහාම වෛද්‍ය උපදෙස් ලබා ගැනීම.
4. ඔබගේ සමීපතමයන් දුම්පානයෙන් හා බුලත්විට සැපීමෙන් මුදවා ගැනීම සඳහා දැනුවත් කිරීම.
5. දරුවන් පාසල් අවදියේ දී දුම්පානය, බුලත්විට සැපීම වැනි අයහපත් චර්යාවන්ට යොමුවිය හැකි බැවින් දෙමාපියන් ලෙස ඔවුන් පිළිබඳ අවධානයෙන් සිටීම.





A.D.U.DHARMASIRI.
NURSING OFFICER
TEACHINE HOSPITAL RATNAPURA.
RN/RNM/BSC (HONS) in Nursing [OUSL]/MSC in Nursing [OUSL]/Dip in psychology


TATTOO



# ව්‍යාපාරික සාර්ථකත්වය සඳහා මගපෙන්වීම

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය හමුවේ, සුළු හා මධ්‍යපරිමාණ ව්‍යාපාර (SMEs) සඳහා තාක්ෂණික නව්‍යකරණය, නව ව්‍යාපාර ප්‍රවණතා හා ආර්ථික දත්ත සලකා බැලීම මඟින් දිගු කාලීනව වෙළඳපොල තුළ ස්ථායි වීමට හැකියාවක් ඇති බව පෙනී යන බැවින්, මෙම ලිපිය, නව ප්‍රවණතා, ආර්ථික තත්ත්වය මත ආරම්භ කරන ව්‍යාපාරයක් දිගුකාලීනව සාර්ථකව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශය ලබා දීමේ අරමුණින් සම්පාදිත වේ.

ලෝකයේ වෙනත් රටවල් මෙවැනි ආර්ථික අවපාතයන්ට මුහුණ දුන් අවස්ථාවල දී ඒවායෙන් මිදීම සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති හා උපක්‍රම සැලකිල්ලට ගැනීම අත්‍යවශ්‍යය. එවැනි තත්ත්වයන් තුළ දී,

- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්/ ව්‍යවසායකයින් දිරිගැන්වීම හා ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් පහසු කරලීම.
- දේශීය අමුද්‍රව්‍ය භාවිතය ඉහළ නැන්වීම හා ඒ මත පදනම් වූ කර්මාන්ත නගා සිටුවීම.
- ආදායම් බෙදියාමේ විෂමතාවය අඩු කිරීම සඳහා රැකියා උත්පාදන ආයෝජන මාර්ග සහිත ශ්‍රම සූක්ෂම නිෂ්පාදන ක්‍රම දිරි ගැන්වීම.
- දේශීය ආනයන ආදේශක භාණ්ඩ පරිභෝජනය දිරිගැන්වීම හා ඒ සඳහා යොමු වූ නිෂ්පාදකයින්/ ව්‍යවසායකයින් දිරිගැන්වීම.

යන ආකාරයේ ව්‍යවසායකත්ව සම්බන්ධ උපාය මාර්ග අනුගමනය කර ඇත. පසුගිය වසර කිහිපය දී ශ්‍රී ලංකාවේ හා විශේෂයෙන් ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාපාරික අවස්ථා හා ඒ සඳහා යොමු වූ ව්‍යවසායකයින් හඳුනාගත හැකි විය. ඔවුන් බොහොමයක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වන අතර ඒ සඳහා උදාහරණ අවශ්‍ය ප්‍රමාණයක් ඔබටද මතක් වනු නොඅනු මානය. එම ව්‍යාපාරික ස්ථාන වල ජීව කාලය නැතහොත් ව්‍යවසායකයින් වෙළඳපොළ තුළ රැඳී සිටි කාලය ද සිතා බලන්න. ඒවා බොහොමයක් සතියක් මාසයක් හෝ වැඩිම වුවහොත් මාස තුනක් අතර කාලයක් තුළ වැසී ගිය ඒවා වනු ඇත. මෙම තත්ත්වය තුළින් අප අවබෝධ කරගත යුත්තේ ව්‍යාපාරික අවස්ථා පැවතියද ඒවා හඳුනාගත්ත ද ඒ සඳහා ආයෝජනය කළ ද ඒ සෑම අයෙකුම ඉතා වැදගත් යම් දෙයක් හඳුනා නොගෙන හෝ හඳුනා ගැනීමට අපොහොසත් වී ඇති බවය.

විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි රටවල සාමාන්‍ය අධ්‍යාපනය තුළින් ලබා දෙන දැනුම තුළදී ද මූලිකම ව්‍යාපාරික ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන මතුපිටින් හඳුනා ගැනීම පමණක් අවබෝධ කරගනී. එහිදී මගහැරී යන ප්‍රධාන කරුණු කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

- ඒවායේ ප්‍රායෝගික ගැඹුරුතම අධ්‍යයනය නොකිරීමත් ව්‍යාපාරික තීරණ ගැනීමේ දී වෙළඳපොළ යතාර්ථයන් හඳුනා නොගැනීම.
- නිෂ්පාදනයේ පිරිවැය හා මිල විශ්ලේෂණයන් නොකිරීම.
- දිගුකාලීන ආයෝජන අවස්ථාවන් කෙටි කාලයක දී ලාභ උපරිම කර ගැනීමේ මට්ටමට යාමට උත්සාහ කර ගැනීම.
- ව්‍යාපාර ජීවන චක්‍රය පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම.
- තමන්ට ව්‍යවසායකත්ව දක්ෂතා නොමැති වුවත් වෙනත් අයෙකු දියුණුවීම දැකීම තුළින් එවැනි සමජාතීය නිෂ්පාදන සඳහා යොමු වීම.

## ඔබගේ ව්‍යාපාරික අත්දැකීමත් මෙවැනි ද !!!

ඔබගේ හෝ ඔබ දන්නා අයෙකුගේ අසාර්ථක වූ ව්‍යවසායකත්ව (ව්‍යාපාරික) අවස්ථාවක් හොඳින් අධ්‍යයනය කළ විට ඔබට ද මෙය ප්‍රත්‍යක්ෂ වනු ඇත. මේ පිළිබඳව දැනුවත් නොවන තාක්කල් හතු පිපෙන්නාක් මෙන් ව්‍යාපාර ජනිත වනු ඇත. එසේම ඒවායේ ජීව කාලය ද දිගු නොවනු ඇත. මේ අනුව දිගු කාලීන ව්‍යාපාරික සාර්ථකත්වයට සැලසුම්සහගත සහ අලුත් නවෝත්පාදන කෙරෙහි වැඩි අවධානය යොමු කළ යුතුය. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්, නව තාක්ෂණයන් සහ මුදල් කළමනාකරණ භාවිතයෙන් ඉදිරියට ගමන් කළ යුතුය.



පී.ඒ. වෙනුර චන්දික
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (වාණිජ/ තාක්ෂණ)
සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# විද්‍යානුකූල මැණික් කපා ඔපදැමීම

ලෝකයේ මැණික් කැපීමේ පරමාර්ථය වසර දහස් ගණනක ඉතිහාසයකට උරුමකම් කියයි. ජන ව්‍යවහාරයේ දී " මුක්කරු" යනු දුර අතීතයේ දී මැණික් වෙළඳාම පිණිස මෙහි පැමිණි ඉසුරුමත් අරාබියානු මැණික් වෙළෙන්ඳන් ය. එසේත් නැතිනම් ඉන්දියාවේ පැලපදියන්ව සිටිමින් ලංකාවට මැණික් වෙළඳාමෙහි පැමිණි අරාබියානුවන් ය. ඔවුන් මැණික් ගල් ලී වල අතුල්ලා ඔප දමා මැද සිදුරක් සාදා අමුණා පැළදීමට සකස් කර ඇත.

ඉන් අනතුරුව හනපෝරුව නමින් හඳුන්වන දේශීය කුඩා යන්ත්‍රයක් මඟින් මැණික් කපා ඔපදමා ගන්නා ලදී. ඊටත් පසුව බංකු පටලය නමින් හඳුන්වන ලද යන්ත්‍රයක් මඟින් කපා ඔපදැමීම සිදුකර ගන්නා ලදී.

ඒවා නියමිත කෝණ වලට අනුව ඔපදැමීමක් සිදු නොවුනු බැවින් වඩාත් දීප්තියක් ලබා ගැනීමට හැකියාව ලැබී නැත.

ඉන් අනතුරුව ජපන් තාක්ෂණයෙන් නිමැවු ඉමහෂි යන්ත්‍රයත් කොරියන් තාක්ෂණයෙන් නිමවු කොරියන් යන්ත්‍රයත් ඊශ්‍රායල් තාක්ෂණයෙන් නිමවු ඊශ්‍රායල් යන්ත්‍රයත් ඇමරිකන් තාක්ෂණයෙන් නිමැවු ග්‍රේවුස් යන්ත්‍රයත් ලෝකය පුරා ව්‍යාප්ත විය. ඊට අමතරව මේ වනවිට පරිගණක යන්ත්‍රය ආධාරයෙන් එක්වර මැණික් ගල් කිහිපයක් කපා ගැනීමට ද හැකියාව පවතී.

විද්‍යානුකූල මැණික් කපා ඔප දැමීම යනුවෙන් අදහස් කරන්නේ මැණික් ගලක් නියමිත ප්‍රමාණයෙන් සහ නිවැරදි කෝණ වලින් කපා ඔපදැමීමයි.





හනපෝරුව



ග්‍රේවුස් යන්ත්‍රය




ඉමහෂි මැණික් කපන යන්ත්‍රය

**මැණික් ගලක් කපා ඔපදැමීමේ දී පිළිපැදිය යුතු කරුණු 04 කි. එය 4C නමින් හඳුන්වනු ලැබේ.**

# 4C

- COLOUR - පාට
- CLARITY - පැහැදිලි බව
- CUT - කැපීම
- CARATE - බර

## COLOUR පාට




මැණික් ගල් ස්වභාවයෙන් ම ඒක වර්ණී හෝ ද්වි වර්ණී ගණයට ඇතුළත් වේ. ද්වි වර්ණී මැණික් ගල් ජනවහරයේ දී වාක්කුව සහිත මැණික් ගල් ලෙස හඳුන්වනු ලැබේ. කොරොන්ඩම් වර්ගයේ ගල් වාක්කුව සහිත මැණික් බැවින් හොඳ පාට පෙනෙන පැත්ත 100%ක් ම මුහුණතට හරවා කැපිය යුතුය.

## CLARITY පැහැදිලි බව




මැණික් ගලේ පැහැදිලි බව මෙයින් අදහස් වේ. මැණික් ගලේ දෝෂ හඳුනාගත යුතුය.
පැලීම්, තරාසම් හා බුබුළු, ගල් වල ඇති දෝෂ වේ. මෙම දෝෂ මැණික් ගලේ නොතිබීම ගලේ වටිනාකමට හේතු වේ.

## CUT කැපීම

මැණික් ගලේ හැඩය හා ප්‍රමාණය තීරණය කර ගැනීමේ දී වඩා දිගින් හා පළලින් නොවැඩි නොවන ආකාරයෙන් සකසා ගතයුතුය. මැණික් ගලක් උසස් ප්‍රමිතියෙන් කැපීම සඳහා නියමිත කෝණ වලින් පට්ටම් යොදාගත යුතු වේ. මැණික් ගලේ උස 65% - 70% අතර රඳවා තබාගනිමින් කපා ඔපදැමීම තුළින් වැඩි දීප්තියක් ලබා ගැනීමට හැකියාව ඇත.




ඔප දැමීමෙන් පසු සම්පූර්ණ මැණික් ගලේ උසින් 1/3 ක් ගලේ මුහුණතට හා උසින් 2/3 ක් අඩියට ද වනසේ සකසා ගතයුතුය. රොන්දේසිය 2% ක් පමණ වනසේ තබාගත යුතුය.

## CARAT බර




මැණික් ගලට උපරිම බරක් ඉතිරිවන පරිදි ගැලපෙන කැපුම් රටාව යොදා ගනිමින් බර බේරාගත යුතුය.



සංජීව ප්‍රියන්ත ෆොන්සේකා
අධ්‍යක්ෂ
රුවන්පුර ෆැසට් පුද්ගලික සමාගම
සිලෝන් සෆයාර් මයිනින්ග් පුද්ගලික සමාගම
සිලෝන් ෆැසට් ආයතනය

# CEYLON SAPPHIRE MINING PVT LTD.








## RALIABLE AND ECO - FRIENDLY SCIENTIFIC GEM MINERS

045 313 60 90 | CLARANDAN ESTATE, HIDELLANA, RATNAPURA, SRII LANKA | ceylonsapphiremining@gmail.com



Ratnapura Railway Station in 1970



Sri Padaya 1890




Ratnapura Town 1910

# OLD
## Ratnapura


VISION CARE
OPTICAL SERVICES

## රත්නපුර ශාඛාවෙන්

අතිනවීන උපකරණ භාවිතයෙන් දෘෂ්ඨි පරීක්ෂාවන් සහ
ඔබට අවශ්‍ය සියළුම වර්ගයේ


**ඇස් කණ්ණාඩි | අව් කණ්ණාඩි**
**සිවි කාච | ශ්‍රවණාධාර**
**විශේෂඥ අක්ෂි වෛද්‍ය සේවය**
**ජංගම අක්ෂි සේවය** (ආයතනික සේවකයින් සඳහා)

අමතන්න **077 261 3332**



විෂන් කෙයා ඔප්ටිකල්ස් පුද්ගලික සමාගම
අංක 384, කොළඹ පාර, රත්නපුර.
☎ 045 222 5021

# දෙමාපිය හැසිරීම් නිසා දරුවන් ගොදුරු වන මානසික තත්ත්වයක් ගැන කියවෙන උපුල්ගේ කතාව



## සොරකම් කිරීමට සහ බොරු කීමට පුරුදු වූ දරුවෙකි. Conduct Disorder

උපුල්ගේ වයස අවුරුදු 12 යි. කොළඹ ප්‍රධාන පාසලක ඉගැනුම ලබන උපුල්, අප වෙත යොමු කරණු ලැබුවේ ඔහුගේ පියා විසිනි. ඔහුගේ පියා උපුල් ගැන අපට මෙසේ පැවසුවා. දැනට අවුරුද්දකට වැඩි කාලයක් තුළ ඔහුගේ හැසිරීම හරිම ප්‍රචණ්ඩකාරී බව තමාට අවබෝධ වූ බවත් උපුල් තමාට හෝ මවට කිසිසේත් ම කීකරු නැති බවත්ය. ඉතාමත් කුඩා දෙයකින් වුවද දැඩි ලෙස කෝපයට පත්වන උපුල් අතට හසුවන ඕනෑම දෙයකින් මවට හෝ තමාට පහර දෙන බවත් ඔහුගේ පියා වැඩිදුරටත් ප්‍රකාශ කළා. ඉතාම ආසන්න සිද්ධියක් ලෙස ඔහුගේ පියා ප්‍රකාශ කළේ, දිනක් තමා ගෙදරින් බැහැරව වැඩ කිරීමට කාර්යාලයට ගිය අතර තුර උපුල් දුරකථනයෙන් මෙසේ පැවසූ බවයි.

" තාත්තා අද 05 වන විට ගෙදර එන්න. නැත්තම් මම කරන දේ බලාගන්න පුළුවන්."

උපුල් මෙසේ තම පියාට තර්ජනය කළේය. නමුත් එදින සවස 05 වන විට ගෙදර පැමිණෙන්නට නොහැකි විය. ඔහු පැමිණියේ සවස 06 ට පමණය. මෙයින් තද කෝපයට පත් උපුල් තමාට පරුෂ වචනයෙන් බැණ වැදී නිවස තුළ තිබූ පියාගේ ටයිප්රයිටරයත්, කොම්පියුටරයත් පොළවේ ගසා විනාශ කර දැමීය. එයින් රුපියල් ලක්ෂයකටත් වැඩි අලාභයක් සිදු වූ බව පියා අප සමඟ පැවසීය.

උපුල්ගේ මව ඔහුගේ ගෙදර පරිසරය ගැන අප සමඟ මෙසේ පැවසූවා ය.

" උපුල්ට හරියට තරහා යනවා. එයාට එයාගේ තරහ පාලනය කරගන්න බැහැ. අතට හසුවන ඕනෑම දෙයක් එයා විසිකර දමනවා. මටත් නිතරම පරුෂ වචනයෙන් බනිනවා. ඒ විතරක් නෙමෙයි උපුල් නිතරම පංති කාමරයේදීත් ප්‍රශ්න නිර්මාණය කර ගන්නවා. පුතා එයාගේ යාළුවන් සමඟ නිතරම ගුටිබැට හුවමාරු කර ගන්න නිසා ගුරුතුමිය එයාව යම් දුරකට පංතියෙන් කොන්කර සිටිනවා. එනම් වැඩ නොකරන කිහිපදෙනා අතරට මගේ පුතාවත් එකතු කර තිබෙනවා. ඒ විතරක් නෙමෙයි, පුතාට සතුන් කෙරෙහිත් කිසිම ආදරයක් නැහැ. අපේ ගෙදර මාළු ටැංකියක් තියෙනවා. සමහර වෙලාවට ඒකෙ ඉන්න මාළුවන් තද කරගෙන ඉන්නවා. සමහරවිට ඒ මාළු මැරෙනවා. එහෙම උනාම උපුල්ට හරිම සතුටුයි. ඒ බව එයාගේ මුහුණෙන් ම පේනවා. පුතා මගෙන් හෝ පියාගෙන් මුදලුත් සොරකම් කරනවා. මෙසේ සොරකම් කරගත් මුදල් වලින් පංතියේ අනෙක් මිතුරන් සමඟ සිගරට් බීමට පුරුදුව සිටිනවා. දිනක් උපුල් දින කිහිපයකට ම ගෙදරින් අතුරුදන් වී සිටියා. සොයා බලන විට අපට දැනගන්නට ලැබුණේ තවත් යහළුවන් කිහිප දෙනෙක් සමඟ කතරගම ගිහින් තිබූ බවයි. මෙසේ විටින් විට ගෙදරින් පැන යාම උපුල්ගේ සිරිතක් බවට පත්වුණා. උපුල්ට බොරු කීමට කිසිම ගානක් නැහැ. නමුත් උපුල් බොරු කියන බව ගෙදර අයත්, පිටස්තර අයත් දැනගෙන සිටිනවා."



## උපුල්ගේ ගුරුතුමිය පැවසූ දේ.

" උපුල්ට පංති කාමරයේ දී මම දෙන කිසිම පාඩම් වැඩක් කරන්නෙ නැහැ. ඔහු යහළුවන් සමඟ පංති කාමරයෙනුත්, පාසලෙනුත් පිටවී නොයෙක් තැන්වල ඇවිදිනවා. මම කොතරම් අවවාද කරත් ඉන් ඵලක් වූයේ නැහැ. පසුව මම තේරුම් ගත්තා ඔහුට අවවාද කිරීමෙන් ඵලක් නොවන බව."




## උපුල් අප සමඟ පැවසූ දේ.

" මගේ තාත්තා ව්‍යාපාරිකයෙක්. තාත්තා උදේ පාන්දර දැක්කට පසුව ආයෙත් මම ඔහුව දකින්නේ රාත්‍රී අටට, නවයට. තාත්තට එයාගේ ම ව්‍යාපාරවල නියැලෙනවා මිස අපිත් එක්ක ගත කරන්නවත් වෙලාවක් නැහැ. තාත්තා ගෙදර එනවිට හරිම මහන්සියෙන් එන්නේ. ඔහුට හරියට කේන්ති යනවා. මව සමඟ නිතර ප්‍රශ්න ඇති කර ගන්නවා. ඒ වගේම ඇයට බැණ වදිනවා. අම්මත් බොහෝ දින වල ගෙදර හිටියෙ නැහැ. ඇයටම අයිති බියුටි සැලෝන් එකක් තිබුණා. ඇය එහි වැඩ කටයුතු බලන්න ගිය විට ආපසු එන්නේ සවස 5ට විතර. මට නිතරම හිතෙන්නේ මට තාත්තත් නැහැ අම්මත් නැහැ කියල.

මම දන්නවා මට ඕනෑම දෙයක් අරන් දෙනවා කියලා. මට කිසිම දේක අඩුපාඩුවක් නැහැ. ඒත් මම ආසයි තාත්තා එක්ක කතා කරන්න. ගමන් බිමන් යන්න. මට එවැනි අවස්ථාවක් ලැබුණේ ඉතාම කලාතුරකින්. අම්මා හිටියේ වෙනම ලෝකෙක. අම්මට මගේ හැඟීම් ගැන, පාසලේ කටයුතු ගැන අවබෝධයක් තිබුණේ නැහැ කියලයි මට හිතෙන්නේ. අම්මට තිබුණු විනෝදාංශය තමයි ටීවී බලන එක. එවිට ඇයට මම ඉන්නවද කියලවත් ගානක් නැහැ. ඉතින් මට ටිකෙන් ටික දැනෙන්න පටන් ගත්තේ මම පවුලේ සාමාජිකයෙක් නෙමෙයි කියලා. මට කවුරුවත් නැහැ කියලත් දැනෙන්න ගත්තා. මට හරියට කේන්ති යනවා. ඉතා කුඩා දේකට පවා මට කේන්ති යනවා. මට ඕනෑම දෙයක් අවශ්‍ය වුණොත් මම ඉල්ලනවා. තාත්තා එක දවසක් හෝ ලබා දීම කල්දැමුවහොත් මට පුදුම තරහක් ඇති වෙනවා. මට තාත්තගෙන් පළිගැනීමේ චේතනාවකුත් එනවා. මට ඕනෑම දෙයක් කරන්න අසීමිත නිදහස තියෙනවා.  මට කාගෙන්වත් බාධාවක් නැහැ. ඒත් මට නිතරම දැනෙන්නේ සහ හැඟෙන්නේ මට කවුරුවත් නැහැ කියලා."

## අපි උපුල්ගේ දෙමාපියන්ගේ හැසිරීම් රටාවන් තේරුම් ගනිමු.

නිසි ආදරය හා අවධානය අඩු පරිසරයක දරුවාට අසීමිත නිදහසක් ලබා දීම මෙවැනි දෙමාපියන්ගේ ලක්ෂණ.



1. දරුවාගේ හැසිරීම හා ක්‍රියාවන් පිළිබඳව ප්‍රමාණවත් සොයා බැලීමක් නොතිබීම.
2. දරුවාගේ හැඟීම පිළිබඳ අවබෝධයක් නොතිබීම.
3. දෙමාපියන් ගන්නා සෑම තීරණයකටම දරුවාගේ අනුමැතිය ලබා ගැනීම.
4. දරුවා සතුටු කිරීමට ඔවුන් කැමති ඕනෑම දෙයක් ලබා දීම.
5. දෙමාපියන් අතර සම්බන්ධතාවයන් අඩු නිසා ගෙදර තුළ තමා ආගන්තුක ලෙස තමාට දැනීම.
6. දරුවාට තම පවුල තුළ සාමාජිකයෙක් ලෙස නොදැනීම.

## දෙමාපියන් සමඟ නිසි සම්බන්ධතාවයක් නොමැතිකම නිසා දරුවෙකුට ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල.

1. හැඟීම් පාලනය කර ගැනීමට ඇති අපහසුතාවය.
2. නොමේරූ සිතුවිලි ඇති වීම.
3. වගකීමක් භාර ගැනීමට ඇති නොහැකියාව.
4. තමාට අවශ්‍ය දේ නොලැබුණු විට දෙමාපියන් සමඟ කෝපයට පත්වීම හා රණ්ඩුවලට පැටලීම.
5. නිදහස් ලෙස තීරණ ගැනීමට නොහැකි වීම.
6. දෙමාපියන්ට බලපෑම් කිරීම.
7. මානසික ආතතියට සහ මානසික අවපීඩනයට ගොදුරු වීමේ හැකියාව.



Dr. N. Kumaranayake
Professional Clinical Psychiatrist,
Life Center, Kohuwala.



# සපරගමු මහ සමන් දේවාල බිමේ ඇති පෘතුගීසි නිර්මාණ

ඓතිහාසික සපරගමු පළාතට ආරක්ෂාව සලසන සුමන සමන් දෙවියන් පිළිබඳ පළාත්වාසී, ලංකාවාසී බෞද්ධයන් තුළ ඇත්තේ නොමඳ ගෞරවයකි. බෞද්ධ දෙවියෙකු වශයෙන් පිළිගැනෙන සුමන සමන් දෙවියන් වෙනුවෙන් ඉදිකළ දේවාල අතුරින් රත්නපුරයේ සපරගමු මහ සමන් දේවාලය ප්‍රධාන තැන්හිලා සැලකේ. දඹදෙණි යුගයේ පටන් පැවත එන මෙම දේවාලය විනාශයට පත්කොට එතැන බලකොටුවක් හා දේවස්ථානයක් ඉදිකරවීමට පෘතුගීසීන් විසින් කටයුතු කරන ලදී. පසුකලෙක එම ස්ථානයේම මහා සමන් දේවාලය ඉදිකරනු ලැබුව ද, එතැන තිබූ පෘතුගීසී නිර්මාණ සමහරක් විනාශ නොකරන ලද බව පෙනේ. ඉන් දැනට දේවාල පරිශ්‍රයේ නිරුපද්‍රිතව පවතින පෘතුගීසි නිර්මාණ දෙකක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම මෙම ලිපියේ අරමුණයි.

## සපරගමු මහ සමන් දේවාලයේ ඉතිහාසය

සුමන සමන් දෙවියන් වෙනුවෙන් ඉදිකොට තිබෙන ප්‍රධාන දේවාලය වශයෙන් සැලකෙන රත්නපුරයේ පිහිටි සපරගමු මහ සමන් දේවාලයේ ඉතිහාසය දඹදෙනිය රාජ සමය දක්වා දිව යයි. දඹදෙනියේ රාජ්‍ය කළ දෙවන පරාක්‍රමබාහු රජුගේ (ක්‍රි.ව. 1234 - 1269) අණින් ආර්යකාමදේව නම් අමාත්‍යවරයා විසින් ඉදිකරවනු ලැබූ සපරගමු මහ සමන් දේවාලය එතැන් පටන් රාජානුග්‍රහය යටතේ වැඩි දියුණුවට පත්විය. එහෙත් සීතාවක රාජධානිය බිඳ වැටීමත් සමඟ සපරගමු මහ සමන් දේවාලයට උදාවූයේ දුර්භාග්‍ය සම්පන්න තත්ත්වයකි. (ඤාණවිමල හිමි, 1967–82-96)

කෝට්ටේ රාජධානියේ අවසන් පාලකයා ධර්මපාල රජු (ක්‍රි.ව. 1551 - 1597) කතෝලික දහම වැළඳගෙන දොන් ජුවන් පෙරිය බණ්ඩාර නමින් බෞතිස්ම වීමත් සමඟ රාජධානිය පුරා ඇති වූයේ ව්‍යාකූල තත්ත්වයකි. අනතුරුව තමාට අනුප්‍රාප්තිකයෙකු නොමැති හෙයින් ධර්මපාල රජු විසින් වර්ෂ 1580 අගෝස්තු 12 වන දා තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජධානිය පෘතුගාල රජුට පැවරීමට ද කටයුතු කරන ලදී. වර්ෂ 1597 මැයි 27 වනදා රජු මිය යාමත් සමඟ කෝට්ටේ රාජධානියේ පාලකයන් බවට පත් වූ පෘතුගීසීන් විසින් තම බලය අන් ප්‍රදේශ වලට ව්‍යාප්ත කළා පමණක් නොව කතෝලික දහමේ ව්‍යාප්තිය උදෙසා කටයුතු කළ බව පෙනේ. (අබයසිංහ, 1966– 3 - 4)

සීතාවක රාජසිංහ රජුගේ (ක්‍රි.ව. 1554 - 1593) අභාවයත් සමඟ ඇති වූ අරාජික පසුබිම යටතේ ඒ ප්‍රදේශයේ ද තම බලය ව්‍යාප්ත කළ පෘතුගීසීන් විසින් සපරගමු මහ සමන් දේවාලය බිඳ දමා එතැන බලකොටුවක් සහ ශාන්ත සැල්වදෝර් (St.Salvador) මුනිවරයාට කැප කරන ලද දේවස්ථානයක් ඉදිකිරීමට කටයුතු කරන ලදී. ඒ අවස්ථාවේ දී සපරගමු මහ සමන් දේවාලයේ තැන්පත් කර තිබූ දේවාභරණ බොල්තුඹේ සුමන සමන් දේවාලයේ තැන්පත් කිරීමට දේවාලයේ භාරකරුවන් කටයුතු කර තිබේ. සීතාවක රාජසිංහ රජ සමයේ දී බොල්තුඹේ සුමන සමන් දේවාලය ඉදිකරවනු ලැබුවේ ද සපරගමු මහ සමන් දේවාලයට එල්ලවන සතුරු උපද්‍රවයක දී දේවාභරණ තැන්පත් කරවීමේ අරමුණින් බව කියැවේ. (ඤාණවිමල හිමි, 1967–255-256)

පසුව දෙවන රාජසිංහ රජු (ක්‍රි.ව. 1629 - 1687) විසින් දියත් කළ පෘතුගීසීන්ට එරෙහි සටන් මාලාවේ ප්‍රතිඵලයක් ලෙස සපරගමු ප්‍රදේශය මුදාගැනුණු අතර පෘතුගීසී බලකොටුව සහ දේවස්ථානය බිඳ දමා නැවතත් රත්නපුර මහ සමන් දේවාලය ඉදි කරවන්නට රජු විසින් කටයුතු කරන ලදී. (ඤාණවිමල හිමි, 1967 – 104-105)

## සපරගමු මහ සමන් දේවාල බිමේ ඇති පෘතුගීසී නිර්මාණ

දෙවන රාජසිංහ රජු විසින් නැවත වරක් මහ සමන් දේවාලය ඉදිකරවීමේ දී එහි පැවති පෘතුගීසි ඉදිකිරීම් බිඳ දැමීමට කටයුතු කළ බව කියවුණ ද වර්තමානය දක්වා සමන් දේවාල බිමේ පෘතුගීසි නිර්මාණ කිහිපයක් සුරක්ෂිතව දැක ගැනීමට හැකිවීම විශ්මයජනකය. දෙවන රාජසිංහ රජු එම නිර්මාණ දේවාල බිමේ තිබෙන්නට ඉඩ හැරියා හෝ ඒවා පිළිබඳ එතරම් අවධානයක් යොමු නොකිරීම එයට හේතු වූවා විය හැකිය.



COM · ESTA* · RENDI · ESTE† · HA · 23‡ · ANNOS · QVE ·
ANDO · NA · INDIA · E · HA · 15‡ · QVE · SIRVO · DE · CA
PITAÕ · E · TAÕQVES§ · OS · REIS ... DE ... E · O · REI ·
DE · IAFANAPATAÕ · EV · SIMAÕ · PINHAÕ · O VENCI

මින් එක් නිර්මාණයක් රත්නපුර මහ සමන් දේවාල බිමේ වාහල්කඩ දොරටුවේ සිට දකුණු දෙසට විහිදී යන "කුර ගෙවල්" හෙවත් නැරඹුම් ශාලාවක් ලෙස භාවිතා කරන ගොඩනැගිල්ලේ බිත්තියකට සවිකර තිබෙන, උසින් අඩි 4 ක් පමණ සහ පළලින් අඩි 2.5 ක් පමණ වන කළු ගලින් නිමවූවකි. ඉහළින් ගල් කට්ටියක් කපා නිර්මාණය සඳහා පෘෂ්ඨය සුමට කර ගැනීම සහ නිර්මාණයේ ආරක්ෂා සලසා දුන් බවක් පෙනෙන අතර පෘතුගීසි යුද හමුදා නිල ඇඳුමින් සැරසුණු අයෙකු අසිපතක් හා පළිහක් දරමින් සිටින ආකාරය සහ ඔහුගේ පයට පෑගී සිටින උඩුකය නිරුවත් යටිකයට ධෝතියක් වැනි වස්ත්‍රයකින් සැරසී හිසේ ජටාවක් වැනි යමක් පැළඳි අයෙකු මෙම නිර්මාණයේ දැකගත හැකිය. බිම වැටී සිටින පුද්ගලයා සිය දකුණු අතින් පෘතුගීසි සොල්දාදුවාගෙන් එල්ලවන පහරක් වළක්වන ආකාරය ද, පසෙකින් ඔහුගේ අසිපත සහ පළිහ වැටී තිබෙන බව ද පෙනේ.

මින් නිරූපණය කෙරෙන්නේ කුමක් ද යන්න පිළිබඳ මත කිහිපයක් පළවී තිබෙන අතර ඉන් එක් මතයක් වන්නේ මේ ස්ථානයේ ඉදිකර තිබූ පෘතුගීසි බලකොටුවට ඇතුල් වී පෘතුගීසීන් සිය ගණනක් මරණයට පත් කළ සපරගමු මහ සමන් දේවාලයේ "රත්නායක" (ස්වර්ණාභරණ ගබඩාව භාර නිලධාරියා) වූ රත්නැකරාළ හෙවත් රත්නායක මුදියන්සේ අවසානයේ දී සයිමන් පිඤ්ඤෙඩා අතින් පරාජයට පත් වූ බවත්, එවැනි අභීත සිංහලයෙක් පරාජය කිරීම පිළිබඳව සතුටට පත් වූ පෘතුගීසීන් එම සිදුවීම මූර්තිමත් කොට තැබූ බවයි. (ඤාණවිමල හිමි, 2001 – 77)

මේ පිළිබඳ පවතින තවත් මතයක් වන්නේ පෘතුගීසීන් හිතියට පත් කළ කුරුවිට රාළ නම් පුද්ගලයා පෘතුගීසීන් 50 දෙනෙකු පමණ මරා දැමීමෙන් අනතුරුව ගෝමස් නම් පෘතුගීසි සොල්දාදුවා අතින් මරණයට පත් වූ අවස්ථාව මින් නිරූපණය කෙරෙන බවයි. (Lewis, 1913 : 286)

එහෙත් රූ සටහනට පහළින් පෘතුගීසි බසින් දක්වා ඇති ලේඛනය ඉහත මත ද්විත්වයටම හාත්පසින් වෙනස් පුවතක් ඉදිරිපත් කරයි. පහත දැක්වෙන්නේ එම පෘතුගීසි ලේඛනයයි.

COM · ESTA · RENDI · ESTE · HA · 23 · ANNOS · QVE ANDO · NA · INDIA · E · HA ·15 · QVE · SIRVO · DE CA · PITAÕ · E · TAÕQVE · OS · REIS ... DE ... E · O · REI · DE · JAFANAPATAÕ · EV · SIMAÕ · PINHAÕ O VENCI.

එහි සිංහල අර්ථය පහත පරිදි ගත හැකිය.

**"මින් (මේ කඩුවෙන්) මම මොහුව මර්දනය කළෙමි. මා ඉන්දියාවට පැමිණ දැන් වසර 23කි. ඉන් වසර 15ක් කපිතාන්වරයෙක් ලෙස සේවය කළෙමි. නොබෝ කලකින්......යාපා පටුනේ රජතුමාය. සයිමන් පිඤ්ඤෙඩෝ වන මම ඔහුව (යාපා පටුනේ රජුව) පරාජය කළෙමි" (Lewis, 1913 : 286)**


ඒ අනුව සයිමන් පිඤ්ඤෙඩෝ නම් පෘතුගීසි කපිතාන්වරයා විසින් යාපනයේ රජු පරාජය කිරීමේ අවස්ථාව මෙයින් නිරූපණය කෙරෙන බව පැහැදිලිය. පෘතුගීසි ජාතික පූජක ෆර්නාඕ ද ක්වේරෝස් විසින් රචිත **Conquista Temporal e Espiritual de Ceilão** කෘතියේ විස්තර කෙරෙන සයිමන් පිඤ්ඤෙඩෝ සමඟ මෙම නිර්මාණයේ දැක්වෙන පෘතුගීසි හමුදා නිල ඇඳුමින් සැරසී සිටින පුද්ගලයා සැසඳීම ද අවධානයට යොමු කළ යුත්තකි. ක්වේරෝස්ගේ දක්වන විස්තරය මෙසේය.

**".... මේ රණශූරයා (සයිමන් පිඤ්ඤෙඩෝ) ඒ වනවිට හතළිස් වියේ පසු වූ, ඉතා ශක්ති සම්පන්න සිරුරකට හිමිකම් කියූ අයෙකු විය. රාජතාන්ත්‍රිකයෙකුට වඩා ඔහු රණශූරයෙකු විය. එක ඇසක් අහිමි වී තිබුණේ සටනක දී ලන්ස පහරක් එල්ලවීම නිසා ය. හිස වටකුරුය. සිරුර දුඹුරු පැහැතිය. පාංශු දේහධාරීය. දිගු යටි රැවුල තඹ පැහැතිය. විසල් උඩු රැවුලක් ය.... යාපනයේ දී ඔහු විසින් දක්වන ලද වීර වික්‍රමාන්විත බව වාර්තාගතව ඇත...."**

(පීරිස් 2008–550)

**මෙම නිර්මාණයේ නිරූපිත සිදුවීම සඳහා පාදක වූ කතා පුවත පිළිබඳව ද අවදානය යොමු කිරීම වටී. පහළොස් වන සියවසේ මැද භාගයේ පමණ පටන් " ආර්යචක්‍රවර්තී" නමින් හඳුන්වන ලද පාලකයන් විසින් යාපනයේ ස්වාධීන පාලනයක් පවත්වා ගෙන ගිය අතර මුල්කාලීනව පෘතුගීසීන්ගේ අවධානය ඒ ප්‍රදේශ කෙරෙහි යොමු වූ බවක් නොපෙනේ. එහෙත් දහසය වන සියවසේ මුල් භාගයේ දී පමණ පෘතුග්‍රීසි අවදානය යාපනය කෙරෙහි එල්ලවීමට ප්‍රධාන හේතුව වූයේ යාපනය රාජධානියට අයත් වෙරළාසන්න ප්‍රදේශ ආසන්නයේ විනාශ වන පෘතුගීසි භාණ්ඩ රැගත් නෞකා අත්පත් කරගැනීමට යාපන පාලක පළමුවන සංකිලි රජු (ක්‍රි.ව. 1519 - 1561) විසින් කටයුතු කිරීමත් සමඟය. සංකිලිගේ ක්‍රියාකලාපයට එරෙහිව මාර්ටින් අපොන්සු ද සූසා යටතේ යාපනය ආක්‍රමණය කිරීමට පෘතුගීසි බල ඇණියක් වර්ෂ 1543 දී පිටත් කෙරුණු අතර පෘතුගීසි හමුදා බලය හමුවේ පරාජයට පත් වූ සංකිලි පෘතුගීසීන්ට කප්පම් ගෙවන පාලකයෙකු බවට පත් වීමටද පොරොන්දු විය. ( ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තුන්වන කොටස, 2007 – 89-90).**

**එහෙත් වර්ෂ 1544 දී ෆ්‍රැන්සිස් ක්ෂේවියර් පියතුමා විසින් මන්නාරමේ ධීවරයන් පිරිසක් බෞතීස්ම කොට කතෝලිකයන් බවට පත් කිරීමට එරෙහිව කටයුතු කළ සංකිලි විසින් ඔවුන්ට නැවතත් හින්දු ආගම වැළඳගැනීමට ද නියම කරන ලදී. මේ හේතුවෙන් නැවත වරක් පෘතුගීසීන් සමඟ ගැටුමක් ඇති වීමට හේතු විය. මෙවන් පසුබිමකදී සංකිලි ඇවෑමෙන් ඔහු පුත් පුවිරාජ පණ්ඩාරම් (ක්‍රි.ව. 1561 - 1565) යාපනය සිහසුනට පත් වූ අතර කාසි නයිනර් නම් තැනැත්තා ඊට එරෙහිව කැරැල්ලක් ඇති කොට සිහසුන හිමිකර ගැනීමට සමත් විය. එහෙත් ඔහු බලයෙන් පහකොට පෘතුගීසීන්ගේ ආධාර යටතේ පෙරිය පිල්ලෙයි නම් පුද්ගලයා විසින් වෙගරාජසේකරන් (ක්‍රි.ව. 1565 - 1582) නමින් සිහසුනට පත් වීමට කටයුතු කරන ලදී. ඔහුගෙන් පසු නැවත වරක් සිහසුන හිමිකර ගැනීමට සමත් වූ පුවිරාජ පණ්ඩාරම් (ක්‍රි.ව. 1582 - 1591) කැලිකට් පාලක සැමොරින්ගේ ආධාරක සේනා ලබාගෙන මන්නාරමට පහර දී කතෝලික ජනතාවට වදහිංසා පැමිණවීමට ද කටයුතු කර තිබේ. මින් කෝපයට පත් පෘතුගීසීන් විසින් වර්ෂ 1591 දී සයිමන් පිඤ්ඤෙඩෝ නම් කපිතාන්වරයා යටතේ සේනා පිටත් කොට පුවිරාජ පණ්ඩාරම් මරා දමා යාපනය අල්ලා ගැනීමට සමත් වූ අතර නැවත වරක් යාපනයේ පෘතුගීසි බලය ස්ථාපනය කිරීමට ද කටයුතු කරන ලදී. එහෙත් යාපනයේ පාලනය සඳහා සෘජුව මැදිහත් නොවූ පෘතුගීසීන් විසින් වඩාත් උපායශීලී වෙමින් මීට පෙර යාපනයේ සිහසුන දැරූ වෙගරාජසේකරන් රජුගේ පුත්‍රයාව හෙන්ද්‍රර්මනසිංහම්/ එදිරිමානසිංහම් (ක්‍රි.ව.1591 - 1616) නමින් රාජත්වයට පත්කොට තමන්ට පක්ෂපාතී පාලනයක් ඇති කිරීමට කටයුතු කර තිබේ. (ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තුන්වන කොටස, 2007–90 - 93)**







පෘතුගීසි රාජකීය ලාංඡනය සහිත ගල් පුවරුව

වර්ෂ 1591 දී සිදු වූ යාපන ආක්‍රමණයේ දී පෘතුගීසී කපිතාන් සයිමන් පිඤ්ඤෙඤ්දෝ විසින් යාපන රජු වූ පුවිරාජ පණ්ඩාරම් යටත් කර ගැනීම සුවිශේෂී සිද්ධියක් ලෙස සලකා එය ගල් කුලක කෙටවීමට කටයුතු කිරීමෙන් සපරගමු මහ සමන් දේවාල පරිශ්‍රයේ තිබෙන නිර්මාණය බිහිව ඇති බව පෙනේ. එය සයිමන් පිඤ්ඤෙඤ්දෝ විසින් හෝ පෘතුගීසී බලධාරීන් විසින් නිර්මාණය කරවා රත්නපුරයේ පිහිටි ඔවුන්ගේ බලකොටුවේ හෝ දේවස්ථානයේ තැන්පත් කරවන්නට ඇතැයි අනුමාන කළ හැකිය.

කෝට්ටේ රාජධානියේ අවසාන කාලසීමාවේ රාජකීය හමුදාවේ සේනාධිපති ධූරය ද ධර්මපාල රජු විසින් සයිමන් පිඤ්ඤෙඤ්දෝ වෙත පවරා දී තිබූ අතර කෝට්ටේ රාජ සභාවේ උසස් නිලයන් දැරූ එකම පෘතුගීසී ජාතිකයා වූයේ ද ඔහු බව කියැවේ. (අබයසිංහ, 1966 – 69) සයිමන් පිඤ්ඤෙඤ්දෝ සරණ පාවා ගෙන සිටි දෝන මරියා පෙරේරා සිංහල රජ කුමරියක වූ අතර ඇය සීතාවක රාජධානියේ අවසන් රජු වූ නිකපිටියේ බණ්ඩාරගේ සොයුරිය වූවා ය. ඔවුන්ගේ මිත්තනියගේ සොයුරා වූයේ සීතාවක රාජසිංහ රජුයි. කතෝලික පූජකවරයෙකු ලෙස අධ්‍යාපනය හදාරමින් සිටි නිකපිටියේ බණ්ඩාර වර්ෂ 1611 දී පෘතුගාලයේ දී මිය යාමත් සමඟ සීතාවක සිහසුනේ උරුමකාරීය බවට දෝන මරියා පෙරේරා පත් වූ හෙයින් සයිමන් පිඤ්ඤෙඤ්දෝහට ද සීතාවක සිහසුනට හිමිකමක් වූ බව පෙනෙන්නට තිබේ.( පීරිස්, 2008 – 442 - 443)

වර්ෂ 1603 දී සිදු වූ බලන සටන මෙන්ම උඩරට සහ පෘතුගීසීන් අතර සිදු වූ සටන් කිහිපයටම සයිමන් පිඤ්ඤෙඤ්දෝගේ දායකත්වය හිමි වූ අතර ඔහුගේ දක්ෂතාව පිළිබඳ පැහැදුන පළමුවන විමලධර්ම සූරිය රජු (ක්‍රි.ව. 1590 - 1604) පහතරට ප්‍රදේශවල රජකම ලබා දීමේ පොරොන්දුව මත සයිමන් පිඤ්ඤෙඤ්දෝ තමන්ට පක්ෂපාතී කරගැනීමේ අසාර්ථක උත්සාහයක නියැලුණු බව ද ක්වේරෝස් සඳහන් කරයි. (පීරිස්, 2008--549- 556) සයිමන් පිඤ්ඤෙඤ්දෝගේ ගතිගුණ පිළිබඳ අගය කිරීමක් කරන ක්වේරෝස් පහත කරුණු ද සඳහන් කරයි.

" .... මහා ශාරීරික ශක්තියකින් යුතු වූ ඔහු නිරතුරුවම අවදිව සටනට සූදානම්ව සිටියේ ය. කිසිම විටෙක පසු පසට නොගිය ඔහු දිවයිනේ වඩාත්ම ප්‍රචලිත සටන් ක්‍රමය වූ සැඟවී සිට පහර එල්ල කිරීමේ සහජ හැකියාවක් ඇත්තෙක් විය. ඔහු නිර්ලෝභීය. කතාබහ ඉතා අඩුය. කෝපාවිෂ්ඨ වූ විට රාක්ෂයෙකු බඳුය. තම ආගමට මහත් ලැදිය... එමෙන්ම ඔහුගේ විශේෂිත ලක්ෂණයක් වූයේ ඔහු කාමුකයෙක් නොවීමයි...."

මෙම නිර්මාණය හැරෙන්නට රත්නපුර මහ සමන් දේවාලයේ බිමේ දක්නට ලැබෙන අනෙක් පෘතුගීසී නිර්මාණය වනුයේ කලකට පෙර දේවාලයේ දිග්ගෙයි ආසන්නයේ ගොඩනැගිල්ලක තබා තිබූ වර්තමානයේ දී සපරගමු මහ සමන් දේවාල පරිශ්‍රයේ පිහිටි පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැම්පත් කොට තිබෙන අඩි 2 ක් පමණ දිග සහ අඩි 1.5 ක් පමණ පළල පෘතුගීසී රාජකීය ලාංඡනය සහිත ගල් පුවරුවයි.

පුවරුව වටා සරල මෝස්තරයක් දක්වා තිබෙන අතර මධ්‍ය කොටස් දෙකකට බෙදා ලාංඡන දෙකක් මූර්තිමත් කොට තිබෙන බව පෙනේ. ඉහළ කොටසේ පෘතුගීසී රාජකීය ලාංඡනය සහ දෙපසින් සුර දූතයන් යැයි අනුමාන කළ හැකි රූ දෙකක් දක්වා තිබේ. පෘතුගාල රාජකීය ලාංඡනයේ ප්‍රධාන පළිහට ඉහළින් පෘතුගාල රජුගේ කිරීටය ද ප්‍රධාන පළිහ අභ්‍යන්තරයේ ඇති කුඩා පළිහේ කුරුසයක හැඩයට තබා ඇති Quninas නමින් හැඳින්වෙන පළිහ පහක් දැකගත හැකි අතර Quninas පළිහ අභ්‍යන්තරයේ **Bezants** නමින් හැඳින්වෙන රන් කාසි පහ බැගින් කතිර හැඩයට තබා තිබේ. පහළ කොටසේ මධ්‍යයේ පළිහක් වැනි නිර්මාණයක් සහ ඒ වටා ලියවැල් යොදා කළ සැරසිල්ලක් ද දැකගත හැකි අතර ඉහළ කොටසට සාපේක්ෂව පහළ කොටස සලකුණු මැකී ගොස් ඇති බවක් පෙනේ.

මෙය වර්ෂ 1598 සිට 1612 දක්වා පෘතුගාලය පාලනය කරන ස්පාඤ්ඤයේ දෙවන පිලිප් රජුගේ රාජකීය වංශ ලාංඡනය ලෙස මතයක් ඉදිරිපත්ව තිබේ. (ඤානවිමල හිමි, 1967 – 108) එහෙත් එය සදොස් අදහසක් බව පෙනීයන්නේ මීට වඩා සංකීර්ණ සැරසිලි සහිතව මෙම ලාංඡනයට හාත්පසින්ම වෙනස් රාජකීය ලාංඡනයක් දෙවන පිලිප් රජු භාවිත කිරීම හේතුවෙනි. ඒ නිසා මෙම වංශ ලාංඡනය පෘතුගාල රජකීය පවුලට සම්බන්ධ කිසියම් පුද්ගලයෙකුට අයත් එකක් හෝ පෘතුගාල අධිරාජ්‍ය වෙනුවෙන් විශිෂ්ඨ සේවාවක් සිදු කරන ලද ලංකාවේ සිටි පුද්ගලයෙකුට ගෞරවයක් වශයෙන් පෘතුගාල රජු විසින් පිරිනමන ලද ලාංඡනයක් බව නිගමනය කිරීම සාධාරණය.

සපරගමු මහ සමන් දේවාලය වෙත පැමිණෙන බොහෝ දෙනෙකුගේ අවධානය මෙම නිර්මාණ ද්විත්වය කෙරෙහි යොමු නොවීම කණගාටුවට කරුණකි. මේ වනවිට පෘතුගීසී රාජකීය ලාංඡනය සහිත ගල් පුවරුව සපරගමු මහ සමන් දේවාල පරිශ්‍රයේ පිහිටි පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැම්පත් කොට ඇති හෙයින් ඒ සඳහා යම් කිසි ආරක්ෂාවක් සැලසී ඇත. අනෙක් ශිලාමය නිර්මාණය සඳහා ද එවන් ආරක්ෂිත වැඩපිළිවෙලක් සකස් කිරීම සහ ඒ පිළිබඳ තොරතුරු ඇතුළත් පුවරුවක් ඒ අසලින් ස්ථාපනය කිරීම බලධාරීන්ගේ වගකීමක් බව සිහිපත් කළ යුතුය.



හසිත චාමිකර ගුණසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඉතිහාස අධ්‍යයන අංශය
කැළණිය විශ්වවිද්‍යාලය
කැළණිය

ආශ්‍රිත මූලාශ්‍ර

*අබයසිංහ, ටිකිරි (1966), පරංගි කෝට්ටේ, එක්සත් ප්‍රවෘති පත්‍ර සමාගම, කොළඹ.
*ඤානවිමල හිමි, කිරිඇල්ලේ (1967), සපරගමු දර්ශන, ශාස්ත්‍රෝදය යන්ත්‍රාලය, රත්නපුරය.
*ඤානවිමල හිමි, කිරිඇල්ලේ (2001),සපරගමුවේ පැරණි ලියවිලි, මානව හිතවාදී ලේඛක පර්ෂදය, නුගේගොඩ.
*පීරිස්, පොල් ඊ. (2008), ලංකාව පෘතුගීසී යුගය - පළමුවන කාණ්ඩය, හේවාවසම් අභය (පරි.), සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.


*ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තුන්වන කොටස (2007), රණවැල්ල, සිරිමල් ඇතුළු තවත් අය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

*Lewis, J.Penry (1913), Tombstone & Monuments in Ceylon, Government Press, Colombo.









PRIYANTHA GEMS
DEALERS IN GEMS



පුතා මල්ලි
0776 573 796
0717 566 780
No. 28/1, Sri Sumana Mawatha,
Mudduwa, Ratnapura


# දරුවන්ගේ මානසික සහ සමාජයීය යහපැවැත්ම උදෙසා දෙමාපියන්ගේ භූමිකාව


දරුවන්ගේ මනෝ සමාජීය යහපැවැත්ම යනු චිත්තවේගීය, සමාජීය, සන්වේදීතාවය සහ ආත්ම විශ්වාසය මෙන් ම මානසික සෞඛ්‍ය මත පදනම්ව හැඟීම් කළමනාකරණය කිරීමට, සෞඛ්‍ය සම්පන්න සමාජ සබඳතා ගොඩනැගීමට සහ පරිසරයට අනුවර්තනය වීමට ඇති හැකියාව වර්ධනය කිරීමයි. එය සමස්ත පෞරුෂ සංවර්ධනයට සහ යහපැවැත්මට තීරණාත්මක ලෙස බලපාන අතිශය වැදගත් මාතෘකාවකි.

නිරෝගී, ක්‍රියාශීලී අනාගත පරපුරක් බිහි කිරීම උදෙසා දරුවන්ගේ මානසික සහ සමාජීය යහපැවැත්ම උපරිමයෙන් සංවර්ධනය කරගත යුතුය. දරුවා සමාජගත වීමට පෙර ඔවුන්ට හමුවන පළමු ගුරුවරුන් වන්නේ දෙමාපියන්ය. කුඩා කළ සිට දරුවා දෙමාපියන් දෙස බලමින්, ඔවුන්ව ආදර්ශයට ගනිමින් තම ජීවිතය සකස් කර ගැනීමට උත්සාහ කරයි. දෙමාපියන්ගෙන් ලැබෙන අනපේක්ෂිත ප්‍රතිචාර දරුවාගේ අනාගතය කෙරෙහි ධනාත්මකව හෝ ඍණාත්මකව බලපෑම් ඇති කළ හැකිය. එවැනි ප්‍රතිචාර හමුවේ වර්ධනය වන දරුවාගේ පෞරුෂය, සමාජයෙන් ප්‍රතික්ෂේප වන පුද්ගල ලක්ෂණ ඇති කරවීමට හේතු විය හැකිය. දෙමාපියන්ගේ සවිමත් සහයෝගය, ඵලදායී සන්නිවේදනය සහ ආදර්ශමත් හැසිරීම මගින් දරුවාගේ මානසික ශක්තිය, ආත්ම විශ්වාසය සහ සමාජයීය සම්බන්ධතා සහ හැකියාවන් වර්ධනය වේ.

එමඟින් ඔවුන් සමාජය සඳහා වගකීම් දරන, මනා පෞරුෂයකින් හෙබි පරිපූර්ණ පුද්ගලයන් බවට පත් කළ හැකිය. දරුවන්ගේ සමාජයීය දැනුම වර්ධනය කිරීමට, දෙමාපියන් ඔවුන් සමඟ විවේක කාලයේ දී සමාජ ගැටලු, පිරිසක් අතර සන්සුන්ව හැසිරීම සහ සන්වේදීතා වර්ධනය ගැන විවෘතව සාකච්ඡා කිරීම අත්‍යවශ්‍ය වේ. මෙය දරුවන්ගේ මිතුරු සබඳතා වඩාත් පෝෂණය කිරීමට හා ඔවුන්ගේ සමාජ ජීවිතය ඉහළ නැංවීමට මග පෙන්වනු ලබයි.

දරුවෙකුගේ මනස වර්ධනය කිරීමේ දී දෙමාපියන්ගේ භූමිකාව අතිශයින්ම වැදගත් වන අතර, ඒ සඳහා පරිපූර්ණ දෙමාපිය භූමිකාවක් අත්‍යවශ්‍ය නොවේ. මිනිස් මොළය වසර 25 - 28 දක්වා වර්ධනය වන අතර, දරුවෙකුගේ මනස වර්ධනය කිරීමේ දී දෙමාපියන්ගේ අවධානය සහ සහයෝගය විවිධ වයස් කාණ්ඩවලට අනුකූලව වෙනස් විය යුතුය. උපතේ සිට අවුරුදු දෙක දක්වා දරුවාගේ මූලික අවශ්‍යතා සපුරාලීම සහ විශ්වාසය ගොඩනැගීම වැදගත් වන අතර, අවුරුදු 2 සිට 7 දක්වා ස්වාධීනත්වය සහ ගවේෂණයට අවස්ථාව ලබාදිය යුතුය. අවුරුදු 07 සිට 11 දක්වා තාර්කික චින්තනය වර්ධනය කිරීමට සහයෝගය ලබා දිය යුතු අතර, අවුරුදු 12 සිට ඉහළට වියුක්ත චින්තනය සහ ගැටලු විසඳීමේ හැකියාව වර්ධනය කිරීමට මග පෙන්විය යුතුය. දරුවාගේ චිත්තවේගීය අවශ්‍යතා හඳුනාගෙන ඒවාට නිසිලෙස ප්‍රතිචාර දැක්වීම තුළින් ඔවුන්ගේ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම සහතික කළ හැකිය.





දරුවාගේ බුද්ධිමය මෙන්ම චිත්තවේගීය සංවර්ධනයට දෙමාපියන්ගේ ආදරය, රැකවරණය සහ ආරක්ෂිත බැඳීම අත්‍යවශ්‍ය වේ. දරුවාගේ පෞරුෂය වර්ධනයට සහ සමාජ කුසලතා වර්ධනයට දෙමාපියන්ගේ ආදර්ශය සහ සහයෝගය අවෙසි අතර, ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම සහ ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම තුළින් දරුවාගේ මනෝසමාජයීය යහපැවැත්ම සහතික කළ හැකිය.

ඇතැම් දරුවන් සන්සුන් මනසක් සහිතව ආරක්ෂාකාරීව, අන්අයට ලෙන්ගතුව ජීවත්වන අතර සමාජයේ තවත් දරුවන් පිරිසක් ජීවිත අභියෝගයන්ගෙන් පිරී ඇතිබව මනාවට පැහැදිලි වන්නේය. අද අපේ සමාජයේ බොහෝ දෙමාපියන් දරුවන්ගේ අධ්‍යාපනමය සාර්ථකත්වයට වැඩිම ප්‍රමුඛතාවයක් ලබාදෙයි. මෙම දැඩි අධ්‍යාපන මූලිකතා ප්‍රවණතාවය දරුවන්ගේ මනෝසමාජීය යහපැවැත්මට දැඩි හානියක් සිදු කරයි. විවේක කාලය, ක්‍රීඩා සහ මනස සන්සුන් කරන ක්‍රියාකාරකම් මඟහැරීමෙන්, දරුවන් ශාරීරිකව ද මානසිකව ද පීඩාවකට පත්වෙයි. සමාජ සම්බන්ධතා අඩුවීම සහ අධික බිය හේතුවෙන් ඔවුන් බෙහෙවින් තනිවී, සියදිවි හානි කරගැනීමට තැත් කරන කණගාටුදායක තත්ත්වයකට ඔවුන්ගේ ජීවිත ඇදවැටී තිබේ. අධ්‍යාපන ඉලක්ක කරා යන ගමනේදී ඇතිවෙන ආතතිය, දැඩි අපේක්ෂා මගින් ඇතිවන කළකිරීම, ඔවුන්ගේ ආත්මාභිමානය හා විශ්වාසය බිඳ වැටීමට හේතු වේ.

2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පාසල් 40ක දරුවන් 3,125 ක් සමඟ සිදුකළ ගෝලීය පාසල් සිසුන්ගේ සෞඛ්‍ය පිළිබඳව සමීක්ෂණයෙහි දක්වා ඇති ආකාරයට, 13 - 17 වයස් කාණ්ඩයේ සිසුන්ගෙන් 61% ක් තමන්ගේ විවේක කාලයේ දී කරන දේවල් පිළිබඳව දෙමාපියන් දන්නා බවත්, 44.5%ක් තමන් මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳව දෙමාපියන්ට තේරුමක් ඇති බවත්, 57.1% ක් දෙමාපියන් විසින් තමන්ගේ ගෙදර වැඩ සොයා බලන බවත් පැවසූහ. 14.2%ක් තමනගේ දේවල් දෙමාපියන් විසින් ඔවුන්ගේ අවසරයකින් තොරව සොයා බැලීමක් නොකරන බවත් සඳහන් විය.

මෙම සංඛ්‍යාත්මක දත්ත අනුව දෙමාපියන්ගේ සම්බන්ධතාවය සහ ගෘහස්ථ පරිසරය, දරුවන්ගේ මනෝසමාජීය යහපැවැත්ම සඳහා තීරණාත්මක සන්වේදී බලපෑමක් ඇති කර ඇති බව ප්‍රකාශ වේ. ගෝලීය පාසල් සිසුන්ගේ සෞඛ්‍ය පිළිබඳව සමීක්ෂණයෙහි තවදුරටත් පෙන්වා දී ඇති ආකාරයට, 15.4% කට සියදිවි හානි කර ගැනීමේ අදහස සහිත බවත්, 7.5%කට සමීප මිතුරන් නොමැති බවත්, 18%කට මානසික පීඩා වලට ලක්වීමට සිදුවන බවත්, 22.4% ක් තනිකමින් පෙළෙන බවත්, 11.9%ක් නිතරම කනස්සල්ලෙන් පසුවීම නිසා නින්ද නොයන බවත්, 9.1% ක් සියදිවි නසා ගැනීමට තැත් කරන බවත් අනාවරණය වී ඇත.

දෙමාපියන් විසින් දරුවන්ගේ දිවියට දක්වන ඇල්ම, අනාගත අභිලාෂ හා ඔවුන්ගේ මනෝභාවය දියුණු කිරීමට හෝ දරුවාගේ පෞරුෂ බිඳ වැටීමට හේතුවක් වේද යන්නත් සොයාබැලිය යුතුම වන්නේය. දෙමාපියන් ඔවුන්ගේ දරුවන් සමඟ විවේක කාලය ගැන කතා කිරීම, ඔවුන්ගේ දුක්ගැනවිලි අසා ඒ සඳහා විසඳුම් සෙවීම සහ ගෙදරවැඩ පිළිබඳව සොයාබලමින් කටයුතු කළයුතු වන්නේය. මෙය දරුවන්ගේ විශ්වාසය වඩාත් වර්ධනය කරමින්, ඔවුන් තුළ ආරක්ෂිත බවක් ඇති කරයි. දරුවන්ගේ මනෝසමාජීය යහපැවැත්ම උදෙසා දෙමාපියන් සතු වගකීමක් වන්නේ ඔවුන්ට නිදහසක් ලබා දෙමින් ද ඒ නිදහස අවබෝධ කරවීමයි. 14.2%ක් සඳහන් කළ පරිදි, තමන්ගේ දේවල් දෙමාපියන් විසින් ඔවුන්ගේ අවසරයකින් තොරව සොයාබැලීමක් නොවීම, දරුවන්ගේ පුද්ගලිකභාවය පිළිබඳ ආරක්ෂාව පරීක්ෂා කිරීමක් විය යුතුයි. මෙයින් දෙමාපියන්ට විශ්වාසයක් ඇතිකළ හැකි අතර, එය දරුවන්ගේ මනෝසමාජීය යහපැවැත්ම සඳහා උපකාරී වේ.



දෙමාපියන්ගේ ප්‍රධාන වගකීම වන්නේ තම දරුවන්ට ආදරය, ආරක්ෂාව සහ විශ්වාසය ලබාදීමයි. මෙය දරුවන්ගේ මානසික හා චිත්තවේගීය යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වේ. දරුවන් ආරක්ෂිත සහ සන්සුන් පරිසරයක ජීවත්විය යුතු අතර, දෙමාපියන්ගේ ආදරය සහ සෙනෙහස ඔවුන්ගේ ආත්ම විශ්වාසය වර්ධනය කිරීමට උපකාරී වේ. ළදරු අවධියේ සිටම ආරක්ෂාකාරී සහ ආදරණීය පවුල් පසුබිමක් ලබාදීම දරුවන්ගේ සමස්ත වර්ධනයට අතිශයින්ම වැදගත්වේ.

දරුවන් සමඟ විවෘත හා ඵලදායී සන්නිවේදනයක් ගොඩනැගීම දෙමාපියන්ගේ අත්‍යවශ්‍ය වගකීමකි. දරුවන්ගේ හැගීම්, බිය, ප්‍රශ්න සහ සිතිවිලි නිදහසේ ප්‍රකාශ කිරීමට ඔවුන්ට අවකාශයක් ලබා දිය යුතුය. සන්සුන්ව, සන්වේදීව සහ සහකම්පනයෙන් යුතුව සහයෝගයෙන් සන්වාදයක් ඇතිකර ගැනීම මෙන්ම ඔවුන්ගේ කතාවලට ප්‍රතිචාර දක්වමින් ගරු කරන ආකාරයෙන් කතා කිරීම තුළින් දරුවන් සමඟ විශ්වාසය ගොඩනගා ගත හැකිය.

දරුවන්ගේ සමාජීය ගුණාත්මක සබඳතා ගොඩනැගීමට දෙමාපියන්ගේ සහයෝගය අත්‍යවශ්‍ය වේ. මිතුරන් සහ පවුලේ සමාජිකයන් සමඟ පවතින සබඳතා වර්ධනයට ඔවුන් උදව් කළ යුතු අතර, වගකීම සහ සහයෝගීතාව පදනම් කරගත් සබඳතා ගොඩනැගීමට දරුවන්ට උපදෙස් දිය යුතුය. විශේෂයෙන් කුඩා අවදියේ දී සමාජීය අන්තර්ක්‍රියාවන් වැඩි කිරීම තුළින් දරුවාගේ සමාජ කුසලතා වර්ධනය කිරීමට දෙමාපියන් හට හැකියාව ලැබේ.

දරුවන්ගේ මානසික හා සංවේදී ශක්තිය වර්ධනය කිරීම දෙමාපියන්ගේ තවත් ප්‍රධාන වගකීමකි. අධික ආතතියක් නොමැති අධ්‍යාපන හා ක්‍රීඩා පසුබිමක් ලබාදීමෙන් දරුවන්ගේ මානසික සුවතාවය පවත්වා ගත හැකිය. ආතතිය හෝ බිය සැලකිල්ලෙන් හඳුනාගෙන ඒවාට නිවැරදි විසඳුම් ලබාදීම වැදගත්ය. විවේකය, ක්‍රීඩා, කලාව, සංගීතය වැනි ක්‍රියාවලියන් තුළින් දරුවන්ගේ මානසික ශක්තිය වර්ධනය කළ හැකිය. මෙමඟින් දරුවන්ගේ චිත්තවේගයන් හඳුනාගෙන ඒවාට මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය වේ.


දරුවන්ට වගකීම සහ ගුණාත්මක වියමනක් ගොඩනැගීමට ඉගැන්වීම දෙමාපියන්ගේ වැදගත් කාර්යයකි. දරුවන්ට ස්වෛරී තීරණ ගැනීම, වගකීම් දැරීම සහ බුද්ධිමත්ව ක්‍රියා කිරීම පිළිබඳව මගපෙන්වීම අත්‍යවශ්‍ය වේ. අධික විනිවිදභාවය හෝ නොසන්සුන්බව යන අන්තයන්ගෙන් තොරව, සාධාරණ හා සන්සුන් මැදි මාර්ගයක් අනුගමනය කළ යුතුය. දරුවන්ට සන්සුන් නීතිරීති පිළිබඳව ඉගැන්වීම තුළින් ඔවුන්ගේ ස්වයං පාලනය සහ විනය වර්ධනය කිරීමට දෙමාපියන්ට හැකියාව ලැබේ.

දෙමාපියන්ගේ වගකීම පවුලේ සීමාව ඉක්මවා සමාජය තුළ දරුවන්ගේ මනෝසමාජීය වර්ධනයට ප්‍රබල බලපෑමක් ඇති කරයි. ඔවුන් පාසල් සහ ගුරුමණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු අතර, ප්‍රජා සන්විධාන හා ක්‍රියාවලියන් තුළ දරුවන්ට සහය දැක්විය යුතුය. දෙමාපියන්ගේ හැසිරීම් සහ ගුණාත්මක භාවය දරුවන්ගේ චරිත වර්ධනයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන බැවින්, ඔවුන් සමාජය තුළ ආදර්ශමත් ලෙස හැසිරීම අත්‍යවශ්‍ය වේ.

දරුවන්ගේ මනෝසමාජ යහපැවැත්ම පවත්වා ගැනීම සඳහා දෙමාපියන්ගේ වගකීම අතිමහත්ය. ආදරය, ආරක්ෂාව, නිවැරදි මගපෙන්වීම, සහයෝගීතාවය සහ සන්සුන් පරිසරයක් තුළින්, දරුවන් සෞඛ්‍ය සම්පන්න සහ ගුණාත්මක පුද්ගලයන් බවට පත් කළ හැකිය. දෙමාපියන්ගේ මෙම කැපවීම දරුවන්ගේ අනාගතය පමණක් නොව, සමස්ත සමාජයේ ම යහපැවැත්මට ද තීරණාත්මක බලපෑමක් ඇති කරයි. යහපත් දෙමාපියන් යනු හෙට දවසේ සමාජයට වටිනා නායකයන් බිහි කරන පුරවැසියන් ය. ඔවුන්ගේ දූරදර්ශී සහ වගකිවයුතු ක්‍රියාකලාප තුළින්, දරුවන්ගේ මනසික සුවතාවය සහ පෞරුෂ වර්ධනයට අවශ්‍ය පදනම සකස් කරනු ලබයි. එමනිසා දෙමාපියන් තම දරුවන්ගේ ජීවිත තුළ ආදරණීය, ආරක්ෂිත සහ සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීමට නිරන්තරයෙන් උත්සාහ කළ යුතුය.



**එස්.එච්.කේ.පෙරේරා**
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
පාසල් සෞඛ්‍ය සහ පෝෂණ අංශය
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය


PTE & IELTS SUCCESSHUB
Is IELTS or PTE hard for you?
Join our ZOOM class and see the miracle
Best results producer for
16 years
Former university Lecturer of English
BAND 9 AND 90/90PRODUCER
Teacher
Uthpala (MA,TESL,TEFL,CAE(UK)
Flexible schedule
One to one attention
Small group or 1 on 1
076 79 78 983
zoom



# Sri Lanka: The Crown Jewel of Asia

## Sri Lanka: Asia's Hidden Gem

Picture a land where the emerald green of the lush tea plantations contrasts sharply with the turquoise blue of the ocean waves booming against golden sands. Imagine a place where ancient temples stand majestically beside bustling modern cities, where wild elephants roam free and leopards slink through dense jungles, where a rich tapestry of culture and history beckons you to explore. Welcome to Sri Lanka, the island of the Indian Ocean that deserves to be the tourist hub of the world.









## A Treasure Trove of Natural Beauty

Sri Lanka is a land of unparalleled natural beauty. The island boasts a range of landscapes, from the sun-kissed beaches of the southern coast to the misty mountains of the central highlands. The pristine beaches, such as Mirissa, and Arugam Bay, offer crystalclear waters perfect for swimming, snorkeling, and surfing. The scenic mountain country, with its rolling tea plantations and gushing waterfalls, provides a serene escape for nature lovers and adventure seekers alike.

One cannot mention Sri Lanka without highlighting its unique wildlife. The island is home to plentiful national parks and wildlife reserves, such as Yala, Wilpattu, and Udawalawe. Here, tourists can embark on thrilling safaris to spot elephants, leopards, sloth bears, and a myriad of bird species. The Sinharaja Forest Reserve, a UNESCO World Heritage site, offers a unique opportunity to explore the island's rich bio multiplicity and dense rainforests.








## A Rich Cultural Heritage

Sri Lanka's history dates back to 2,500 years, and its cultural heritage is a testament to the island's enduring legacy. The ancient cities of Anuradhapura, Polonnaruwa, and Sigiriya, collectively known as the Cultural Triangle, are home to some of the most remarkable archaeological sites in the world. The iconic Sigiriya Rock Fortress, also known as the Lion Rock, stands as a testament to the ingenuity and creativity of ancient Sri Lankan civilization. Tourists can climb to the summit to marvel at the stunning frescoes, gardens, and panoramic views of the adjoining countryside.
The island is also a soft pot of religions, with Buddhism, Hinduism, Islam, and Christianity all coexisting harmoniously. The sacred city of Kandy, with its eminent Temple of the Tooth, is a significant pilgrimage site for Buddhists. The city of Galle, with its youthful colonial-era fort, platforms the island's colonial history and multicultural heritage. Guests can explore the narrow streets, quaint cafes, and boutique shops that line the historic fort, a UNESCO World Heritage site.
Stunning historical sites in Anuradhapura and Polonnaruwa:

1. Anuradhapura Ancient City: This UNESCO World Heritage site includes iconic landmarks such as the Ruwanwelisaya Stupa, Sri Maha Bodhiya, and Abhayagiriya.
2. Twin Baths (Kuttam Pokuna): These ancient bathing pools are a marvel of engineering in Anuradhapura.
3. Polonnaruwa: Another UNESCO World Heritage site, Polonnaruwa is home to the impressive ruins of the ancient city: the core Royal Palace and the Gal Vihara.
4. King's Council Chamber: This historical site in Polonnaruwa features complex stone carvings and is a testament to the architectural dexterity of ancient Sri Lanka.
5. Lankathilaka Image House: A stunning example of ancient Sri Lankan architecture, this site in Polonnaruwa is known for its towering Buddha statue and complex carvings.










## A Pleasure-loving Adventure

Sri Lankan cuisine is a delightful fusion of flavors and aromas, with the island's multiple cultural heritage and tropical bounty. From the sizzling spices of customary curries to the delicate sweetness of tropical fruits, Sri Lankan food is a sensory delight. Tourists can savor local plates such as hoppers (crispy pancakes), kottu roti (split flatbread with vegetables and meat), and lamprais (a Dutch- rice plate with banana leaves).

Street food enthusiasts will be ecstatic by the bustling bazaars and roadside stalls offering a variety of snacks and treats. Be sure to try the famous "pol sambol," a coconut relish bursting with flavor, and "watalappan," a rich coconut custard dessert. For those pursuing a more superior feasting experience, Sri Lanka offers an array of upscale restaurants and boutique cafes that shows the island's culinary prowess.

## Warm and Welcoming Friendliness





Sri Lankans are wellknown for their warm kindness and genuine friendliness. Tourists to the island are enjoyingthe kindness and generosity of the local people, who go out of their way to make guests feel welcome. From the moment you arrive, you'll be met with smiles and open arms, whether you're staying in a luxury resort, a charming guesthouse, or a homestay with a local family.

The island's vibrant festivals and cultural events provide a unique opportunity to immerse yourself with the local way of life. The Esala Perahera , a grand procession featuring customary dancers, drummers, and beautifully decorative elephants, is a sure-see for anyone going to see Sri Lanka in July or August. Other festivals, such as Sinhala and Tamil New Year, Vesak, and Deewali, offer a glimpse of the island's rich cultural customs and festivities.







## Adventure and Relaxation



Sri Lanka offers a perfect blend of adventure and relaxation for every type of traveler. For adrenaline junkies, the island provides a plethora of activities, such as surfin and white-water rafting. The coastal town of Mirissa is a hotspot for whale and dolphin watching, while the centralcountry town of Ella is a haven for trekking enthusiasts, with its picturesque trails and magnificent viewpoints.

If relaxation is what you seek, Sri Lanka's wellness retreats and Ayurveda spas offer a rejuvenating escape from the hustle and bustle of routine life. Indulge in customary Ayurveda treatments, yoga sessions, and mindfulness practices of Buddhism to restore balance and harmony to your mind, form, and soul.



## Easy Accessibility and Affordable Travel


Sri Lanka's strategic location as the crown jewel of the Asian region makes it easily accessible from major cities around the world. The island's main International gateway, Bandaranaike International Airport, maintain flights from Europe, Asia, the Middle East, and Australia. Once on the island, travelers can take advantage of the all-embracing net of trains, buses, and domestic flights to explore the countless regions.

One of the greatest advantages of traveling to Sri Lanka is its affordability. The cost of living is relatively low relative to other popular tourist destinations, making it an attractive option for budget travelers.

Accommodation options range from budget-friendly hostels to luxury resorts, confirming that there is something to costume every budget. Further, the island's affordable feasting and transportation options make it possible to enjoy a memorable vacation. Sri Lanka, the hidden gem hub , is a destination that truly has it all. With its stunning natural beauty, rich cultural heritage, delectable cuisine, warm friendliness, and a range of activities, Sri Lanka deserves to be the tourist hub of the world. Whether you seek adventure, relaxation, or a deep cultural experience, this enchanting island promises to supply an unforgettable journey. So pack your bags and set your sights on Sri Lanka – the crown jewel of the world awaits you.By weaving together its unique charms and multiple attractions, Sri Lanka beckons travelers from around the globe to see its wonders and create eternal memories. The island's blend of beauty, history, and warmth makes it a unique destination where every tourist can find something to cherish and enjoy.



**Ms Viragee Uthpala Athukorala**
**( BA,MA,TESL,TEFL,CAE(UK)-Former senior university Lecturer of English and Founder PTE and IELTS Success Hub.**
**076 7 978 983**



## SURATHALI WATER FALL

Surathali Falls is a beautiful waterfall located in the Ratnapura District. It is easily accessible from the Colombo-Badulla main road and is within walking distance of the main road. The upper part of the waterfall can be viewed from the main road.

This waterfall is 60 meters high and 2 meters wide and consists of 2 parts. Surathali Falls is the 49th tallest waterfall in the island.This waterfall, a gift of nature, is not yet so much influenced by human beings.

Photography by
Sindujan De Silva



# ආයුර්වේදය සහ නිරෝගීකම

**ආයුර්වේද මූලධර්මයන් පදනම් කරගත් සෞඛ්‍ය මාර්ගෝපදේශනය**

**ආයුර්වේදය යනු කුමක් ද?**

ආයුර්වේදය යනු " ආයුෂ් (ජීවිතය)" සහ "වේදය (දැනුම)" යන වචන දෙකේ එකතුවක් වන අතර එය ජීවිතය පුරා නිරෝගී බව පවත්වාගැනීම සඳහා වන විද්‍යාවකි.
ආයුර්වේදය අනුව නිරෝගීකම යනු සෞඛ්‍ය පමණක් නොව ශාරීරික, මානසික හා ආත්මීය සන්සුන්භාවය වන අතර එය ඒ ඒ පුද්ගලයාට අවේනික ජීවන රටාවක් මත පදනම් වේ.

ආයුර්වේදය තුළ සෞඛ්‍ය නියමයන් කිරීමේ මූලික මාර්ගය නම් දෝෂ සමතාවයෙන් පවත්වා ගැනීමයි.

## ආයුර්වේද මූලධර්ම සහ නිරෝගීකම

ආයුර්වේද මූලධර්මයන් අනුව නිරෝගීභාවයට පහත මූලික ක්‍රම සහ ක්‍රියාවලියන් බලපායි.

### ත්‍රිදෝෂ මූලධර්මය

ත්‍රිදෝෂ මූලධර්මය අනුව සෑම පුද්ගලයෙකුටම වාත,පිත්ත, සෙම බලවේගත්‍රය බලපායි.

වාත
චලන ශක්තිය, ශරීරයේ ගමනි, ක්‍රියාවලියන් ප්‍රාණ ව්‍යායාම, වැන්නවුන් ය.

පිත
දහන ශක්තිය, ජීර්ණ ක්‍රියාවලිය, උණුසුම් බව, බුද්ධිය, මනෝභාවය, මනෝදෝෂ වේ.

සෙම
ස්ථිර ශක්තිය, ශරීරයේ ගොඩනැගීම, ශක්තිය, සන්සුන්බව

ශරීර දෝෂ තුන (වා,පිත්,සෙම්) අතර සමතා නතරවීම රෝගීබවට හේතු වේ. මේ දෝෂ විෂමතාවයයි.

### පංච මහාභූත මූලධර්මය

සෑම ජීවියෙකුගේම ශරීරය පංච මහාභූතයේ නිර්මාණයකි. (සංයෝජනයකි)

පෘථිවි -- ශරීරයේ ස්ථාවර බව (අස්ථි,දත්,මස්)
ආපෝ -- මෘදුතාව (ලේ, කොණ්ඩ, ක්ලේද)
තේජෝ -- ශරීරයේ දහනය සහ උණුසුම (පිත් ගතිය)
වායෝ -- චලන හැකියාව (සන්ධි, හදවත, ස්නායු)
ආකාශ -- ශරීරයේ පාලන ක්‍රියාවලිය ( අවකාශ, කන, නහර)

ආහාරය, වාතාවරණය, සන්සුන්භාවය සහ ව්‍යායාමය හරහා මෙම භූත සංයෝගය සමතුලිතව පවත්වාගත හැකිය.

### සප්තධාතු මූලධර්මය

1. රස – පෝෂණ දිය ( ලේ, පෝෂණය)
2. රක්ත – රුධිරය ( ලාබාන්විත ශක්තිය)
3. මාංශ – මස් පටල ( ශක්තිය සහ ආරක්ෂාව)
4. මේද – මේදය (සංවර්ධන ශක්තිය)
5. අස්ථි – අස්ථි පටලය ( ස්ථාවරතාවය)
6. මජ්ජා – මජ්ජා දියරය (ශක්තිය)
7. ශුක්‍ර (ධාතු) – ප්‍රජනන ශක්තිය (හෝමෝන සහ ශුක්‍ර/ඩිම්බ)

ආහාර සහ ජීවන රටාව නිවැරදිව පවත්වාගැනීමෙන් මෙම ධාතු පද්ධතිය ශක්තිමත් කරගත හැක.

# ආයුර්වේදය සහ නිරෝගී ජීවිතය

## නිරෝගී දිවියකට ආයුර්වේදීය උපදෙස්

### සදාචාරය සහ ජීවන රටාව

උදෑසන උණුසුම් ජලය පානය.
දන්ත දාවනය (අළු, කරාබුනැටි වැනි දෑ වලින් දත් පිරිසිදු කිරීම)
අභ්‍යංග ( තෙල් ගා අතගෑම)
අනන්‍ය යෝගා සහ ප්‍රාණායාමය
ආහාරය නියමිත වේලාවට ගන්න.
රාත්‍රියට ඉතා හොඳ සුදුසු නින්දක් ගන්න.

### ආහාර සහ පෝෂණය


කිරි ආහාර – යෝගට්, මී කිරි, කිරි මිශ්‍ර ආහාර
පෝෂ්‍යදායක ආහාර – බිත්තර, මස්මාළු, චීස්, බටර්
ශක්තිමත් ආහාර – බත්, පිෂ්ඨය සහිත ආහාර

### ව්‍යායාමය සහ ශරීර සන්සුන්භාවය

යෝගා සහ ප්‍රාණායාමය.
යෝග්‍ය මානසික සමාධියක් ලබා ගැනීම.
මද වශයෙන් කය වෙහෙසා කරන ව්‍යායාම.

### මානසික සන්සුන්බව

මනෝශ්‍රමය අඩු කිරීම ( කලබලකාරීත්වයෙන් මිදීම)
සන්සුන් ජීවිතයක් ගත කිරීම.
දවස අවසානයේ හොඳ සිතිවිලි වලින් මනස පිරවීම.
ආවර්ජනය කර සතුටු වීමට හැකි ක්‍රියාවන්වල යෙදීම.
දන්දීම, පිංකම්වල යෙදීම.



එස්.කේ. ජයලත් ( මොරහැල වෙද මහතා)
ගමතුඹුරේ වෛද්‍යාචාර්යය

# ආත්මීය සහ සමාජීය සන්සුන්භාවය

දානය සහ මෛත්‍රිය ප්‍රතිපත්ති කර ගැනීම.
ධර්මය පිළිබඳව අවබෝධය ඇති කර ගැනීම.
රාග, ද්වේෂ, මෝහ ත්‍රයෙන් ඉවත් වීම.

එබැවින්

ආයුර්වේදය අනුව නිරෝගී ජීවිතයක් ගත කිරීමට නම්,

දෝෂ පාලනය කිරීම
නිවැරදි ආහාර රටාව සහ ආහාර පාලනය
මානසික සන්සුන්භාවය
පරිසරය සහ ආත්මීය නරක පුරුදු ප්‍රහානය
සහ ආත්මීය හොඳ පුරුදු ඔප්නැන්වීම.

යන අංගයන් ගොඩනැගීම අත්‍යවශ්‍ය වේ.

මෙම මූලධර්මය අනුගමනය කර ජීවිතයේ සන්සුන්බව සහ පිරිපුන් සෞඛ්‍යයක් ලබා ගැනීමට හැකියාව ලැබිය හැක.

ආයුර්වේද වෛද්‍යවරයෙකුගේ ඒකායන පරමාර්ථය විය යුත්තේ ඉහත කියාපාන ලද කරුණු වල විකෘතිතාවයන් ක්ෂය කිරීම මගින් සැකසීමත්, මනෝභාවයන් සඳහා උපදෙස් දීමත් වේ. නොඑසේ නම් අසමතුලිත වූ දෝෂයන් සමතුලිත කිරීමම වේ.



# කොලොම්බියාවේ මරකත (EMARALD)

## පතල් කැණීම සහ ඉතිහාසය



කොලොම්බියාව පුරා මරකත (Emarald) පතල් ගණනාවක් තිබෙන නමුත් එරට නිෂ්පාදනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ලැබෙන පතල් කැණීම් ස්ථාන තුන වන්නේ මූසෝ, චිවෝර් සහ කොස්කුවෙස් ය. බොගෝටා සිට කිලෝමීටර් 75ක් පමණ ඊසාන දෙසින් චිවෝර් දිස්ත්‍රික්කය පිහිටා ඇත. ඒවාගේ ම බොගෝටා සිට කිලෝමීටර් 100ක් පමණ උතුරු දෙසින් මූසෝ දිස්ත්‍රික්කය පිහිටා ඇති අතර කොස්කුවෙස් ද මූසෝ දිස්ත්‍රික්කයට ඊසාන දෙසින් වඩාත් ආසන්නව පිහිටා ඇත.




## පතල් හිමිකාරීත්වය

කොලොම්බියාවේ මුළු අපනයනයේ වටිනාකම අනුව එයින් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් එරට මරකත සෑදී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස කොලොම්බියාවේ පතල් කැණීම් සිදු කරන ඉඩම් වලින් වැඩි ප්‍රමාණයක් එරට රජය සතු වේ. ඒවාගේ ම එරට පතල් කැණීම් සිදු කරන කණ්ඩායම්වලට ඉඩම් කැබලි බදු දෙයි.



## මූසෝ MUZO


මූසෝ යනු කොලොම්බියාවෙහි පැරණිතම පතල් කැණීම් ස්ථානයයි. 14 වන සියවසේ ස්පාඤ්ඤ ආක්‍රමණිකයන්ගේ පැමිණීමට පෙර සියවස් ගණනාවක් තිස්සේ එහි අඛණ්ඩව පතල් කැණීම් සිදු කර ඇත. මූසෝහි පතල් රජයේ දේපළවලට අයත්වන අතර ඒවා තනි පතල් සමාගම්වලට බදු දී ඇත. මූසෝහි පතල් උණුසුම් සහ තෙතමනය සහිත වැසි වනාන්තර තුළියක පිහිටා ඇති අතර එහි පතල් කිරීමට අපහසුය. මෙම ප්‍රදේශයෙන් හමුවන මරකත සාමාන්‍යයෙන් අඳුරු සහ කොළ පැහැයෙන් යුක්ත වේ.

## චිවෝර් CHIVOR

කොලොම්බියාවෙහි චිවෝර් දිස්ත්‍රික්කයට අයත් සමහර පතල් පුද්ගලික අයිතීන් මත පවත්වාගෙන යන අතර එරටෙහි පුද්ගලික පතල් පවත්වාගෙන යන එකම දිස්ත්‍රික්කය චිවෝර් පමණක් බවද සඳහන් වේ. ඒවා ඝන වනාන්තර සහ වෘක්ෂලතා සහිත දුෂ්කර භූමි ප්‍රදේශයන්හි ද පිහිටා ඇත. චිවෝර් යනු විශේෂයෙන් ම නිල් සහ කොළ පැහැති මරකත නිපදවීම සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයකි.

## කොස්කුවෙස් COSCUEZ

කොස්කුවෙස්හි පවත්වාගෙන යන පතල් ද කොලොම්බියානු රජය සතුවෙන අතර පතල් කැණීම් කණ්ඩායම් සඳහා බදු දී ඇත. කොස්කුවෙස්හි හමුවන මරකත මිශ්‍ර වර්ණවලට වැඩි නැඹුරුතාවයක් දක්වයි. ඒවා තහ, කොළ සිට නිල් පැහැයන් දක්වා පරාසයක පවතී. ඒවායෙහි ඇති දීප්තිමත් බව නිසාම "හරිත ගින්න" යන අනුවර්ථ නාමයෙන් ඒවා ප්‍රසිද්ධියක් උසුලයි.



# ඉතිහාසය



කොලොම්බියානු මරකත පතල්හි ඉතිහාසය එතරම් සාමකාමී නොවන අතරම ස්පාඤ්ඤ ආක්‍රමණිකයන් පැමිණීමට පෙර සිට පතල් පිළිබඳ වූ කරුණු අභිරහස් වලින් පිරී ඇත. කොලොම්බියානු ස්වදේශිකයන් දකුණු සහ මධ්‍යම ඇමරිකාව පුරා මරකත කැණීම් කර වෙළඳාම් කර ඇත්තේ ස්පාඤ්ඤ ජාතිකයින් එරටට පැමිණීමට බොහෝ කලකට පෙරය. ඈත අතීතයේ සිටම "හරිත ගල්වල දෙවියා" යන අර්ථය ඇති මරකත බහුලව සොමොන්ඩෝකෝහි තිබූ අතර අද එම ප්‍රදේශය චිවෝර් පතල ලෙස හැඳින්වේ.
ස්පාඤ්ඤ ජාතිකයින් චිවෝර් ප්‍රදේශයෙන් නොනැවතී පසුව මුසෝ ප්‍රදේශයේ ද පතල් කැණීම් ආරම්භ කර ඇත. ඒ 1560 ගණන් වලදීය. එපමණක්ද නොව ඔවුහු ස්වදේශිකයන් බලහත්කාරයෙන් වහල් සේවයට පවා බඳවාගෙන ඇත. ඒත් සමඟම එම අමානුෂික සැලකිලි ප්‍රසිද්ධියට පත්විය.
17 වන සියවසේ මැදභාගය වනවිට එම තත්ත්වය හාත්පසින් ම වෙනස් වී ඇත්තේ ස්පාඤ්ඤ ජාතිකයින්ට ලැබුණු ශුම දායකත්වය අවම වීම සහ පතල් කළමනාකරණය තුළ ඇති වූ අඩුපාඩු හේතුවෙන් එම පතල් දෙකෙහිම නිෂ්පාදන පහත වැටීමෙනි. මේ හේතුන් නිසා 1675 දී චිවෝර් පතල අතහැර දැමූ අතරම එහි පිහිටීම ද වසර 200කට වැඩි කාලයක් පැවති අභිරහසක් බවට පත්විය.

වසර 1888 දී ඩොන් ෆ්‍රැන්සිස්කෝ රෙස්ට්‍රෙපෝ නම් කොලොම්බියානු පතල් ඉංජිනේරුවරයෙකු විසින් 17 වන සියවසට අයත් අත්පිටපතක් සොයාගන්නා ලදී. එහි සඳහන්ව තිබුණේ පුරාවෘත චිවෝර් පතල ඇන්ඩීස්හි පිහිටා ඇති බවය. ඒවාගේම රෙස්ට්‍රෙපෝ විසින් දශකයකට ආසන්න කාලයක් ගම්බද ප්‍රදේශ සෝදිසි කිරීමෙන් පසුව 1896 දී පතල සොයාගත් බව සඳහන් වේ. පතල සොයාගැනීමෙන් පසුව ඔහු එහි අයිතිවාසිකම් වෙනුවෙන් කොලොම්බියානු රජය සමඟ දිගුකාලීන අරගලයක් ද සිදු කළ නමුත් එය අසාර්ථක වූ බව සඳහන් වේ.

පසු කාලීනව මුසෝහි ද වෙනස්වීම් සිදු වී ඇති අතර එහි පතල් වල පාලනය රජය යටතට පත්විය. එමඟින් එහි නිෂ්පාදනය පහත වැටුණු අතරම එම ප්‍රදේශයේ අවුල්සහගත තත්ත්වයන් ද ඇතිවිය. එම දිස්ත්‍රික්කයට යම් සංවිධානාත්මකභාවයක් සහ නීත්‍යානුකූලභාවයත් නැවත ලැබී ඇත්තේ ඉතා මෑතක දී බවද සඳහන් වේ. කෙසේ නමුත් මේ වනවිට ලෝකයේ ඇති වැදගත්ම මරකත පතල මුසෝ බව සැලකේ.

# මරකත ගැටුම

කොලොම්බියානු පතල් කැණීම් කාර්යය ඉතා කටුකය. එමෙන්ම එහි නීතිවිරෝධී පතල් කැණීම් බහුලව සිදු වේ. ඇස්තමේන්තුගත තොරතුරු වලට අනුව එරට මරකත වලින් නීත්‍යානුකූලව විකුණනු ලබන්නේ 10% ක් පමණ ප්‍රමාණයක් බව අනාවරණය වී ඇත.
කොලොම්බියාවේ අපනයන වලින් බහුතරය මරකත වේ. එබැවින් පතල් පාලනය කිරීමේ දී පැවති තරඟකාරීත්වය මාරාන්තික විය. මෙම ගැටුම් හේතුවෙන් සිවිල් වැසියන් මිලියන ගණනක් අවතැන් වූ අතරම ඉන් පිටත දී සිදු වුණු වෙඩි තුවමාරුවලින් දහස් ගණනින් ජනතාව මියගොස් ඇත.
කොලොම්බියානු මරකත කර්මාන්තයේ සාර් ලෙස හඳුන්වන වික්ටර් කැරන්සා නම් පතල් හිමිකරුවා 1990 ගණන් වලදී කතෝලික පල්ලිය සමඟ හවුල් වී එරටට සහ පතල් කර්මාන්තයට සාමය සහ සමෘද්ධිය ප්‍රතිව්‍යුහගත කරන්නට උත්සාහගෙන ඇත. එමඟින් එහි පැවති ගැටුම් යම් තරමකින් සමනයකට පත්ව ඇත.



ගයත්‍රි කරුණාදාස

# අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා විෂයන් තෝරා ගැනීම

අ.පො.ස (සා.පෙළ) විභාගය අවසන් වීමත් සමඟම දරුවන් අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා තමන් තෝරාගන්නා විෂය ධාරාව හා විෂයන් පිළිබඳව තීරණය කිරීම අවශ්‍ය වනුයේ ඒ මත තම ඉදිරි දිවියම තීරණය කරන ලබන බැවිනි. කෙසේ වුවද මෙම තෝරා ගැනීම් සඳහා දරුවාට නිසි අවබෝධයක් තිබේද යන්න ප්‍රශ්නගත වන්නේ පසුගියදා නිකුත් කරන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලෙස ආපසු හැරී බැලීමෙනි. එම විභාගය සඳහා මුළු අපේක්ෂකයන් 269,613 පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 5897ක් විෂයන් තෝරාගෙන තිබුණේ කිසිඳු විෂය ධාරාවකට අයත් නොවන පරිදිය. එවැනි අවස්ථාවක එම අපේක්ෂකයන් සඳහා දිස්ත්‍රික් තරාව(District Rank_) දිවයින් තරාව (island Rank) හෝ ප්‍රතිඵල සමඟ නිකුත් නොකරනු ලබයි.

එසේ ම විශ්වවිද්‍යාල පාඨමාලා සඳහා අයදුම් කිරීමේදී ද අයදුම්කල හැකි වන්නේ ඉතා සීමිත පාඨමාලාවන් ප්‍රමාණයක් සඳහා පමණකි. ඒ අනුව මෙම සටහන දරුවන්ට යම් විෂය ධාරාවකට අනුකූල වන පරිදි විෂයන් තෝරා ගැනීමට සිදු කරන මග පෙන්වීමක් ලෙස දැක්විය හැකිය.

අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා විෂය තෝරා ගැනීම පිළිබඳව ඇති නීත්‍යානුකූල ලියවිල්ල වනුයේ අධ්‍යාපන අමාත්‍යංශය විසින් 2016.04.26 දින නිකුත් කරනු ලැබූ අංක 2016/13 දරණ චක්‍ර ලේඛය වේ. එම චක්‍රලේඛය අනුව එක් එක් විෂය ධාරා සඳහා දරුවන් විෂයන් තෝරාගත යුතු ආකාරය පහත පරිදි පැහැදිලි කරගත හැකි වේ.



## කලා විෂය ධාරාව

ජාතික භාෂා තුනම විෂයන් වශයෙන් තෝරා ගන්නා අපේක්ෂකයන් හා භාෂා විෂයන් දෙකක් තෝරා ගන්නා සිසුන් හැර අනෙකුත් සියලුම සිසුන් පහත විෂයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක් තම විෂය වශයෙන් තෝරාගත යුතු වේ. (ජාතික භාෂා වනුයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වේ)

1. ආර්ථික විද්‍යාව
2. භූගෝල විද්‍යාව
3. ඉතිහාසය (ලංකා ඉතිහාසය සමඟ ඉන්දිය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය හෝ නූතන ලෝක ඉතිහාසය)
4. ගෘහ ආර්ථික විද්‍යාව
5. දේශපාලන විද්‍යාව
6. තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය
7. ගිණුම්කරණය හෝ ව්‍යාපාර සංඛ්‍යානය
8. කෘෂි විද්‍යාව හෝ ගණිතය හෝ සංයුක්ත ගණිතය
9. තාක්ෂණවේදය විෂයයන්ගෙන් එක් විෂයක් (සිවිල් තාක්ෂණවේදය හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය හෝ විදුලිය ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය හෝ ආහාර හා තාක්ෂණවේදය හෝ කෘෂි තාක්ෂණවේදය හෝ ජෛව සම්පත් තාක්ෂණවේදය)
10. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය
11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

එසේම ශිෂ්‍යයාගේ මනාපය අනුව ඉහත බාණ්ඩයෙන් විෂයන් දෙකක් හෝ විෂයන් තුනම වුවද තම විෂයන් වශයෙන් තෝරාගත හැක.

යම් සිසුවෙකු පහත සඳහන් ආගම් විෂයන් තෝරා ගන්නේ නම් ඊට අදාළ ශිෂ්ඨාචාර විෂය තම විෂයක් සඳහා තෝරා නොගත යුතුවේ.

1. බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය
2. ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාතාරය
3. හින්දු ධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය
4. ඉස්ලාම් හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය
5. ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය

උදාහරණ - බුද්ධ ධර්මය විෂයක් ලෙස තෝරා ගෙන ඇති සිසුවෙකුට බෞද්ධ ශිෂ්ටාචාරය තම දෙවන හෝ තෙවන විෂය ලෙස තෝරා ගැනීමට අවස්ථාවන් නොමැත.
සිසුවෙකු සෞන්දර්ය විෂයන් හැදෑරීමට අදහස් කරන්නේ නම් ඔහුට හෝ ඇයට පහත සඳහන් සෞන්දර්ය විෂයන් අතරින් එකක් හෝ දෙකක් තම විෂය ලෙස තෝරාගත හැක.

1. චිත්‍ර කලාව
2. නර්තනය (දේශීය හෝ භරත)
3. සංගීතය (පෙරදිග හෝ කර්ණාටක හෝ බටහිර)
4. නාට්‍ය හෝ රංග කලාව (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි)



යම් සිසුවෙකු භාෂා විෂය හැදෑරීමට අදහස් කරන්නේ නම් පහත පරිදි විෂය තෝරා ගැනීමට හැකියාව ඇත.

සිංහල, දෙමළ, ඉංග්‍රීසි, අරාබි, පාලි, සංස්කෘත, චීන, මැලේ, ප්‍රංශ, ජර්මන්, රුසියන්, ජපන්, හින්දි, කොරියන් යන භාෂා විෂයන්ගෙන් භාෂා එකක් හෝ දෙකක් තෝරාගත හැක. කෙසේ වුවද යම් අපේක්ෂකයෙකුට අවශ්‍ය නම් සිංහල, දෙමළ, ඉංග්‍රීසි, අරාබි, පාලි, සංස්කෘත යන විෂයන්ගෙන් විෂයන් තුනම, විෂයන් දෙකක් හෝ එක් විෂයක්, තම විෂයන් ලෙස තෝරා ගැනීමට හැකියාව ඇත.

## වාණිජ විෂය ධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත විෂයන් අතුරින් විෂයන් තුනම හෝ ඉන් අවම වශයෙන් දෙකක් තෝරාගත යුතු වේ.

**1. ආර්ථික විද්‍යාව 2. ව්‍යාපාර අධ්‍යනය 3. ගිණුම්කරණය**

ඉහත විෂයන් තුනෙන් දෙකක් පමණක් තෝරාගන්නා සිසුන්ට තෙවන විෂය වශයෙන් පහත සඳහන් විෂයන්ගෙන් එකක් තෝරාගත යුතුය.



1. ව්‍යාපාර සංඛ්‍යානය
2. භූගෝල විද්‍යාව
3. දේශපාලන විද්‍යාව
4. ඉතිහාසය ( ලංකා ඉතිහාසය සමඟ ඉන්දීය ඉතිහාසය හෝ යුරෝපා ඉතිහාසය හෝ නූතන ලෝක ඉතිහාසය)
5. තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
6. ඉංග්‍රීසි
7. ජර්මන්
8. ප්‍රංශ
9. කෘෂි විද්‍යාව
10. සංයුක්ත ගණිතය හෝ ගණිතය
11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## ජෛවීය විද්‍යා විෂය ධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් ජීව විද්‍යාව විෂය සමඟ පහත සඳහන් විෂයන් අතුරින් දෙකක් තෝරාගත යුතුය.

**1. රසායන විද්‍යාව 2. භෞතික විද්‍යාව 3. කෘෂි විද්‍යාව 4. ගණිතය**

කෙසේ වුවද යම් අපේක්ෂකයෙකු වෛද්‍යවරයෙකු වීමේ අභිලාෂයෙන් ජෛවී විද්‍යා විෂය ධාරාව තෝරා ගන්නේ නම් එම අපේක්ෂකයා ජීව විද්‍යාව. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයන් හැදෑරිය යුතු වේ.

## භෞතීය විද්‍යාව විෂය ධාරාව

මෙම විෂය ධාරාවෙන් උසස්පෙළ විභාගය සඳහා පෙනී සිටීමට නියමිත සිසුන් පහත විෂයන් අතරින් විෂයන් 03 ක් තෝරාගත යුතුය.

**1. සංයුක්ත ගණිතය 2. රසායන විද්‍යාව 3. භෞතික විද්‍යාව 4. උසස් ගණිතය**

යම් අපේක්ෂකයෙක් උසස් අධ්‍යාපනයේ දී ඉන්ජිනේරු විද්‍යාව හැදෑරීමට අභිලාෂයෙන් මෙම විෂය ධාරාව හදාරන්නේ නම් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව යන විෂයන් තුන හැදෑරීම අත්‍යවශ්‍ය වන බව මෙහි දී සැළකිය යුතුය.

## තාක්ෂණික විෂය ධාරාව

යම් අපේක්ෂකයෙකු ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීමට අදහස් කරන්නේ නම් එම අපේක්ෂකයා විසින් ජෛව පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයන් දෙක අනිවාර්යයෙන් තෝරාගත යුතුය.

එසේම ඉන්ජිනේරු තාක්ෂවේදය විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් ඉංජිනේරු තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයන් හැදෑරීම අනිවාර්යය වේ.

ඉහත විෂය ධාරා දෙකෙහිම තෙවන විෂය ලෙස අපේක්ෂකයාට පහත සඳහන් විෂයන්ගෙන් එකක් තෝරාගත හැක.


**1. ආර්ථික විද්‍යාව**
**2. භූගෝල විද්‍යාව**
**3. ගෘහ ආර්ථික විද්‍යාව**
**4. ඉංග්‍රීසි**
**5. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**
**6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය.**
**7. චිත්‍ර කලාව**
**8. ව්‍යාපාර අධ්‍යයනය**
**9. කෘෂි විද්‍යාව**
**10. ගිණුම්කරණය**
**11. ගණිතය**

ඉහත එක් එක් විෂය ධාරාව යටතේ දක්වා ඇති විෂයන් පමණක් තෝරා ගැනීම තුළින් එම අපේක්ෂකයා යම් නිශ්චිත විෂය ධාරාවට අයත් වන අතර, ඊට පටහැනි සියලු විෂය තෝරා ගැනීමක් ම කිසිදු විෂය ධාරාවකට අයත් නොවන සේ සළකා ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. එවැනි අවස්ථාවලදී අපේක්ෂකයාට දිස්ත්‍රික් තරාව (District Rank) හෝ දිවයින් තරාව (Island Rank) ලබා දීමක් සිදු කරනු නොලබනු අතර Z ලකුණ පමණක් ලබා දීම සිදු කරනු ලැබේ.



**නිලංකා කිරිඇල්ල**
නියෝජ්‍ය විදුහල්පති
ර/ෆර්ගසන් උසස් විද්‍යාලය

# Z ලකුණ ගැන ඔබ නොදත් දේ



අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටි විෂය සංඛ්‍යාව මුල් කාලයේ විෂයන් 4ක් වුවද, 2000 වර්ෂයේ සිට එය විෂය 3 දක්වා අඩු කිරීමට ලක්කරන ලදී. එසේ අඩු කිරීමත් සමඟම එතෙක් පැවති එක් එක් විෂය සඳහා ලබාගත් ලකුණුවල එකතුව අවසන් ලකුණ ලෙස ලබා දීම වෙනුවට Z ලකුණක් හඳුන්වා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍යයා ලබා ගන්නා ලද ලකුණු (Raw mark) මත පදනම්ව දිස්ත්‍රික් හා දිවයින් තරා කිරීම (Rank) නවතා දමා ඒ වෙනුවට Z ලකුණු මත දිස්ත්‍රික්ක හා දිවයින් තරා කිරීමට සිදු කරන ලදී.

**Z ලකුණ පිළිබඳව සාකච්ඡා කිරීමේ දී එහි ප්‍රථමයෙන් Z ලකුණ සඳහා වන සූත්‍රය පිළිබඳව දැන ගැනීම අවශ්‍ය වේ.**

**යම් විෂයක් සඳහා වන ලකුණ** = **අපේක්ෂකයා එම විෂය සඳහා ලබා ගත් අමු ලකුණු** **එම විෂය සඳහා සමස්ත සිසුන් ලබාගත් ලකුණුවල මධ්‍යනය**

(Z) (X) $(\bar{X})$

**එම විෂයෙහි සම්මත අපගමනය**

$(\sigma)$

ලෙස සරලව හඳුන්වා දිය හැකිය.

මේ ආකාරයට විෂය 03 සඳහාම Z ලකුණ එක් එක් අපේක්ෂකයාගේ ලකුණු මත පදනම්ව ගණනය කරනු ලබන අතර එහි සාමාන්‍ය අගය අපේක්ෂකයාගේ අවසන් Z ලකුණ ලෙස සැළකේ.

කෙසේ වුවද සියළුම විෂය අසමත් හා එක් විෂයක් පමණක් සමත් අපේක්ෂකයන් වෙනුවෙන්ද Z ලකුණක් ගණනය කිරීමක් සිදු කරනු ලැබේ.

Z ලකුණ සඳහා වන සමීකරණය දුටු පමණින් අපට නිරීක්ෂණය කළ හැකි කරුණු කිහිපයක් පහත දැක්වේ.

- යම් අයදුම්කරුවෙකු සාපේක්ෂව දුෂ්කර විෂයක් සඳහා වැඩි ලකුණක් ලබා ගත්තේ නම් සමීකරණයේ ඉහළ කොටසෙහි අගය සාපේක්ෂව විශාල සංඛ්‍යාවක් වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම විෂය සඳහා අපේක්ෂකයා වැඩි ' ලකුණක් ලබා ගනී. (සම්මත අපගමනය නොසලකා හරිනු ලැබේ නම්)

- එසේම අපේක්ෂකයා වැඩි ලකුණක් ලබා ඇත්තේ සාපේක්ෂ වශයෙන් පහසු විෂයකට නම් එම අපේක්ෂකයා එම විෂය සඳහා ලබා ගන්නා ' ලකුණ අඩු අගයකි.

**මෙය උදාහරණයක් මඟින් පහත පරිදි පැහැදිලි කළ හැක.**

P හා Q නැමැති විෂයන් දෙකක් සළකන්න.

යම් දරුවෙකු P විෂය සඳහා ලකුණු 50 ක් ද Q විෂය සඳහා ලකුණු 75 ක් ද ලබාගෙන ඇතැයි සිතන්න. P විෂය සාපේක්ෂව දුෂ්කර විෂයක් වන අතර එහි එම විෂයෙහි සමස්ත අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල මධ්‍යනය 32 කි. සම්මත අපගමනය 18 කි.



Q විෂය සාපේක්ෂව පහසු විෂයක් වන අතර එම විෂයෙහි ලකුණුවල මධ්‍යන්‍යය 60 කි. සම්මත අපගමනය 18 කි. ඒ අනුව දරුවා P හා Q විෂයන්ට ලබාගන්නා Z ලකුණු අගය පහත පරිදි ගණනය කළ හැක.

P විෂය සඳහා Z ලකුණ $\frac{(49 - 32)}{18} = 0.9444$

Q විෂය සඳහා Z ලකුණ $\frac{(75 - 60)}{18} = 0.8333$

යම් විෂයකට ලකුණු 75 හෝ ඊට වැඩි ලකුණක් අපේක්ෂකයා ලබා ගන්නේ නම් ඔහුට එම විෂයට " A "සාමාර්ථයක් හිමි වේ. යම් කිසි අපේක්ෂකයෙකු 35 - 49 අතර යම් විෂයකට ලකුණු ලබා ගෙන ඇත්නම් ඔහුට එම විෂය සඳහා හිමිවන්නේ "S" සාමාර්ථයකි.

ඒ අනුව ඉහත P හා Q විෂයන් සැළකූවිට P විෂය සඳහා අපේක්ෂකයා ලබා ඇත්තේ "S" සාමාර්ථයකි. Q විෂය සඳහා අපේක්ෂකයා A සාමාර්ථයක් ලබාගෙන ඇත. එසේ වුවද ශිෂ්‍යයා "A" සාමාර්ථයක් ලබාගත් විෂයේ Z ලකුණ වැඩි අගයකි.

මේ අනුව සාපේක්ෂව දුෂ්කර විෂය සඳහා වැඩි ලකුණක් ලබා ගැනීමට උත්සාහ කිරීම අපේක්ෂකයාගේ සමස්ත Z ලකුණු ඉහළ නංවා ගැනීමට හේතුවන බව පැහැදිලි වේ.

මීලඟට අවධානය යොමු කරනුයේ සමාජයේ විටින් විට කතාබහට ලක්වී ඇති, එකම විෂයන් 3 ක් සඳහා විභාගයට අපේක්ෂකයන් දෙදෙනෙකුගෙන් ඉහළ සාමාර්ථ ලැබූ අපේක්ෂකයාට වඩා අඩු සාමාර්ථයක් ලැබූ අපේක්ෂකයාට ඉහළ Z අගයක් හිමිවීමේ අවස්ථාවන්ය.

මෙවැනි සංසිද්ධි ඇතිවීමේ අවස්ථා පහත උදාහරණය ඔස්සේ පැහැදිලි කරගත හැකිවේ. A හා B දරුවන් දෙදෙනෙකු P,Q,R යන විෂයන් සඳහා පෙනී සිට ඇති බව සළකන්න.

A දරුවා විභාගය සඳහා පෙනී සිටි විෂයන් 3 සඳහා A සාමාර්ථ ලබාගෙන ඇති අතර B දරුවා ලබාගෙන ඇත්තේ A,B සාමාර්ථ හා C සාමාර්ථයකි.

**ඒ ඒ විෂයන් සළකා දරුවා ලබාගත් ලකුණු, විෂය මධ්‍යන්‍යය, සම්මත අපගමනය පහත පරිදි දක්වා ඇත.**

| විෂය | මධ්‍යන්‍යය | සම්මත අපගමනය | ලැබූ ලකුණු | |
|---|---|---|---|---|
| | | | A | B |
| P | 38 | 16 | 76 | 95 |
| Q | 48 | 19 | 78 | 74 |
| R | 63 | 22 | 77 | 64 |

**මීළඟට එක් එක් දරුවා ඒ ඒ විෂයට ලබා ගන්නා ලද Z ලකුණ හා අවසාන Z ලකුණ පහත පරිදි ගණනය කළ හැකිය.**

| | P විෂය සඳහා Z ලකුණ | Q විෂය සඳහා Z ලකුණ | R විෂය සඳහා Z ලකුණ | අවසන් Z ලකුණ |
|---|---|---|---|---|
| A | $\frac{(76-38)}{16} = 2.375$ | $\frac{(78-48)}{19} = 1.5789$ | $\frac{(77-63)}{22} = 0.6364$ | $\frac{(2.375 + 1.5789 + 0.6364)}{3} = 1.6301$ |
| B | $\frac{(95-38)}{16} = 3.5625$ | $\frac{(74-48)}{19} = 1.3684$ | $\frac{(64-63)}{22} = 0.0455$ | $\frac{(3.5625 + 1.3684 + 0.0455)}{3} = 1.6589$ |

ඒ අනුව එක් එක් විෂය සඳහා ලකුණු ලබා ගැනීමේ ස්වභාවය අනුව A සාමාර්ථ 3ක් ලබාගත් අපේක්ෂකයාට වඩා A,B සහ C සාමාර්ථ 3 ක් ලබාගත් අපේක්ෂකයා ලද අවසන් Z ලකුණ ඉහළ අගයක් ගෙන ඇත. ඊට සමගාමීව දිවයින් හා දිස්ත්‍රික් තරාව (Rank) ඉහළ අගයක් පවතින බව පැහැදිලිය.

මේ අනුව ඉතා පැහැදිලි කරුණක් වන්නේ Z අගය අපේක්ෂකයා ලබාගත් සාමාර්ථය මතම රඳා නොපවතින බවයි. ලබාගත් සාමාර්ථ පමණක් සළකා යම් අපේක්ෂකයෙකු තවත් අපේක්ෂකයෙකුට වඩා ඉහළ Z ලකුණක් ලබා ඇතැයි ප්‍රකාශ කළ නොහැකි වේ.

මෙම සියළු කාරණා සළකා බැලීමෙන් අ.පො.ස.(උ.පෙළ) විභාග අපේක්ෂකයන් දැනගත යුතු සරළම කරුණ වන්නේ සාපේක්ෂව දුෂ්කර විෂය සඳහා වැඩි වශයෙන් කැපවීම තුළින් ඉහළ අගයක් කරා යා හැකි බවයි.



**එල්.ජී.එස්. සමරකෝන්**
හිටපු නියෝජ්‍ය විභාග කොමසාරිස්



# අයිෆල් කුළුණ සොරාගත් වික්ටර්ගේ කතාව

**පසුගිය සියවසේ හොඳම සොරා ලෙස හැඳින්වෙන "වික්ටර් ලස්ටිග්" මාස්ටර්මයින්ඩ් ගේම් (Mastermind Game) සඳහා ජාත්‍යන්තරයේම ප්‍රසිද්ධියටපත් පුද්ගලයෙකි. ඔහුට තිබූ සූක්ෂම බුද්ධිය යහපත් ක්‍රියාවකට යොමු කර තිබුණානම් කෙතරම් වටිනවා දැයි මෙම ලිපිය කියවන ඔබට පවා සිතෙනු ඇත.**



රුමේනියානු මුදල් පෙට්ටිය

## වික්ටර් ලස්ටිග්ගේ ළමා කාලය සහ අධ්‍යාපනය

වික්ටර් ලස්ටිග් වසර 1890 ජනවාරි මස 4 වන දා ඔස්ට්‍රියානු සහ හංගේරියානු නගරයක් වන හොස්ටිනර්හි උපත ලබා ඇත. කුඩා අවදියේ පටන් හොඳ තීක්ෂණ බුද්ධියකට හිමිකම් කියූ ඔහු සාමාන්‍ය දරුවෙක්ට වඩා වෙනස් ආකාරයකින් සිතන්න,පතන්න පුරුදුව සිටි බව කියවේ. ඒ වාගේ ම ඔහුට ඉතා සංකීර්ණ ගණන් පවා හිතින් සෑදීමේ හොඳ හැකියාවක් තිබූ අතර ඔහුට භාෂා පහක් පමණ හොඳින් කතා කිරීමටත් ලිවීමටත් හැකියාව තිබී ඇත. අධ්‍යාපනයට කෙතරම් දක්ෂ වුව ද ඔහුගේ පාසල් ගමන අතරමඟ නතර කරන්නට ඔහුට සිදු වී ඇත. ඒ ඔහුගේ දෙමාපියන්ට තිබූ ආර්ථික අපහසුතා නිසාය.

## සොරකමට පෙළඹීම සහ ලෝකප්‍රසිද්ධ වීම

වික්ටර් ලස්ටිග් ඔහුට අවුරුදු 18 දී පමණ සිය බුද්ධිය සහ හැකියාවන් භාවිත කරමින් මුදල් උපයන්නට පෙළඹී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු පසුකාලීනව විවිධ ක්‍රම භාවිතයෙන් විශාල වශයෙන් මුදල් උපයන්නට පුරුදුව ඇත. කාලයත් සමඟ එය ඔහුගේ රැකියාව බවට පත් වූ බව සඳහන් වේ. ඒත් සමඟම ඔහු ලෝකප්‍රසිද්ධ වංචාකාරයෙකු නැතිනම් සොරෙකු ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇත.

## ව්‍යාජ විදෙස් ගමන් බලපත්‍ර සැකසීම සහ ධනවත් ව්‍යාපාරිකයන්ගේ මුදල් වංචා කිරීම

ඔහුට තිබූ සූක්ෂම බුද්ධිය භාවිත කරමින් ව්‍යාජ විදෙස් ගමන් බලපත්‍ර පවා සකසාගෙන තිබූ බවද නීතියේ රැහැනට හසු නොවන ලෙස ඒවා භාවිත කළ බවද සඳහන් වේ. කෙසේ නමුත් ඔහු එසේ විදෙස්ගතවන සෑම අවස්ථාවක දී ම ධනවත් පවුලක සාමාජිකයෙක් ලෙස පෙනී සිට ඇති අතර ඒ සඳහා ඔහුගේ කඩවසම් පෙනුමද ඔහුට බෙහෙවින් උපකාර වී ඇත.

එපමණක් ද නොව ඔහුට තිබූ සූක්ෂම සහ කපටි මොළය භාවිත කරමින් ඒ ඒ රටවල ධනවත් ව්‍යාපාරිකයින් පවා තමාවෙත නතු කරගන්නට ඔහු සමත්ව ඇත. ඒත් සමඟම ඔහු විවිධ රටවල ව්‍යාපාරිකයින් සමඟ සම්බන්ධතා පවත්වාගෙන යෑමටත් කටයුතු කර ඇත. ඒ කාල වකවානුව තුළ ධනවත් පුද්ගලයින්ට වැඩි පිළිගැනීමක් තිබී ඇති නිසාවෙන් ඔවුනට පවා තමාගේ පියා නගරාධිපතිවරයෙක් බව පවසා ඔවුන්ව තමාවෙත නතු කරගන්නට උත්සාහගෙන ඇත. ඒවාගේම ඔවුන් සමඟ රේස් සහ ඔට්ටු සඳහා සහභාගී වී ධනවත් පුද්ගලයන්ගේ මුදල් වංචා කරන්නට ද පුරුදුව සිට ඇත.

## ව්‍යාජ මුදල් නෝට්ටු අච්චු ගැසීම සහ ප්‍රංශය බලා පිටත් වීම.

වික්ටර් ලස්ටිග්ගේ කාලයට පෙරත් ව්‍යාජ මුදල් නෝට්ටු අච්චු ගැසීම සිදුව ඇති බව වාර්තා වී තිබුණ ද එම කාර්යය ඉතා සූක්ෂමව සහ ඉතා සාර්ථකව කරන්නට හැකියාව ඇති එකම පුද්ගලයා වික්ටර් බව ඉතිහාසයේ සඳහන් වේ. මුදල් අච්චු ගැසීමේ කටයුතු සඳහා ඔහු රේඩියම් යන ලෝහ වර්ගය භාවිත කෙරූ නිසාවෙන් සැබෑ මුදල් නෝට්ටු සහ ව්‍යාජ මුදල් නෝට්ටු අතර ඇති වෙනස හඳුනාගැනීමට නොහැකිවීම නිසා ඇමරිකානු රජය පවා අපහසුතාවයට පත්වූ බව කියැවේ.

ව්‍යාජ මුදල් නෝට්ටු අච්චු ගැසීම සඳහා ඔහු විසින්ම සකසාගත් උපකරණයක් භාවිත කර ඇති අතර අදටත් එම උපකරණය "රුමේනියානු මුදල් පෙට්ටිය"නමින් හඳුන්වයි.

කෙසේ නමුත් ඔහු ධනවත් පුද්ගලයෙක් ලෙස ජීවත් වූ නිසාවෙන් ඔහුට විවිධාකාර වූ ප්‍රශ්න මතුවන්නට පටන්ගත් අතරම ඉන් ප්‍රධානතම ගැටලුව වී ඇත්තේ පොලීසියයි. ඒත් සමඟම ඔහුට විවිධාකාර සතුරන් පවා ඇතිවන්නට පටන්ගෙන ඇත. ඒ නිසාවෙන් ම 1925 වසරේ දී ඔහු ප්‍රංශය බලා පිටත් වූ බව කියැවේ.






ගයත්‍රි කරුණාදාස



## අයිෆල් කුළුණ සොරකම් කළ වික්ටර්ගේ සැලසුම

ඔහු ප්‍රංශය බලා ගිය ද එහිදී ද ඔහුගේ සුපුරුදු කාර්යයන් නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නට මෙන්ම එහි ජීවත් වූ ධනවත් පුද්ගලයින් ද තමන්වෙත නතු කරගන්නට ඔහු සමත්ව ඇත.

ඒ කාලවකවානුව වන විට ප්‍රංශයෙහි අයිෆල් කුළුණෙහි නඩත්තු කටයුතු සඳහා ටෙන්ඩර්පත් කැඳවන බව කියැවෙන පුවතක් ඔහුට දැනගන්නට ලැබී ඇති අතර වික්ටර් ද එහි ගොස් ඇත. එයින් නොනැවතුණු ඔහු එහි සිටි ව්‍යාපාරිකයන්ට පවසා ඇත්තේ අයිෆල් කුළුණේ යම් යම් දෝෂ පවතින බවයි. ඒ පුවත ඇසූ ප්‍රංශ ව්‍යාපාරිකයින් එක්ව අයිෆල් කුළුණ ලන්සු තබන්නට ගත් තීරණයත් සමඟ එවකට ප්‍රංශයේ ජීවත් වුණ පොයිසන් නම් ධනවත් ව්‍යාපාරිකයෙක් විසින් අයිෆල් කුළුණ මිල දී ගනු ලැබ ඇත. නමුත් පුදුමයට කාරණාව වන්නේ ඒ වන විටත් වික්ටර් වෙනත් පුද්ගලයෙකුට අයිෆල් කුළුණ ඩොලර් දහසය දහසක මුදලකට විකුණා අවසන් වී තිබීමයි.






## නීතියේ රැහැනින් පලා ගිය අවස්ථාවන් සහ අත්අඩංගුවට පත්වීම

කුඩාකළ පටන් ඔහුට තිබූ ඉතා සූක්ෂම බුද්ධිය නිසාවෙන් ඔහු නීතියේ රැහැනට හසු වුවත් ඒ සෑම අවස්ථාවකදී ම බේරී පලායන්නට තරම් ඔහු දක්ෂ වූ බව සඳහන් වේ. ඒ ආකාරයෙන් ඔහු 47 වතාවක් සිරගතව සිට බේරී පලාගොස් ඇත.
එමෙන්ම ඔහු විසින් සිදු කළ අයිෆල් කුළුණේ සොරකම සමඟ ජාත්‍යන්තර පොලීසිය පවා ඔහු ගැන විමර්ශන කටයුතු ආරම්භ කර තිබූ බව සඳහන් වේ. එම සිදුවීමෙන් පසුව ඔහු ඉතා ඉක්මනින් ඇමරිකාව බලා ගොස් ඇත. එම අවස්ථාවේ දී ඔහු "පුළුවන්නම් මාව අල්ලගන්න"යැයි පොලීසියට පවා අභියෝග කර ඇති බවද සඳහන් වේ.

විමර්ශන කටයුතු වලදී අනාවරණය වී ඇත්තේ වික්ටර් කිසිවිටෙකත් ඔහුගේම නමින් සමාජයට පෙනී නොසිට ඇති බවත් විවිධ අවස්ථාවන් වලදී ව්‍යාජ නම් 47ක් පමණ භාවිත කළ බවත්ය. කෙසේ නමුත් අවසානයේ එනම් 1935 දී වික්ටර් ලස්ටිග් නම් මෙම පුද්ගලයා නීතියේ රැහැනට අසුකරගන්නට පොලීසිය සමත්ව ඇත්තේ ද ඔහු විසින් සිදු කරන ලද ගණුදෙනුවක දී ව්‍යාජ මුදල් නෝට්ටු භාවිත කළ අවස්ථාවකදීමය. නඩු විමසුමෙන් පසුව 1936 අප්‍රේල් මස 27 වන දින වසර 20ක සිරදඬුවමකට ඔහුව යටත්වන්නට සිදුව ඇත. ඇමරිකානු අධිකරණය විසින් ඔහුව ,ඇල්කාට්‍රාස් , නම් අධි ආරක්ෂිත සිරගෙදරකට රැගෙන යන්නේ ද ඔහුට ඇති සූක්ෂම බුද්ධිය නිසායි. ඒ නිසාවෙන් ම පසුකාලීනව ඔහු පිළිබඳව නවකතා සහ චිත්‍රපට පවා නිර්මාණය වී ඇත.

## සිරගත වීමෙන් පසුව සිදු වූ වික්ටර්ගේ මරණය

ඔහු සිරගතව සිටිය දී යම් අසනීප තත්ත්වයක් මවාපෑමෙන් බන්ධනාගාර නිළධාරීන් මුලා කිරීමට ගත් උත්සාහයක් පිළිබඳව වාර්තා වන අතරම පසුව එය අසාර්ථක වූ බවත් කියවේ. නමුත් අවසානයේ දී ඔහුට සැබෑවටම නියුමෝනියා තත්ත්වයක රෝග ලක්ෂණ පහලවී ඇති අතර ඔහු පෙර කළ බොරු මවාපෑම නිසාවෙන් මෙයත් එවැනි එක් අවස්ථාවක් ලෙස බන්ධනාගාර නිළධාරීන් සිතීම නිසා අවසානයේ දී එනම් 1947 දී ඔහු දැඩි නියුමෝනියා තත්ත්වයක් හේතුවෙන් ජීවිතක්ෂයට පත්වී ඇත.


කෙසේ නමුත් ඔහු වැනි තවත් පුද්ගලයන් වෙනුවෙන් ඔහු විසින් වෙනම ම නීති මාලාවක් පවා හඳුන්වා දී තිබූ අතර එම නීති මාලාව භාවිත කරන පුද්ගලයින් අදටත් සිටින බව අනාවරණය වී තිබේ.

## වික්ටර්ගේ නීති මාලාව

1. හොඳ සවන්දෙන්නෙකු වන්න.
2. කම්මැලි නොවන්න.
3. අනෙක් පුද්ගලයා ඕනෑම දේශපාලන මතයක් ඉදිරිපත් කරනතෙක් බලා සිටින්න.
4. අනෙක් තැනැත්තාට ආගමික අදහස් ඉදිරිපත් කිරීමට ඉඩදෙන්න.
5. අනෙක් තැනැත්තා උනන්දුව දක්වන්නේ නම් පමණක් කතාව ඉදිරියට රැගෙන යන්න.
6. කිසිවිටෙක ඔබට ඇති රෝග ගැන කතා නොකරන්න.
7. කෙනෙකුගේ පෞද්ගලික ජීවිතය ගැන අහන්න එපා. ඔහු එය පවසනතෙක් සිටින්න.
8. පුරසාරම් දොඩවන්න එපා.
9. පිරිසක් ඉදිරියේ අපිරිසිදුව ඉන්න එපා.
10. පිරිසක් ඉදිරියේ බීමත්ව ඉන්න එපා.

මෙම නීතිමාලාව පිළිබඳ නිරීක්ෂණය කිරීමේ දී පෙනීයන ප්‍රධානතම කාරණාව වන්නේ මෙම නීති මාලාව යහපත් ක්‍රියාවක් උදෙසා භාවිත කිරීමට හැකි වුවානම් කෙතරම් අගනේ ද යන්නයි. මේ තුළින් පාඨක ඔබට ගතහැකි වටිනා ආදර්ශයක් ද ඇත. වික්ටර් යනු ලෝකප්‍රකට සොරෙක් බව ඇත්ත. නමුත් ඔහු ඉතා සූක්ෂම බුද්ධියක් සහ දක්ෂතාවයක් ඇති පුද්ගලයෙකි. ඔබත් හොඳින් සිතට ගන්න. ප්‍රථමයෙන් තමාගේ දක්ෂතාවය සහ හැකියාව හඳුනාගන්න. ඒ ඔස්සේ යහපත් ගමනක් යන්නට උත්සාහ කරන්න. ඒ සඳහා ඔබ දරන යහ ආකල්ප නිතර වැඩි දියුණු කරගන්න. ඒවා ක්‍රියාත්මක කරන්න. එවිට ඔබේ ජයග්‍රහනය ඔබගේත් සමාජයේත් යහපත උදෙසාම හේතුවන බව නිසැකය.


තරුණකාලයේ ගත් ඡායාරූපයකි


වික්ටර් ලස්ටිග් යහළුවන් සමඟ


වික්ටර් ලස්ටිග්

# Heal Smarter, Not Harder: Unlock the Magic of Physiotherapy





**Imagine this: You're in your garden on a sunny afternoon, tending to your plants. As you lift a heavy flower pot, a sharp pain shoots through your back, leaving you wincing. Your first instinct? Reaching for painkillers or booking a doctor's appointment. But have you ever considered that pain relief doesn't have to come from medication, which can lead to side effects and long-term health issues? What if you could relieve pain without taking a single pill?**

This is where physiotherapy comes in. Unlike medication, which often only masks pain, physiotherapy addresses the root cause, helping your body heal through physical techniques like targeted exercises, heat therapy, and manual manipulation. By reducing reliance on painkillers, physiotherapy empowers you to take control of your health naturally.

## Physiotherapy in Sri Lanka: A Growing Profession

Physiotherapy is **not just a global trend**; it's growing rapidly in Sri Lanka. The **University of Peradeniya and the University of Colombo** are leading this movement, offering degree programs in physiotherapy. Today, Sri Lanka has over **600 registered physiotherapists** working in hospitals and clinics, helping people regain mobility and live pain-free lives.

## Who Can Benefit from Physiotherapy?

**Physiotherapy isn't just for athletes or post-surgery patients. It helps people of all ages with:**

**Musculoskeletal Issues**
Back and neck pain, arthritis, sports injuries.

**Neurological Disorders**
Stroke, Parkinson's disease, multiple sclerosis.

**Cardiopulmonary Conditions**
COPD, post-heart attack recovery.

**Pediatric & Geriatric Care**
Developmental delays, balance issues.

**Women's Health**
Pregnancy-related back pain, pelvic floor dysfunction.



## Physiotherapy: More Than Just a Massage!

**Many believe physiotherapy is just massage therapy, but it's much more. It's a science-backed field with various treatment methods, including:**



**Manual Therapy**
Joint mobilization, soft tissue manipulation to relieve pain and improve movement.

**Therapeutic Exercises**
Strength, flexibility, and endurance exercises tailored to your needs.

**Electrotherapy**
Ultrasound, laser therapy, and electrical stimulation to speed up healing

**Dry needling**
Inserting fine needles into muscle trigger points to relieve pain, reduce stiffness, and restore function.

**Hydrotherapy**
Using water-based exercises to reduce joint stress, improve circulation, and aid recovery, especially for arthritis and post-surgery rehab.

**Education & Advice**
Guidance on posture, movement, and injury prevention.

## How to Access Physiotherapy in Sri Lanka

Getting physiotherapy is easier than you think:

**Self-Referral**
No doctor's referral is needed; book a session directly.

**Medical Referral**
Doctors may recommend physiotherapy as part of treatment.

**Community Health Centers**
Affordable physiotherapy services.

**Private Clinics**
IFaster access to specialized care.

## Beyond Treatment: Why Physiotherapy Matters

Physiotherapy is **not just about pain relief—it plays a key role in long-term health:**

**Pain Management**
Reducing reliance on medications.

**Rehabilitation**
Recovering from surgery, injuries, and illnesses.

**Chronic Disease Management**
Improving quality of life for long-term conditions.

**Injury Prevention**
Teaching strategies to prevent future pain.

## Take the First Step Toward a Pain-Free Life

**Why rely on medication when your body can heal through movement? Whether you're a gardener nursing a sore back, a professional struggling with posture-related pain, or a senior facing mobility issues, physiotherapy offers a natural, effective solution. Start your journey to a pain-free, healthier life today!**



**Dr.Thusharika Dissanayaka (PhD)**
**Lecturer, Torrens University, Australia,**
**Founder, PhysioWay Plus.**

https://www.youtube.com/@PhysioWay



# අධ්‍යාත්මික අවදිවීම විශ්ව ශක්තිය සහ



මේ ගතකරමින් සිටින වර්තමානය ඇත්තෙන්ම විශාල වශයෙන් අධ්‍යාත්මික පෙරළියක් සිදුවන කාලයක්. මේ වන විටත් ඒ පිළිබඳව අධ්‍යයනය කරන්නට බොහෝ පිරිසක් යොමු වෙමින් සිටිනවා. ඉතින් ඒ අයගේ ගමනට අත්වැලක් වන අධ්‍යාත්මික ශක්තිය සහ විශ්ව ශක්තිය පිළිබඳව රැගෙන එන ලිපි පෙළක සුන්දරතම ඇරඹුමයි මේ...

## අධ්‍යාත්මික අවදිවීම (Spiritual Awakening)

අධ්‍යාත්මික ශක්තිය පිළිබඳව අධ්‍යයනය කරන, ඒ පිළිබඳව ප්‍රායෝගිකව අත්හදා බැලීම් කරන සියල්ලන්ම පාහේ දැනගත යුතුම ප්‍රධානතම කාරණාවක් තමයි, අධ්‍යාත්මික අවදිවීම කිසිසේත්ම බලෙන් ලබා ගත හැකි දෙයක් නොවන බව. ඇත්තෙන්ම එය, ඔබ අත්විඳින යම් තත්ත්වයක්. එහෙමත් නැත්නම් හැඟීමක්. ඒ වගේම තමයි අධ්‍යාත්මික අවදිවීමක් කියලා කියන්නෙම විශ්ව විඥානයත් සමඟ ඒකාත්මක වීමක් (තමා හා බාහිර පරිසරය නැමති විශ්වය දෙකක් නොව එකක් ලෙස සැලකීම/මුළු විශ්වයම තමාම යැයි සැලකීම). තව විදියකින් කිව්වොත් මේ ලෝකයේ ඇති පරම සත්‍යයට අවදිවීමක්. ඒ ගමන ඇත්තෙන්ම සාපේක්ෂයි. එකිනෙකාට වෙනස්. ඒ නිසාම එහි පියවරයන්හි අනුපිළිවෙලක් කිසිවිටකත් සඳහන් කළ නොහැකියි. එය මිනිසාගේ අභ්‍යන්තරයේ එහෙමත් නැත්නම් සිතේ උපදින අවංක හැඟීම් සමුදායක එකතුවක්. හරියට චාරිකාවක් වගේ.


## විශ්ම ශක්තිය (Universal Power)

වර්තමානය තුළ විශ්ව ශක්තිය පිළිබඳවද අධ්‍යයනය කරන පිරිස් බහුල වශයෙන් දක්නට ලැබුණ ද ඒ අයගේ පරමාර්ථය එකිනෙකාට වෙනස්. පිරිසක් මමන්කාරය වඩවා ගැනීමටද තවත් පිරිසක් බලය පැතිරවීම වැනි පටු අරමුණින් විශ්ව ශක්තිය තමාවෙත ආරෝපණය කර ගන්නට උත්සාහයක යෙදෙනවා. නමුත් සැබෑවටම විශ්ව ශක්තියේ අවදිවීමක අත්දැකීමක් ඇති පුද්ගලයෙක් එය කිසිසේත්ම තමාවෙත බලෙන් ඇද ගැනීමට නොහැකි බව හොඳින් හඳුනනවා.

බොහෝ දෙනෙක් "විශ්ව ආකර්ෂණ නීතිය" යන රාමුවට කොටු වී ඒ තුළින් විශ්ව ශක්තිය යන පුළුල් මාතෘකාවක් ලඝු කර හඳුනා ගන්නට පෙළෙඹෙමින් සිටින බවක් පෙනෙන්නට තිබෙනවා. ඒ හරහා හුදෙක් ඔවුන්ගේ ම ජීවිත තුළ බාහිරව පවතින අඩුපාඩුකම් සකස්කර ගනිමින් සිටියි. නමුත් ඒ අතර සැබෑවටම අධ්‍යාත්මිකව අවදිවීම තුළින් නිරායාසයෙන් තමාවෙත විශ්ව ශක්තිය ආකර්ෂණය කර ගනිමින් වඩාත් යහපත් ජීවිතයක් ගත කරන අතරවාරයේ අනෙකාට ද සහයෝගය ලබාදෙන පිරිසක් ද නැතුවාම නොවෙයි. ඒ අය සැබෑවටම විශ්වයේ සහ ලෝකයේ පරම සත්‍ය සොයා යන නිසාම විශ්වයේ පවතින ශක්තීන් ඔවුන් කරා නිරායාසයෙන් ඇදී එයි.



ගයත්‍රි කරුණාදාස




# SABARAGAMUWA SAMAN DEWALA PERAHERA

During the time that Tooth Relic of Buddha was transferred to Delgamuwa Raja Maha Vihara, in a war time, during King Parakramabahu VI's period the Shrine held the Esala Perahara or the Procession of the Tooth Relic for 11 years. Later under King Rajasinghe, the Saman Perahara joined to the Esala Perahara. Since then the Maha Saman Devalaya hoists the Esala Perahara in the month of August–September annually.

Prior to the festival's commencement, age-old rituals like the Pirith ceremony (Chanting of Buddhist Sutras for protection, kap situveema (A symbolical wooden tower being planted) are held and the smaller processions called Kumbal and Dewele Peraheras are held. After that, the Perahara or the main procession takes place, and it concludes with Diya Kapeema (The symbolic water cutting ceremony) all of which are held for 13 days under the supervision of the Chief incumbent(Basnayake Nilame) of the Shrine.

The procession is filled with cultural items and dancing from different regions of Sri Lanka as well as features many elephants decorated in different garments.



SAPPHIRUS

*Diamond Like Sapphires*

RATNAPURA

SAPPHIRUSLANKA.COM

@sapphiruslanka

Sapphirus Lanka

Price : Rs. 1000/=